# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ISSN 1391 - 1031
2017 ඔක්තෝබර්
23 වෙළුම 07 කලාපය

ආධාරය රු 30/=

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී


"ධනපති ක්‍රමය යටතේ නිර්ධන පංතියට ලැබිය හැකි හොඳම රාජ්‍ය ආකෘතිය ලෙසට අපි ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවකට පක්ෂ වන්නෙමු. එහෙත් ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී ධනපති සමූහාණ්ඩුව යටතේ පවා ජනතාවට අත්වන්නේ, වේතන වහල් භාවයය යන්න අමතක කිරීමට අපට අයිතියක් නැත."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**6 වැනි වෙළුම,**
**26 පිටුව**

# වෙනසකට වෙනස් වෙමු

# පුංචි ඡන්දයේදී ජ.වි.පෙ. ඉල්ලයි

පවතින තත්වය අනුව නව මැතිවරණ ක්‍රමයක් සහිත පළාත් පාලන මැතිවරණය එළඹෙන 2018 වසරේ ජනවාරි මාසයේදී පැවැත්වීමට නියමිත අතර එම මැතිවරණය රට වෙනස් කරලීමේ පළමු පියවර ලෙස හඳුනාගනිමින් ඊට මැදිහත් වන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටීමට ජනතා විමුක්ති පෙරමුණ තීරණය කර ඇත.

මේ වන විට පළාත් පාලන මැතිවරණය වසර දෙකහමාරකට වැඩි කාලයක් ප්‍රමාද වී ඇති අතර පසුගිය රාජපක්ෂ පාලනය විසින් සකස් කරන ලද විකෘති මැතිවරණ ක්‍රමය සාපේක්ෂව වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ ක්‍රමයක් බවට පත් කරගත යුතුව තිබිණි. කෙසේ වුවද මේ වන විට පැවති පනත් කෙටුම්පතෙහි අඩුපාඩුකම් සැලකිය යුතු ප්‍රමාණයක් සම්මත වී ඇති නව පළාත් පාලන පනතේ නිවැරදි කරනු ලැබ ඇති අතර මනාප ක්‍රමය අහෝසිවීම, කොට්ඨාසයකට මහජන නියෝජිතයෙකු ලැබීම, කාන්තා නියෝජනය තහවුරුවීම ඇතුළු සාධනීය වෙනස්කම් රැසක් මෙම නව මැතිවරණ ක්‍රමය තුළ අඩංගුය.

අනෙක් අතට මෛත්‍රී - රනිල් හවුල් ආණ්ඩු කාලය තුළ පවත්වනු ලබන පළමු ***02 වැනි පිටුවට***

## රට පුරා බලමුළු ගැන්වෙන දිරිය පුරවැසි සමුළු



















**05 මැතිවරණ නීති**




මේ වනවිට ලංකාවේ පළාත් පාලන ඡන්දය නොපවත්වා අවුරුදු 2කට වඩා ගතවී...

**07 සමාජවාදය සහ පුද්ගලික නිදහස...**



සමාජවාදී රජයට පුරවැසියන්ගේ පුද්ගලික ජීවිතය තුළට මැදිහත්වීමේ අවශ්‍යතාවක්,....

**11 සමාජය තුළ හුදකලා...**



ඔහු දැන් සමාජය සමග ගනුදෙනු කරන්නේ 'ඩේටා' මගිනි. ඔහුගේ ජීවිතය 'ඩේටා' සමග...

**12 ජනතාවගේ පිරිහෙන...**




අපේ රටේ ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් හඳුන්වා දුන් ජාතික ඖෂධ ප්‍රතිපත්තිය...

| | |
|---|---|
| සංවාදය........................... | 03 |
| තරුණ.............................. | 04 |
| ආවර්ජනා.......................... | 06 |
| ජාත්‍යන්තර........................ | 08 |
| ආර්ථික............................ | 09 |
| කාන්තා............................ | 10 |
| වේදිකාව.......................... | 13 |
| විශේෂාංග......................... | 14 |


***යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!***

## මැතිවරණ නීති...

05 පිටුවෙන්




ආයතන නිසා ඒවාට තම නියෝජිතයන් පත්කර ගැනීම ජනතාවට ඇති අයිතිය තව තවත් ප්‍රමාද කළ යුතු නොවීය. පළාත් සභා ඡන්දය පළාත් 3කට පමණක් අදාළ එකක් වන අතර පළාත් පාලන ඡන්දය මුළු රටටම අදාළ ඡන්දය විය. පළාත් 3ක ඡන්දය වෙනුවෙන් රට පුරා පවත්නා ඡන්දය කල්යෑම සාධාරණ හා ප්‍රජාතන්ත්‍රවාදි නොවීය.

අනෙක් අතට දැන් පළාත් සභා තුනේ ඡන්ද පැවැත්වීමට සූදානම් වූයේද පැරණි මනාප ක්‍රමයටමය. මනාප ක්‍රමය ජ.වි.පෙ.ට අර්බුදයක් නොවුණද රටේ බොහෝ දෙනාත් රාජපක්ෂ කණ්ඩායමත්, ශ්‍රීල.නි.ප.යත් මනාප ක්‍රමය වෙනස් කළ යුතු යයි හඬනගමින් සිටියේය. එසේ නම් පළාත් සභා මනාප ක්‍රමයට පැවැත්වීම සාධාරණ වන්නේ නැත. අනෙක් අතට රටේ ඡන්ද පැවැත්විය යුත්තේ, එක නීතියකට එක ක්‍රමයකටය. පළාත් පාලන ඡන්දයට එක ක්‍රමයක් හා පළාත් සභා ඡන්දයට තව ක්‍රමයකුත් තිබිය යුතු නැත. පළාත් සභා පනත සංශෝධනය කොට එයටද පළාත් පාලන ආයතනවලට යොදාගත් මැතිවරණ ක්‍රමය ආදේශකර එය මදක් පස්සට තබා පළාත් පාලන මැතිවරණය ඉදිරියට ගැනීම සඳහා වන බලපෑම ආණ්ඩුවට ආවේ මේ අනුවය. අපට සිටියේ එම ස්ථාවරයේ වන අතර එය එසේ කළ යුතුය යන බලපෑම පක්ෂ රැසක්ම කළේය. අවසානයේ පළාත් සභා පනත සංශෝධනය කර එයට නව මැතිවරණ ක්‍රමය ඇතුල් කිරීමටත්. එම නව ක්‍රමය යටතේ 2018 මැද වන විට පළාත් සභා ඡන්ද පැවැත්වීමටත්, ඊට පෙර 2017 ජනවාරි මැද පළාත් පාලන ඡන්දය පැවැත්වීමටත් එකඟ වීමට ආණ්ඩුවට සිදුවූ අතර ජ.වි.පෙ.ත් පක්ෂ වූයේ ඒ සඳහා ගෙන ආ පළාත් සභා පනත් සංශෝධනයටය. දැන් ලබන ජනවාරියේ පළාත් පාලන ඡන්දය පැවැත්වීමටත්, ඉන්පසු මාස කිහිපයක් අතුළත නව ක්‍රමය යටතේම පළාත් සභා පැවැත්වීමටත් හැකියාව ලැබී ඇති අතර මෙ සමග ඡන්ද කල්දැමීමට විවිධ හේතු යොදා ගැනීමට ආණ්ඩුවට තිබූ අවස්ථාවද අහෝසි විය. ඉන් සිදුවූයේ ඡන්ද කල්යාම නොව තවදුරටත් කල් නොදමා ඡන්ද පැවැත්වීමට හැකි වාතාවරණයක් සකස්වීමය.

ඡන්ද කල් දැමීමට ජ.වි.පෙ. සම්මාදන් වූවායයි රාජපක්ෂ කල්ලිය මරහඬ නගන්නේ මෙම පැහැදිලි සත්‍ය සඟවමිනි. රාජපක්ෂ කල්ලියේ දෙබිඩි බවත්, ජනතා විරෝධී ස්වභාවයත් යළි පැහැදිලි විය.

පළාත් සභා සංශෝධනය සම්මතවීම මහා අපරාධයක් ලෙස රාජපක්ෂ කල්ලිය බෙරිහන් දුන්නද එම සංශෝධනයට එරෙහිව තම ඡන්දය දීමට මහින්ද පාර්ලිමේන්තුවට ආවේ නැත. ඒ, මහින්දට එම සංශෝධනය එතරම් අදාළ නොවන නිසාත්, රනිල් සමග ඇති සැබෑ යටි ගනුදෙනු නිසාත් විය හැකිය. අනෙක් අතට රාජපක්ෂ කල්ලිය පසුගිය කාලය පුරාම පුරසාරම් දෙඩුවේ ආණ්ඩුවේ පිරිසක් තමන් සමග සිටින බවත් ඉතා ඉක්මනින් ආණ්ඩුව පෙරළා දමන බවත් කියමිනි. එසේ නම් එම පිරිසේ සහයෙන් අදාළ පනත් සංශෝධනයට තුනෙන් දෙක ලබා ගැනීම වැළැක්වීමට මහින්ද කණ්ඩායමට පුළුවන් විය යුතුය. එහෙත් එසේ වූයේ නැත. මහින්ද කල්ලිය මෙහිදී පරාජය වූයේ ජයග්‍රහණ පිළිබඳ සියලු සිහින බිඳවට්ටමිනි. දැන් කෑ ගසන්නේ එම පරාජයෙ වේදනාව දරාගැනීමට නොහැකිවය. සත්‍යය එයයි.

මේ සියල්ල අවසන මින් ලැබී ඇති ප්‍රතිඵලය කුමක්ද? එය ජනතාවට වාසි නොවේද? අපේ රටේ ජනතාව සිතිය යුත්තේ එයයි. දැන් ඡන්දය ඉල්ලා සිටි ජනතාවට රට පුරාම පවත්වන තම ජීවිත හා වඩාත් බැඳුණු පළාත් පාලන ඡන්දය මනාප නැති, එහෙත් සාපේක්ෂව සාධාරණ ක්‍රමයක්ද සහිතව ලැබී තිබේ. රටේ වෙනසක් කිරීමට ප්‍රාර්ථනා කරන, ආණ්ඩුවට යස පාඩමක් ඉගැන්වීමට පුලපුලා බලාසිටින අයට දැන් ඒ අවස්ථාව ලැබී තිබේ. එය ඉබේ ලැබුණක් නොව ජනතාව වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණෙන් කළ මැදිහත්වීමත් උපක්‍රම භාවිතා කිරීමට හැකිවීමත් නිසා ලැබුණ ජයකි. ඒ අතරම ලබන වසරේ මැද පළාත් සභා මැතිවරණයද නව ක්‍රමය යටතේම ජනතාවට ලැබී තිබේ. එබැවින් මේවා ජනතාවට අවාසි නොව වාසිය.

අවසාන වශයෙන් තවත් එක් කරුණක් පැහැදිලි කළ යුතුව තිබේ. දැන් තම දරුණු පරාජය දරාගැනීමට නොහැකි රාජපක්ෂ කල්ලිය අවසන් පිදුරු ගසෙත් එල්ලෙමින් පළාත් සභා ඡන්ද ක්‍රමය වෙනස් කළ නිසා පළාත් සභා මන්ත්‍රී සංඛ්‍යාව වැඩිවෙන බවත්, එය රටට බරක් බවත් පවසන්නට පටන්ගෙන තිබේ. එය එසේ නම් එය කල්පනා කළයුතුව තිබුණේ කවදාද? රාජපක්ෂ පාලනය තුළ බැසිල් රාජපක්ෂලා පළාත් පාලන ඡන්දය සඳහා නව ක්‍රමය සම්මත කළ විට මෙය මීට වඩා බරපතළ ලෙස සිදුවිය. ඒ වනවිට 4800ක් පමණ වූ පළාත් පාලන මන්ත්‍රී සංඛ්‍යාව 8000ක් පමණවීම නිසාය. ඒ ගැන මුනිවත රැකි අය දැන් සංඛ්‍යා ගැන කථා කිරීම විහිළුවකි. මේ සියලු ආයතන රටට බරක් බව ඇත්තය. එබැවින් දැන් කළ යුතුව තිබෙන්නේ, රටට බරක් වූ මහජන මුදල් නාස්ති කරන, හොරකම් කරන මෙම සමාජ ක්‍රමයත් එය පවත්වාගෙන යන ධනපති පක්ෂත් පරාජය කොට

## විගණන පනත ප්‍රමාද...

16 පිටුවෙන්



බදු සීමාව වසර 10ක් දක්වා දීර්ඝ කිරීමටත් එකඟ වුණා. ඒ නිසා මේ පාලනයත් ජනතා මුදල් අවභාවිතා කරන, වංචාව, දූෂණය, නාස්තිය කරන පාලනයක්. ඒ නිසාම මෙම ජනතා මුදල් වියදම් කරන ආකාරය පිළිබඳව ජනතාවට තොරතුරු ගලා යන ක්‍රමයක් අවශ්‍යයි.

19වැනි සංශෝධනය මගින් විගණන කොමිසමක් ස්ථාපිත කළා. එම කාර්ය මණ්ඩලයට මේ වනවිට මාස 20ක් ගතවෙලා තිබෙනවා. නමුත් විගණන කොමිසම ක්‍රියාත්මක වීම සඳහා වන පනත සම්මත වෙලා නැහැ. කැබිනට් එකේ ඉන්න හොරු, තක්කඩි රැළ විගණන පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකිරීමට උත්සාහ කරන නමුත් ජනතා විමුක්ති පෙරමුණ ලෙස අපි විගණන පනත සම්මත කිරීමට ගත හැකි උපරිම ක්‍රියාමාර්ග ගන්නවා."

## පනතට සහාය දුන්නේ...

16 පිටුවෙන්



බෙදුවා. ඌව පළාත් සභාවේ ශෂීන්ද්‍ර රාජපක්‍ෂ මැතිවරණ කාලයේ ගමන් ගත්තේ සුදුපාට ඩිෆෙන්ඩර් 20ක් පමණ යොදාගෙන. ඉතාම නරක ආකාරයෙන් රාජ්‍ය දේපොළ භාවිතා කළා.

වසර 2ක් ඇතුළත ඡන්ද වට 5ක් තියෙනකොට කිසිම ඇමතිවරයෙකුට වෙන වැඩක් කරන්න වෙලාවක් නැහැ. ඔවුන් සම්පූර්ණයෙන් වැඩ කළේ මැතිවරණ වෙනුවෙන්. එනිසා මෙය සම්පූර්ණයෙන් විකෘතියක්. එම විකෘතිය අවසන් කළ යුතුව තිබෙනවා. 1931 ඉඳලා 33 කාලය දක්වා හිට්ලරුත් මේ විදිහට ඡන්ද පැවැත්වුවා. ආණ්ඩු බලය පාවිච්චි කරලා ආණ්ඩුව ඡන්දය කළාට කෙටි කාලයක් තුළ ඡන්ද 05ක් කරන එක විපක්‍ෂයේ දේශපාලන පක්‍ෂවලට ඉතා අසීරු කටයුත්තක්. එනිසා මෙම විකෘතිය වෙනස් කළ යුතුව තිබුණා."

මෙම මාධ්‍ය හමුව සඳහා ජ.වි.පෙ. මධ්‍යමකාරක සභික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයාද එක්ව සිටියේය.

# එතෙරින්...

## ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් චීන සංචාරයක



රුසියාවේ ඔක්තෝබර් විප්ලවයේ වසර 100ක් පිරීම සැමරීම නිමිති කොටගෙන චීන කොමියුනිස්ට් පක්ෂය විසින් සංවිධානය කර තිබූ 'දකුණු ආසියානු වමේ පක්ෂ සඳහා වූ න්‍යායික වැඩමුළුව' සඳහා ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා සහ පක්ෂයේ මධ්‍යම කමිටු සාමාජික ජානක අධිකාරී සහෝදරයා සහභාගි වූහ. ආසියානු රටවල් 4ක පක්ෂ 14ක නියෝජිතයින් මෙම වැඩමුළුවට සහභාගි වී ඇත. මෙම වැඩමුළුවේදී මාක්ස්වාදය ජාතික වශයෙන් ලංකාව තුළ භාවිතයට නැගීමේ පක්ෂයේ අත්දැකීම පිළිබඳව ජ.වි.පෙ. විසින් දේශන පවත්වා ඇති අතර, චීනය විසින් සිය කොමියුනිස්ට් පක්ෂය ගොඩනැගීමේ අත්දැකීම් සහ දූෂණ විරෝධී වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති ආකාරය පිළිබඳව මෙම වැඩමුළුවේදී විශේෂ අවධානය යොමුකර ඇත. චීන උප අමාත්‍ය ශෙන් යියාසොන්ග් මහතාද ජ.වි.පෙ. නියෝජිතයින් මෙහිදී හමුවී ඇත.

## විජිත හේරත් ඇමරිකාවේ




ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා පසුගියදා ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත කිහිපයක දේශන කිහිපයකට සහභාගි විය. කථානායකවරයා ඇතුළු ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමක් සමග ඇමරිකාවේ සිදුකළ සංචාරයක් අතරතුර එරට ජනතා විමුක්ති පෙරමුණ සංවිධාන කමිටුව විසින් සංවිධානය කරන ලද මෙම රැස්වීම්වලට ඔහු සහභාගි විය. පහත දැක්වෙන්නේ වොෂිංටන් ඩී.සී. රැස්වීමේ ඡායාරූපයකි. මීට අමතරව නිව්යෝර්ක්හිද රැස්වීමක් පැවැත්විණි. එරට වාසය කරන ශ්‍රී ලාංකික විද්වතුන් බොහෝ දෙනෙකුද හමුවී සාකච්ඡා කිරීමටද මෙය අවස්ථාවක් වූ අතර එම හමුවලදී ලංකාවේ වර්තමාන දේශපාලන තත්වය පිළිබඳව දීර්ඝ සාකච්ඡා කර ඇත.

## බිමල් සහ ධම්මික ඉන්දියාවට



ජනතා විමුක්ති පෙරමුණේ ජාතික සංවිධායක දේශපාලන මණ්ඩල සභික බිමල් රත්නායක සහ මධ්‍යම කමිටු සාමාජික වෛද්‍ය එස්.වී. ධම්මික සහෝදරවරුන් ඉන්දියාවේ කේරළයේ පැවැත්වෙන ඔක්තෝබර් විප්ලවයේ සියවස් සමරු සම්මන්ත්‍රණයක් සඳහා සහභාගි වූහ. ඉන්දියාවේ මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂය මෙම සම්මන්ත්‍රණය සංවිධානය කර තිබේ.

## අවතැන් දරුවන්ට 'එතෙර අපි' සහාය



මෑත කාලයේ නායයෑම් සහ ගංවතුරින් අවතැන් දිස්ත්‍රික්ක හතරක පාසල් දරුවන් සඳහා පාසල් උපකරණ, බෑග්, පාවහන් හා ඇඳුම් කට්ටල ලබා දීම 'එතෙර අපි' අනුග්‍රහයෙන් සිදුවිය. එහි එක් අවස්ථාවක් ලෙස මාතර දිස්ත්‍රික්කයේ ගංවතුරෙන් පීඩාවට ලක්වූ පාසල් ළමුන් 197 දෙනෙකු සඳහා උපකරණ ලබාදීම මාතර, නූපේ වීරබා පිරිවෙනේදී පසුගියදා පැවැත්විණි. එම අවස්ථාවට 'එතෙර අපි' සභාපති සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාද සහභාගි විය.

## එතෙර අපි - රෝම තානාපති හමුවක්!



ඉතාලියේ රැකියා කරන ශ්‍රී ලාංකිකයින් මුහුණ දෙන ගැටලු සාකච්ඡා කිරීම සඳහා ඉතාලියේ එතෙර අපි නියෝජිත පිරිසක් සහ එරට ශ්‍රී ලංකාවේ තානාපතිවරයා අතර හමුවක් පසුගියදා ඉතාලියේ රෝම තානාපතිවරයාගේ කාර්යාලයේදී පැවැත්විණි. මෙම හමුවේදී ඉතාලියේ මෙස්සිනා, ෆිරෙන්සේ සහ රෝමය නගරවල ශ්‍රී ලාංකිකයින් අත්සන් කළ මහජන පෙත්සමක්ද තානාපතිවරයාට භාර දෙනු ලැබීය. මෙහිදී නව විදේශ ගමන් බලපත්‍රයක් නිකුත් කිරීමට දීර්ඝ කාලයක් ගැනීම සහ තානාපති කාර්යාලය ඉරිදා දිනවල සේවය සැපයීමට විවෘත කිරීම, මාස 03කට වරක් අනිකුත් නගරවලට ජංගම සේවා ලබාදීම, ආදී කරුණු ගණනාවක්ම සාකච්ඡා කර ඇත. තානාපතිවරයාට අදාළ පෙත්සම භාරදීමේ අවස්ථාව ඡායාරූපයේ දැක්වේ.

## වෙනසකට වෙනස් වෙමු...

මුල් පිටුවෙන්

මැතිවරණයද මෙය වෙයි. එය වසර 70කට ආසන්න කාලයක් මේ රට පාලනය කළ ධනේශ්වර පක්ෂ දෙකෙහි එකතුවකට පවා රටත් ජනතාවත් තව තවත් අගාධයෙට පත් කරනු හැරෙන්නට කිසිවක්ම දිනා දීමට නොහැකි බවත් තවත් රට හමුවේ අත්හදා බැලීමට දෙයක් ඉතිරි වී නොමැති බවත් මනාව ඒත්තු ගන්වනු ලැබ තිබේ.

මෙම තත්වය තුළ රට වෙනස් ගමනකට හැරවීමේ අවශ්‍යතාව සිත්හි අවධාරණය කරගත් සියලු දෙනාට එළඹෙන මැතිවරණය ඒ සඳහා හැරවුම් ලක්ෂයක් බවට පත්කරගන්නා ලෙස ජනතා විමුක්ති පෙරමුණ ඉල්ලා සිටී. මේ වනුවෙන් රට වෙනස් කිරීමේ අභියෝගය භාරගැනීමට සූදානම් ප්‍රගතිශීලී පුද්ගලයින්ට පළාත් පාලන මැතිවරණ අපේක්ෂක ලයිස්තුවල ඉඩක් වෙන්කිරීමටද ජ.වි.පෙ. විසින් තීරණය කරනු ලැබ ඇත. මේ අනුව රට නව ගමනකට හැරවීම වෙනුවෙන් කැපවන, දේශපාලන සදාචාරය රැකීමට සූදානම් සියලු දෙනාට මැතිවරණය සඳහා ඉදිරිපත්වීමට ආරාධනා කරන්නේයැයි ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා නියමුවා වෙත ප්‍රකාශ කළේය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# අධිරාජ්‍යවාදයේ දුෂ්ටත්වය හා ඔක්තෝබර් විප්ලවයේ ශ්‍රේෂ්ඨත්වය

රුසියාවේ ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයට මෙම ඔක්තෝබර් 25 දිනට (නව දින දර්ශනය අනුව නොවැ. 07) වසර 100ක් පිරේ. ලොව භූමියෙන් පහෙන් එකක් හා එහි ජීවත් වූ ජනතාව වැඩවසම් අන්ධකාරයෙන් හා ධනවාදී පීඩාවෙන් මුදවා සැබෑ මානව සංවර්ධනය, සැබෑ මානව නිදහස පිළිබඳ ලොව ප්‍රථම ආදර්ශය ලබාදුන්නේ ඔක්තෝබර් විප්ලවයය. එහෙත් එම ඔක්තෝබර් විප්ලවය විසින් බිහිකල සමාජවාදී සෝවියට් දේශය දැන් අප අතර නැත. අධිරාජ්‍යවාදීන් විසින් සෝවියට් දේශය තුළම බිහිවූ නිලධාරිවාදීන් හා පාවාදෙන්නාවුන්ද, එහි තිබූ සමහර න්‍යායික හා ප්‍රායෝගික දුබලතාද උපයෝගී කරගෙන සෝවියට් දේශය බිඳ දමනු ලැබුවේ 1990 දශකය ආරම්භයේදීමය.

එහෙත් සෝවියට් දේශයේත් සමාජවාදයේත් ඔක්තෝබර් විප්ලවයේත් වටිනාකම හා එහි ශ්‍රේෂ්ඨත්වය මානව සමාජයට වඩා වැඩියෙන් දැන් දැනෙන්නට පටන්ගෙන තිබේ. ඒ, සමාජවාදී කඳවුර නැති යථාර්ථයක් තුළ අධිරාජ්‍යවාදී බලවතුන් ලෝකය තම වුවමනාවන්ට අනුව විනාශ කරමින් ජනතාව ම්ලේච්ඡත්වය කරා ඇදගෙන යමින් තිබෙන නිසාය.

ඔක්තෝබර් විප්ලවය විසින් බිහිකරන ලද සමාජවාදී සෝවියට් සංගමය අහිමිවීමෙන් දුකට හා වේදනාවට පත්වූයේ එරට ජනතාව පමණක් නොවේ. සෝවියට් සමාජවාදය නිසා අධිරාජ්‍යවාදයෙන් එල්ලවන ආක්‍රමණ හා අතපෙවීම්වලින් මිදී තම ආරක්ෂාව සලසාගත් හා විවිධ ආර්ථික, දේශපාලන උදව් උපකාර ගත් රටවල් රැසක් අද අනාරක්ෂිතභාවයට පත්ව දුකට පීඩාවට ලක්ව තිබේ.

සමාජවාදී සෝවියට් දේශය පැවතුණේ නම් ඉතාම පැහැදිලිව ඉරාකය ආක්‍රමණය කිරීමට අමෙරිකා එක්සත් ජනපදයට ඉඩ ලැබෙන්නේ නැත. ඇෆ්ගනිස්ථානයේ වාමාංශික ආණ්ඩුව බිඳදමා එම රට අක්‍රමණය කිරීමට එක්සත් ජනපදයට ඉඩ ලැබෙන්නේ නැත. එහෙත් අධිරාජ්‍යවාදීන් සමාජවාදය බිඳ දැමීම සඳහාත් මැදපෙරදිග තෙල් සම්පත කොල්ලකෑම සඳහාත් ආක්‍රමණ රැසක් සිදුකරනු ලැබුවේත් ඒ සඳහා ආගමික මූලධර්මවාදයට පණ පෙවනු ලැබුවේත් සමාජවාදී සෝවියට් දේශය නැති වාසිදායක තත්වය ප්‍රයෝජනයට ගනිමිනි. අද මැදපෙරදිග මෙන්ම ලොව පුරා පැතිර යන, මිනිස් ඝාතන සිදුකරන, මිනිසුන් අනාථයන් බවට පත් කරන, ආගමික අන්තවාදය අධිරාජ්‍යවාදයේ නිර්මාණයක් වූ අතර අද ඒවා ඔවුන්ටම විටෙක පාරාවළල්ලක් බවටද පත්ව තිබේ. සමාජවාදී කඳවුර පැවැතුණේ නම් මෙවැනි බේදවාචක මෙලෙස සිදු නොවන බව පැහැදිලිය.


ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයට වසර 100ක් පිරෙන මේ මොහොතේ ලොව පුරා පීඩාවට පත් ජනතාවගේ පීඩාව ඉල්ලා සිටින්නේ කුමක්ද? ධනවාදය දියුණුයයි, එය ලෝකය එකම ගම්මානයක් කළේයයි පුරසාරම් දෙඩුවද අද ලොව පුරා ජනතාව අත්විඳින්නේ මොනවාද? ඒ, අධිරාජ්‍යවාදය විසින් ලොවට සිදුකළ හා සිදුකරන විනාශයේ ඵලදාවය. දුප්පත්කම, දරිද්‍රතාවය, නූගත්කම, ලාභ ශ්‍රමය, ළමා ගණිකාවන්, මත්ද්‍රව්‍ය, ස්ත්‍රී දූෂණ, අපරාධ, යුද්ධ, ආක්‍රමණ, ලෙඩ දුක්, ජාතිවාදී හා ආගම්වාදී ගැටුම්, පරිසර විනාශයන් ආදියෙන් ලොව පුරා ජනතාව පීඩාවට පත්ව සිටී. තමන් වගකිව යුතු නැති හේතු මත ජනතාව මිය යති. ඉන් කියවෙන්නේ කුමක්ද? ධනවාදය තුළ, අධිරාජ්‍යවාදී පාලනය තුළ ලෝකයේ ජනතාවට අනාගතයක් නොමැති බවය. ලෝකය ප්‍රගතිය කරා ඉදිරියට නොව ම්ලේච්චත්වය කරා ආපසු ගමන් කරමින් තිබෙන බවය. මෙම ආපසු ගමන නවතා ලෝකය ප්‍රගතිය කරා යළි රැගෙන යා යුතුය. එය කළ හැක්කේ සමාජවාදයට පමණි. අපට, ලොවට ඔක්තෝබර් විප්ලවයේ මතකයත් එහි අත්දැකීමත් එහි ශ්‍රේෂ්ඨත්වයත් වඩාත් වැදගත් වන්නේ මේ නිසාය.

පසුගිය කාලයක් මුළුල්ලේ අත්විඳි අර්බුදවලින් මෙන්ම 2008දී එක්සත් ජනපදයෙන් ආරම්භ වූ ධනවාදයේ බරපතළ කඩාවැටීමෙන්ද පෙන්වා තිබෙන්නේ, ධනපති ක්‍රමයත් අධිරාජ්‍යවාදයත් වර්තමානයට නොගැළපෙන අතීතයට පමණක් අයිති, ඉතිහාසයේ කෞතුකාගාරයේ තැන්පත් කළ යුතු ක්‍රමයක් බවය. එහෙත් එම ප්‍රතිගාමී පාලන ක්‍රමය තවමත් ලොව මත පවතින්නේ ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවය මගින් ආරම්භ කළ සමාජවාදී සමාජ පරිවර්තනය ලොව පුරා රැගෙන යාමට ලෝක සමාජවාදී විප්ලවය දක්වා පරිවර්තනය කිරීමට නොහැකි වීම නිසාය.

ලෝකයේ දැන් පවතින විනාශකාරී තත්වයට, සමාජවාදී කඳවුර බිඳවැටීමේ බේදයට වගකිව යුතු වන්නේ අධිරාජ්‍යවාදය හා ධනවාදය පමණමක් නොවේ. ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයේ අරමුණු හා න්‍යායික මඟපෙන්වීම තම අවශ්‍යතා වෙනුවෙන් පටු කළ, ලෙනින්වාදය අත්හළ, සංශෝධනවාදය වැළඳගත් සෝවියට් දේශය තුළින්ම බිහිවූ නිලධාරි පැලැන්තියේ හා ඊට නායකත්වය දුන් සමහර නායකයින්ද මෙයට වගකිව යුතුය. ඔක්තෝබර් විප්ලවයේ ශ්‍රේෂ්ඨත්වයත් එහි සැබෑ අරමුණ හා න්‍යායික පදනමත් න්‍යාය භාවිතයට නැගූ ජීවමාන අත්දැකීමත් යළි යළිත් අධ්‍යයනය කළ යුත්තේ මෙම තත්වය නිසාය.

**ලොව පුරා ජීවත්වන මිනිසුන්ට මරණය වෙනුවට ජීවිතයත් කඳුළ වෙනුවට සිනහවත් වහල්භාවය වෙනුවට නිදහසත් ගැටුම් වෙනුවට සමගියත් ලබාදී මිනිසා මනුෂ්‍යත්වයෙන් පුරවාලිය හැක්කේ සමාජවාදයට පමණි. ඊට න්‍යායික හා ප්‍රායෝගික මඟ පෙන්වන පහන් තාරකාව බවට පත්වීමේ වැඩිම හැකියාව තවමත් තිබෙන්නේ ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයටය. එහි සැබෑ අත්දැකීම්වලටය. එබැවින් ඔක්තෝබර් විප්ලවයේ සියවස් සැමරුව එයට ගරුකිරීමෙන් ඔබ්බට ගොස් ඉන් ඉගෙන ගැනීමේ උත්සාහයක් දක්වා පුළුල් කර ගත යුතුය. ඒ සඳහා ඔක්තෝබර් විප්ලවය දෙසට හැරෙන මෙන් අප සැමදෙනාගෙන්ම ඉල්ලා සිටිමු.**

**ඔක්තෝබර් විප්ලවයේ ශ්‍රේෂ්ඨත්වය දිගුකල් දිනේවා!**



# ඔක්තෝබර් විප්ලවයේ සියවස් සැමරුම නව මඟකට මුලපුරාවි

## ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා

***නියමුවා:-** ඔක්තෝබර් විප්ලවයේ සියවස් සැමරුම් වැඩසටහනක්ද ඇතුළත් චීන සංචාරයකට ඔබ පසුගියදා එක්වුණා. මෙම වැඩසටහන් පිළිබඳ අත්දැකීම් නියමුවා පාඨකයින් සමග බෙදා ගත්තොත්.*

*ටිල්වින් සිල්වා සහෝදරයා:-* ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයට වසර 100ක් පිරීම නිමිත්තෙන් චීනයේ විදේශ අමාත්‍යාංශය සහ චීන කොමිනිස්ට් පක්ෂය දකුණු ආසියානු වමේ පක්ෂවල න්‍යායික වැඩමුළුවක් සූදානම් කර තිබුණා. එයට ලංකාව, ඉංදියාව, බංගලාදේශය නේපාලය යන රටවල් නියෝජනය කරමින් වමේ පක්ෂ හා තවත් පක්ෂ 14ක නියෝජිතයන් සහභාගි වුණා. මෙහිදී ඔක්තෝබර් විප්ලවයට වසර 100 ගතවන මොහොතේ වමේ පක්ෂ ගොඩනැගීමේ අත්දැකීම් සාකච්ඡා කිරීම හා මාක්ස්වාදය එක් එක් රටට ගලපා ගන්නේ කෙසේද යන්න ගැඹුරින් සාකච්ඡා කෙරුණා. ඊට අමතරව චීනය කර්මාන්ත, විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ ලබා ඇති දියුණුවත් කෘෂිකර්මික ක්ෂේත්‍රයේ ලබා ඇති දියුණුවත් පෙන්වීමට සමහර ප්‍රදේශවල නිරීක්ෂණ චාරිකා සංවිධානය කර තිබුණා. මෙම වැඩසටහන්, චීනයේ අගනුවර වන බීජිංවලත් චීනයේ ඉතාම දියුණු පළාතක් වන ෂැංඩොං ප්‍රාන්තයේත්, චීන විප්ලවයේ මූලස්ථානය ලෙස සැලකෙන යෙනෑන්වලත් පැවැත්වුණා. යෙනෑන්වල සාකච්ඡා පැවැත්වුණේ එහි කොමියුනිස්ට් පක්ෂයේ පක්ෂ පාසලේදීයි. අපේ පක්ෂයෙන් මමත් අපේ පක්ෂයේ මධ්‍යම කමිටු සාමාජික ජානක අධිකාරී සහෝදරයත් සහභාගි වුණා.

ඇත්තෙන්ම මෙය හොඳ අත්දැකීමක් බවට පත්වුණා. මේ වැඩමුළුව පුරාම සාකච්ඡා කළේ චීනයේ සමාජවාදය ගොඩනැගීමේ අත්දැකීම් පිළිබඳවයි. ඒ වාගේම ඔවුන්, ඔවුන්ගේ පක්ෂය ගොඩනැගීම සහ චීන කොමිනිස්ට් පක්ෂය තුළත්, රට තුළත් නිර්මාණය වන වංචා දූෂණවලට එරෙහිව ගන්නා දැඩි පියවරයන් ගැන සාකච්ඡා කළා. අපේ රටවල් එක්ක ගන්නකොට ඔවුන් දැවැන්ත උත්සාහයක් ගනිමින් ඉන්නවා, වංචා දූෂණ නවත්වන්න. ඒ වගේම වංචා දූෂණවලට සම්බන්ධ ඕනෑම කෙනෙකුට ඔවුන්ගේ තරාතිරම නොබලා, දඬුවම් කරනවා. පක්ෂයේ ඉහළ පෙළේ අයට පවා දඬුවම් කර තිබෙනවා. අනික් පැත්තෙන් මෙහිදී අවධානය යොමුකළා කරුණු දෙකකට. පළමුවැන්න වමේ පක්ෂ ගොඩනැගීම පිළිබඳව තිබෙන ප්‍රශ්න ගැන කථාකළා. ඒ වගේම මාක්ස්වාදය ප්‍රාදේශීය තත්වයන්ට එක් එක් රටවල තත්වයන්ට ගලපා ගන්නේ කොහොමද කියන එක පිළිබඳව සාකච්ඡා කළා. ඒක න්‍යායික සාකච්ඡා කිහිපයක්. මේ සාකච්ඡාවලට අපිත් යෝජනා දක්වමින් සම්බන්ධ වුණා.

මේ නිසා චීන කොමියුනිස්ට් පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ අතර තිබෙන සම්බන්ධය තව තවත් වැඩිවුණා. ඒ වගේම ජනතා විමුක්ති පෙරමුණ පිළිබඳව අපේ පක්ෂයේ විනය පිළිබඳව, අපේ පක්ෂයේ න්‍යායික අදහස් පිළිබඳව, චීනයේ කොමිනිස්ට් පක්ෂයේ නායකයින් වඩාත් දැනුවත් වුණාය කියල අපි හිතනවා. පොදුවේ ගත්තොත් මේක සාර්ථක වැඩමුළුවක්. සාර්ථක විදේශ ගමනක්, ඒක නිසා අපි හිතනවා, සමාජවාදය ගොඩනැගීමේදී න්‍යායික හා ප්‍රායෝගික අත්දැකීම් පිළිබඳවත් වමේ ව්‍යාපාර ගොඩනැගීමේදී මුහුණදීමට සිදුවන අභියෝග පිළිබඳවත් අත්දැකීම් එකතුකර ගැනීමට ලැබීම නිසා අපට වැදගත් අවස්ථාවක් වුණා කියලා.

***නියමුවා:-** ලෝක දේශපාලනයේ වැදගත්ම සංධිස්ථානයක් සලකුණු කළ ඔක්තෝබර් විප්ලවයේ සියවස් සැමරුම මෙම මාසයට යෙදී තිබෙනවා. එහි වත්මන් බලපෑම සහ ජ.වි.පෙ. ලෙස එම සියවස් සැමරුම සඳහා වන සූදානම කවරාකාරද?*

*ටිල්වින් සිල්වා සහෝදරයා:-* ඇත්තටම ලෝකය නව මඟකට යොමුකරපු ඔක්තෝබර් විප්ලවයට මේ ඔක්තෝබර් මාසයේදී වසර 100ක් පිරෙනවා. ඒක අතිවිශිෂ්ට සිදුවීමක්. අතිවිශිෂ්ට අවසථාවක්. එනිසා ලෝකය පුරාම වමේ ව්‍යාපාර, සමාජවාදී රටවල් මේ අවස්ථාව ඉතාමත් ඉහළින් අනුස්මරණය කරමින් නැවත මාක්ස්වාදය පිළිබඳව, සමාජවාදය පිළිබඳව දියුණු කතිකාවතක් ආරම්භ කිරීමට කටයුතු යොදා තිබෙනවා. මා කලින් කී විදියට චීන සංචාරයේදී පවා චීනයේ වැඩමුළු සියල්ල යොදාගෙන තිබුණේ ඔක්තෝබර් විප්ලවයේ අවුරුදු 100 සැමරීමත් අරමුණු කරගෙන. මෙවර ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙල පවත්වන්නේත් රුසියාවේදීයි. ඒත් ඔක්තෝබර් විප්ලවය සැමරීමක් ලෙස.

> "අද අපේ රටේ රට පාලනය කරපු දේශපාලන පක්ෂ දෙකම එකයි, 'එක වල්ලේ පොල්' කියන එක රටේ ජනතාවට අවබෝධයක් තිබෙනවා. මේ සියලු කරුණු නිසා අපි හිතනවා ජනතාව තුළ කිසියම් වෙනස්වීමක් සඳහා උනන්දුවක් නිර්මාණය වී තිබෙනවා. මේ තත්වය තුළ අපි ජනතාවට කියන්නේත් අවුරුදු 70ක අතීත අත්දැකීමෙන් ඉගෙන ගෙන අපේ රට අලුත් මඟකට ගෙනියන්න නව දේශපාලන බලයක් නිර්මාණය කරගත යුතු බවයි."

ලංකාවේ වමේ ව්‍යාපාරය ලෙස අපටත් ඔක්තෝබර් විප්ලවය ඉතාම වැදගත් එකක්. සෝවියට් දේශයේ සමාජවාදී විප්ලවය ජයග්‍රහණය කළාට පසුව තමයි ලෝකය පුරාම අපේ වගේ රටවල කොමිනිස්ට් පක්ෂ බිහිවෙන්නේ. වමේ ව්‍යාපාරයක් බිහිවෙන්නේ. 1917 ඔක්තෝබර් විප්ලවය ජයග්‍රහණය කළාට පස්සේ 1920 දශකය ඇතුළේ, 1921 - 1922 කාලය තුළ බොහෝ රටවල කොමියුනිස්ට් පක්ෂ නැතිනම් සමාජවාදී පක්ෂ බිහිවුණා. ඔක්තෝබර් විප්ලවය අපට වැදගත්වන කරුණු කිහිපයක්ම තිබෙනවා. එකක් තමයි මාක්ස් - එංගල්ස් නිර්මාණය කළ මාක්ස්වාදය භාවිතයට නැගුවේ ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයෙන් වීම. ඒ වගේම සමාජවාදය යථාර්තයක් කළ හැකි දෙයක්ය යන්න ඔප්පු කළේත් ඔක්තෝබර් විප්ලවයයි. ඒ වගේම අධිරාජ්‍යවාදී යුගයට අනුව මාක්ස්වාදය සංවර්ධනය කොට රුසියාව වැනි ඉතාම පසුගාමී රටක සමාජවාදී විප්ලවය ජයග්‍රහණය කිරීමේදී න්‍යාය භාවිතයට නගා පෙන්වූයේත් උපායමාර්ග උපක්‍රම ගැන විශාල අත්දැකීම් සම්භාරයක් ඉතිහාසයට එක්තුකළේත් ඔක්තෝබර් විප්ලවයයි.

ඒ වගේම අනික් පැත්තෙන් ගත්තාම රුසියාව කියන්නේ ඉතාමත් විශාල, ඒ වගේම නොදියුණු, ධනේශ්වර සංවර්ධනය පවා සිදු නොවූ රටක්, ඉතා ඉක්මනින්ම වසර කිහිපයකින්ම ලෝකයේ ප්‍රධාන බලවතෙක් බවට පත්කර ගත්තා. මුලින්ම අභ්‍යවකාශ තරණය කිරීම, කාන්තාවක් මුලින්ම අභ්‍යවකාශයට යාම, ලයිකා කියන බැල්ල මුලින්ම අභ්‍යාවකාශයට යාම, මේ වාගේ විද්‍යාවේ ජයග්‍රහණ රැසක් ඔවුන් අත්කර ගත්තා. අනෙක් පැත්තෙන් ගත්තාම ඔවුන්ගේ රටේ සම්පූර්ණයෙන්ම දුප්පත්කම තුරන් කළා. සමාජවාදය යටතේ 1930 වන විට රැකියා ප්‍රශ්නය මුළුමනින්ම තුරන් කළා. හැමකෙනෙකුටම රැකියාවක්, හැමකෙනෙකුටම නිවාසයක්, හැමොටම නොමිලේ අධ්‍යාපනයක්, නිදහසේ ජීවත්වන්න පුළුවන් රටක් හදලා තිබුණා. ඉතින් අධිරාජ්‍යවාදීනුයි, ඒ රට තුළ නිර්මාණය වුණු සමහර

15 වැනි පිටුවට



## YES WE CAN

# චේගෙන් උගෙන සටන් කරමු!

අර්නස්ටෝ චේ ගුවේරා යන නම නොදන්නා කෙනෙක් අද ලොව නැති තරම්ය. ඒ සුවිශේෂී මිනිසා ඝාතනය කෙරුණේ මෙයින් වසර 50කට පෙරය. එනම් මෙම ඔක්තෝබර් 08වැනිදාට ඔහු ඝාතනය කොට වසර 50ක් පිරේ. නමුදු ගෙවී ගිය වසර 50 තුළ චේ වඩාත් ජීවමාන වූ බව අප කවුරුත් දන්නා සත්‍යයයි. ඒ, ඔහු ධනවාදයට එරෙහිව නැගූ හඬ ලොව පුරා සටන්කාමී හඬ බවට පත්වූ නිසාය. තම භාවිතාවෙන් ප්‍රකට කළ කැපකිරීම, පරිත්‍යාගය, අධිෂ්ඨානශීලී බව හා අව්‍යාජ සටන්කාමීත්වය ලොව පුරා ධනවාදයට එරෙහි තරුණ හදවත් පුබුදුවාලීය. ඔහු ගුරු කොට ගත් තරුණ සටන්කාමීන් චේ වැන්නන් දහස් ගණනක් ලොව පුරා නිර්මාණය කරමින් ඇත. එය අද දවසේ ධනවාදයට එල්ල කොට ඇත්තේ, ප්‍රබල අභියෝගයකි.

එවකට ලතින් ඇමරිකාව පුරා පැතිර තිබූ ධනවාදයේ කෲරත්වය විසින් යෞවන වියේදීම චේ තුළ විප්ලවවාදියෙකු බිහි කළේය. තමන් මුහුණදෙන යථාර්ථයට පිටුපා පුද්ගලික ජීවිතයක් ගොඩනගනවා වෙනුවට ඔහු සමාජ අසාධාරණයට එරෙහි අරගලය තම ජීවිතය බවට පත්කර ගත්තේය. තම අරමුණ වෙනුවෙන් මාක්ස්වාදය, දර්ශනය හැදෑරීය. එයින් ලත් පන්නරය ඔහු ජාත්‍යන්තරවාදියෙක් බවට පත් කළේය.

ඒ නිසාම ඔහු, ඔහුට හමුවන ෆිදෙල් ඇතුළු සටන්කාමීන් සමග කොන්දේසි විරහිතව එක්විය. ග්‍රෑන්මා බෝට්ටුවෙන් සියරා මයේස්ත්‍රාවට ගොඩබැසීම කොතරම් දුෂ්කර වුවද එය විඳ දරාගනිමින් සටන් සඟයින් සමග ඔහු පෙරමුණේ සිටියේය. සියරා මයේස්ත්‍රාවේ දේශගුණය තම සෞඛ්‍යයට හැමවිටම බාධාකාරී වුවද එය පරදවමින් ගරිල්ලා සටනේ පෙරමුණ ගත්තේය. ගරිල්ලා භටයෙකු තබාගත යුතු විනය ඉහළින්ම තබාගත් ඔහු කණ්ඩායම තුළ එහි ආදර්ශය ප්‍රකට කළේය. ගරිල්ලා සටන තුළ වෛද්‍යවරයා ලෙස තම සටන් සගයින්ට ප්‍රතිකාර කළේ ගිනි අවියෙන් සටන්කරන අතරතුරදීමය. එපමණක් නොව තුවාල ලත් සතුරන්ට පවා ප්‍රතිකාර කිරීමට තරම් චේ මානවවාදියෙක් විය.

කියුබානු අරගලයේ ජයග්‍රහණයෙන් අනතුරුව සමාජවාදය ස්ථාපිත කිරීමේ කර්තව්‍යයේ තමන්ට ලැබුණු සියලු වගකීම්වලදී අන් අයට ඉදිරියෙන් සිට කැපවූ අතර කර්මාන්ත ඇමතිවරයාව සිටියදීත් තම්කරුවන් සමග උරෙනුර ගැටී වැඩ කළේය. කීර්තිය පිටුපස හඹා නොගිය චේ තමන්ට ලැබුණු සුළු වරප්‍රසාදයක් පවා සෘජුව ප්‍රතික්ෂේප කළේය. අවසානයේ සමාජවාදී රාජ්‍යය තුළ ලැබූ තනතුරු සියල්ල අතහැර ඔහු බොලිවියානු සටන්කරුවන් සමග එක්වන්නේ අධිරාජ්‍යවාදී ග්‍රහණයෙන් ලතින් ඇමරිකාව නිදහස් කරගැනීම සඳහා වූ ඔහුගේ උත්කෘෂ්ඨ අරමුණ ජයගැනීම උදෙසාය.

වර්තමානයේ තරුණයන් චේව අනුකරණයට උත්සාහ දැරූවද ඒ බොහෝ ප්‍රයත්නයන් චේ මතුපිටින් දැක සිදුකරණ අනුකරණයන් ලෙස හඳුනා ගත හැකිය. කෙසේ නමුදු චේ එදා දුටු සමාජ අසාධාරණය එදාටද වඩා අද වැඩියෙන් මිනිස් ජීවිත පෙළෙමින් තිබේ. චේ ගත් මඟ ගැනීම යනු එම පීඩාවට, එම අසාධාරණයට එරෙහිව සටන් මඟ පිවිසීමය; සියලු මිනිසුන් උදෙසා යුක්තිගරුක, සාධාරණ නිවහල් ලොවක් නිර්මාණය කිරීමය; ඒ සඳහා වන මාවත චේගේ සැබෑ භාවිතය තුළින් ඉගෙනීමය.



# 19 වැනි ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙලට සුභ පැතුම්!

ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනය (WFDY) 19වැනි වරටත් සංවිධානය කරන ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙලට සහභාගීවීමට සමාජවාදී තරුණ සංගමය සහ සමාජවාදී ශිෂ්‍ය සංගමය සූදානම්ව සිටියි. ඔක්තෝම්බර් මස 14 සිට 22 දින දක්වා රුසියාවේ සෝචි නුවරදී රටවල් 150ක තරුණ හා ශිෂ්‍ය සංවිධාන සහ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් 20,000කට අධික පිරිසක් ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙලට සහභාගිවීමට නියමිතය.

මෙම උළෙලට සහභාගි වන්නේ සමාජවාදී රාජ්‍යයන්හි හා අධිරාජ්‍ය විරෝධී, ප්‍රගතිශීලී තරුණ හා ශිෂ්‍ය පිරිසකි. ඔවුන් ලොවපුරා රටවල් 150ක විසිරී සිටියද එකම අරමුණක් වෙනුවෙන් සටන් කරන පිරිසකි. එහෙයින් එක් රටක සටන් ව්‍යාපාරය හසුරුවන ආකාරය හා ඔවුන්ගේ අත්දැකීම්, දැනුම බෙදා හදා ගැනීමටත් ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනඟා ගැනීමටත් සහෝදර සංවිධානවල අත්දැකීම් තුළින් පන්නරය ලැබීමටත් ගෝලීය වශයෙන් අධිරාජ්‍ය විරෝධී අරගලයේ ප්‍රවණතා අවබෝධ කරගැනීමටත් මිත්‍රත්වය හා විශ්වාසය වර්ධනය කරගැනීමටත් ඒ තුළින් අරගලය ශක්තිමත් කරගැනීමට හා කාලීන ගෝලීය ප්‍රවණතා පිළිබඳ පුළුල් සාකච්ඡා ඇතිකරගැනීමට අවස්ථා සැලසෙයි.

ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ කිහිපයක තරුණ සංවිධාන කිහිපයක්ද මෙම උළෙලට සහභාගි වන අතර එයින් සමාජවාදී තරුණ සංගමයට හා සමාජවාදී ශිෂ්‍ය සංගමයට සුවිශේෂී ස්ථානයක් හිමි වෙයි. මෙරට තරුණ ගැටලු වෙනුවෙන් පෙනී සිටිමින් විරැකියාවට එරෙහිවත් විෂ මත්ද්‍රව්‍ය භාවිතයට එරෙහිවත් සටන් වදිමින් නිදහස් අධ්‍යාපනය කප්පාදු කිරීම, මුදලට අධ්‍යාපනය විකිණීමට එරෙහිවත් අරගලයන්ට පණ පොවන සංවිධාන දෙකක් ලෙස සමාජවාදී තරුණ සංගමය හා සමාජවාදී ශිෂ්‍ය සංගමය ලංකාවේ පමණක් නොව ලොව පුරා ප්‍රගතිශීලී ව්‍යාපාර අතර ප්‍රසාදයට ලක්ව සිටියි. ශ්‍රී ලංකාව රටක් ලෙස මෙම උළෙලට විශාල තරුණ පිරිසක් සම්බන්ධ කිරීමට සූදානමින් සිටින අතර සමාජවාදී තරුණ සංගමය හා සමාජවාදී ශිෂ්‍ය සංගමය නියෝජනය කරමින් සහෝදර සහෝදරියන් 30කට වැඩි පිරිසක් ඊට සහභාගි වීමට නියමිතය.

රටවල් 150 ක් නියෝජනය වන මෙම උළෙල සමාජවාදී තරුණ සංගමයට ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගාගැනීමට මහඟු අවස්ථාවක් වේ. එය ප්‍රයෝජනයට ගනිමින් වැඩි රටවල් සංඛ්‍යාවක් සමඟ මිත්‍රත්වය තහවුරු කරගනිමින්, ජාත්‍යන්තර සම්බන්ධතා ජාලයක් සකස් කරගැනීම තරුණ සංගමයේ ප්‍රධාන අරමුණක් වෙයි. මෙම උළෙලේදී දකුණු ආසියාතික කලාපයේත් ලෝකයේත් තරුණ ප්‍රශ්න සාකච්ඡා කිරීමට නියමිතය. ලංකාවේ නිදහස් අධ්‍යාපන කප්පාදුව සම්බන්ධයෙන් ලෝකය දැනුවත් කිරීමටත් ඊට එරෙහි මෙරට සිසු පරපුරේ දැවැන්ත අරගලය පිළිබඳව ලෝකයට කීමටත් මෙය මහඟු අවස්ථාවක් වන බවට සැකයක් නැත. එහිදී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ප්‍රදර්ශන කුටියක් සකස් කිරීමටද නියමිතය. ඒ තුළින් රටේ දේශපාලන තත්වය පිළිබඳ අනෙකුත් රටවල ප්‍රගතිශීලි තරුණ හා ශිෂ්‍ය ව්‍යාපාර දැනුවත් කිරීමට සමාජවාදී තරුණ සංගමය බලාපොරොත්තු වේ.

මෙවැනි ජාත්‍යන්තර උළෙලවල් නියෝජනය කරමින් සමාජවාදී තරුණ සංගමයේ මුඛ්‍ය පරමාර්ථයන් ඉටුකරගැනීමට හා සමාජවාදී තරුණ සංගමය රට තුළත් ලොව තුළත් ශක්තිමත් සංවිධානයක් ලෙස තහවුරුවීමට මෙවැනි අවස්ථාවන් වැදගත්ය. 19වැනි ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙල නියෝජනය කරන සියලු තරුණ තරුණියන්ට සමාජවාදී තරුණ සංගමය ලෙස අපගේ උණුසුම් සුභ පැතුම් එකතු කරමු.

## තරුණ

### අට පාස් නැති සෝමේ

රස වතුර රන් වතුර
රතට හුරු රන් තැඹිලි
පාලම් හන්දියේ
තැඹිලි හරි ලාබය
කැපුම් ඉරි හැමතැනම
කරගැටද නොඅඩු වුන
දුක පිරුණු දෑතකින් බෙදන
කදුළු හරියට ලාබය
කොන්දෙ කැක්කුම්
නිදි උලුක්කු
දොළ දුකට ඇඹුල් රස
මේ එකක නිච්චියක් නැති සෝමෙ
හන්දියේ කඩේ සෝමේ
මිනිස්සු කියන්නේ
අට පාස් නැති ගැබිනි සෝමේ
දරු ගැබක් දරාගෙන
ජීවිතේ තනිකඩව කර ගහන
අට පාස් නැතත් උඹ හිත පාස්
සෝමෙ
කපල් වලට වට්ටම්
එක තැඹිලි ගෙඩියකට
බට දෙකක් නොමිලේ
කලත කලතා ආදරේ බෙදාගෙන
බොන්න
ඉතින් ඒ හැමවිටෙක
සෝමෙගෙත් අතීතය පාරන්න
දැත්වල වගේමය කැපුම් ඉරි
හදවතක
සෝමෙගෙත් ආදරේ පෑරෙන්නෙ
සියුම් පෙම් සිතුවමක් අබියසය
ආර්ථික බැම්මේ තනිකඩව
වැතිරෙන්න
ද්විමාන හීනවල සෙමෙන් ඇවිදන්
යන්න
තාත්වික කදුළු කැට දෑත්වල
දවටන්න
රාත්‍රිය එන්නෙත් දවසටම එකම එක
පාරය
දරු ගැබක් උරුම කතකට
හීන පොදි නැතුවම නෙමෙයි
තනිකමක් උරුම හිතකට...



මිනිසුන් කොටසක් කෑම සොයා
සැතපුම් ගණන් ඇවිදිති



තවත් කොටසක් කෑම දිරවීමට
සැතපුම් ගණන් ඇවිදිති

# මැතිවරණ නීති සංශෝධනයේ ඇත්ත කථාව

පසුගිය සැප්තැම්බර් 20දා පළාත් සභා පනත පාර්ලිමේන්තුවේදී සංශෝධනය විය. එම සංශෝධනය සඳහා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දය අවශ්‍ය වූ අතර ඒ සඳහා ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුද තම ඡන්දය සංශෝධනවලට පක්ෂව පාවිච්චි කළෝය. මෙම සංශෝධනයට තුන්වන වර ඡන්ද විමසද්දි පක්ෂව ඡන්ද 159ක් ලැබුණි. ජ.වි.පෙ. මන්ත්‍රීවරු 6 දෙනෙකු නැතත් ආණ්ඩුව තුනෙන් දෙකේ බලය තිබුණි. ජ.වි.පෙ. මන්ත්‍රීවරු සංශෝධනයට පක්ෂව ඡන්දය දුන්නේ තුනෙන් දෙක නැති වූ නිසා නොව අප මෙම සංශෝධනයට පක්ෂ නිසාය. මේ සමග කලබලයට පත් මහින්ද රාජපක්ෂ කල්ලියත් දේශපාලනයේ හය හතර නොදන්නා හා ජ.වි.පෙ.ට පහර ගැසීම තම එකම අරමුණ කරගත් කීපදෙනෙකුත් ජ.වි.පෙ.ට එරෙහිව අවලාද නැගීමට පටන් ගත්හ. ඒ ජ.වි.පෙ. ඡන්ද කල් දැමීමට ආණ්ඩුවට උදව් කළේයයි පවසමිනි. ජ.වි.පෙ. ආණ්ඩුව සමග එකඟතාවයකින් කටයුතු කරන බවටද අවලාද නැගිණි. ඔවුන් එසේ කරනුයේ ඔවුන්ගේ බංකොලොත්කමත් ඡන්ද පනත් සංශෝධනය වීමේ සත්‍ය කථාවත් ජනතාවගෙන් වසන්කර තැබීම සඳහාය. එබැවින් සිදුවූයේ කුමක්ද යන්න තේරුම් ගැනීම ජනතාවට හොඳය.

ධනවාදය තුළ ධනවාදය පරාජයට පත්කිරීම සඳහා කටයුතු කරන සැබෑ නිර්ධන පංති ව්‍යාපාරයක් හැම විටම කටයුතු කරනුයේ තම දේශපාලන ගමනට වාසිදායක වන ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ දිනා ගැනීමටද කටයුතු කරමිනි. ධනපති පංතිය හැම විටම නිර්ධන පංති ව්‍යාපාරයට ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කිරීමට කටයුතු කරන අතර නිර්ධන පංතිය එය දිනාගැනීමට කටයුතු කරයි. පංති දේශපාලනය එසේය. ධනපති පංතිය ශක්තිමත්ව, ශක්තිමත් ධනපති ආණ්ඩු හැදූ හැම විටකම එම ආණ්ඩු නිර්ධන පංති ව්‍යාපාරයට හානිදායක වන ලෙස ප්‍රජාතන්ත්‍රවාදය සීමාකිරීමට කටයුතු කර තිබේ. 1977 බලයට පත් ජයවර්ධන ආණ්ඩුව විධායක ජනාධිපති ක්‍රමය සහිත නව ව්‍යවස්ථාවක් සකස් කළේ ඒ සඳහාය. එම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර ගැනීමට තවමත් නොහැකි වී ඇත. එහි බලතල මදක් හෝ අඩුකිරීමට හැකිවූයේ, 2001 පරිවාස ආණ්ඩුව සමයේ 17වැනි සංශෝධනය මගිනුත් වත්මන් හවුල් පාලනය තුළ 19වැනි සංශෝධනය මගිනුත්ය. ඒ, ධනපති පාලනය දුර්වල වූ අවස්ථාවලය. එසේම මහින්ද රාජපක්ෂ පාලනය තුළද ඔහු තම පාලනයේ ශක්තිය උපයෝගී කර ගත්තේ, විධායක ජනාධිපති ධුරය ඉවත්කිරීමට නොව 18වැනි සංශෝධනය මගින් විධායක ජනාධිපති ක්‍රමයේ බලය තවත් වැඩිකර ගැනීමට හා තුන්වන වරටත් ඔහුට ජනාධිපති වීමට හැකිවීම සඳහාය. එම ප්‍රජාතන්ත්‍රවිරෝධී 18වැනි සංශෝධනයට දැන් රාජපක්ෂ මහතා වටේ සිටින හා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කිඹුල් කඳුළු හෙළන හැමදෙනාම ප්‍රවේණිදාසයන් ලෙස අත් උස්සා ඡන්දය දුන්නෝය. එම 18වැනි සංශෝධනයේ හානිකර බව අඩුකිරීමට හැකිවූයේද දුර්වල හවුල් ආණ්ඩුවේ දින 100 තුළ බලපෑම් කර ගෙන්වාගත් 19වැනි සංශෝධනය මගිනි.




මින් පැහැදිලි වන සත්‍යයක් තිබේ. ඒ ධනපති පාලනය ශක්තිමත් වූ හැම විටම ඔවුන් එම ශක්තිය ප්‍රජාතන්ත්‍රවාදය නැතිකිරීමට යොදාගත් බවත්, ජනතාවට ප්‍රජාතන්ත්‍ර අයිතීන් දිනාගත හැකිව තිබෙන්නේ ධනපති පාලනයන් දුර්වල වූ විට, එම දුර්වලකම තුළ බලපෑම් කිරීමෙන් බවත්ය. ජ.වි.පෙ. හැමවිටම කටයුතු කර තිබෙන්නේ, ධනපති පාලකයන්ගේ දුර්වලකම තුළින් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් දිනාගැනීමටය. පසුගියදා පැවැති පළාත් සභා පනත සංශෝධනය මගින් කරගත්තේද එයමය.

මේ වනවිට ලංකාවේ පළාත් පාලන ඡන්දය නොපවත්වා අවුරුදු 2කට වඩා ගතවී තිබේ. පොදුවේ ගත්කල වර්තමාන ආණ්ඩුව කුඩා ඡන්දවලට බියක් දක්වයි. ඒ, ඔවුන් දුබල නිසාත් හවුල් ආණ්ඩුවේ හවුල ඡන්දයකදී අවුල් වන නිසාත්ය. එසේම ශ්‍රීල.නි.ප.යද ඡන්දවලට දක්වන්නේ අකමැත්තකි. ඒ ඔවුන්ගේ පක්ෂයේ කැඩී බිඳී තිබෙන නිසාය. ඒ නිසා ඔවුන් තමන්ට සාධාරණීකරණය කර ගැනීමට කරුණු තිබේ නම් ඒ මගින් ඡන්ද කල්දමා ගැනීමට කටයුතු කරයි. එය සත්‍යයකි. අප කළ යුතු වන්නේ ඊට ඉඩ නොදීමය.

අපේ රටේ පළාත් පාලන ඡන්දය 2015දී පැවැත්වීමට නොහැකි වූයේ ජනාධිපතිවරණය හා මහ මැතිවරණය යන ඡන්ද දෙකම පැවති නිසාය. එහෙත් 2016දී පළාත් පාලන ඡන්දය නොපැවැත් වුණි. ඊට හේතුවූයේ කමක්ද? ඊට මුළුමනින්ම වගකිව යුතු වන්නේ, රාජපක්ෂ පාලනය හා බැසිල් රාජපක්ෂ ඇතුළු කණ්ඩායමය. මහින්ද රාජපක්ෂ පාලනය තුළ බැසිල් රාජපක්ෂ ප්‍රමුඛ කීපදෙනෙක් එක්ව තම බලය යොදා පළාත් පාලන ඡන්දය සඳහා නව මැතිවරණය ක්‍රමයක් සම්මතකර ගත්තෝය. එය ඉතාම වැරදි විකෘති මැතිවරණ ක්‍රමයක් විය. මනාප ක්‍රමය ඉවත්කිරීමට මුවාවී කොට්ඨාස ක්‍රමය මූලික කරගෙන සකස් කළ එම මැතිවරණ ක්‍රමය ලංකාවේ ද්විපක්ෂ පාලනයක් ඇතිකරන ප්‍රධාන ධනපති පක්ෂ දෙක හැර අන් පක්ෂ මැතිවරණ දේශපාලනයෙන් පලවා හරින වර්ගයේ එකක් විය. එහි දෝෂද රැසක් තිබිණි. එසේම ඊට අනුව කොට්ඨාස සීමා නිර්ණය කළ ආකාරයද අවිද්‍යාත්මක හා රාජපක්ෂවරුන්ට පක්ෂග්‍රාහී එකක් වී තිබිණි. එබැවින් සීමා නිර්ණයන් විමර්ශනය කර කොට්ඨාස වෙන් කිරීමේ ගැටලු නිවැරැදි කළ යුතු විය. මේ සඳහා කාලය අවශ්‍ය වූ අතර ආණ්ඩුව එය උපයෝගී කරගෙන ඡන්දය කල් දැමීය.

මෙහිදී ජ.වි.පෙ. දිගටම සටන් කළේ පළාත් පාලන මැතිවරණය ඉක්මනින් පවත්වන ලෙස බලකරමිනි. රාජපක්ෂවරුන් ගෙන ආ නව ක්‍රමය ප්‍රතික්ෂේප කළ අපි නව ක්‍රමයේ දුර්වලතා නිවැරැදි කිරීමට කල්ගත වන්නේ නම් පැරණි ක්‍රමයට හෝ පළාත් පාලන ඡන්දය වහාම පවත්වන මෙන් බල කළෙමු. එහෙත් එවිට ආණ්ඩුවත්, ශ්‍රීල.නි.ප.යත්, රාජපක්ෂ කල්ලියත් මහා හඬින් කෑගැසුවේ පැරණි ක්‍රමයට නැවත යා යුතු නැති බවත් මනාප ක්‍රමය වෙනස් කළ යුතු බවත් පවසමිනි. මේ නිසා පළාත් පාලන ඡන්දය කල්යෑමේ වගකීමේ වැඩි ප්‍රමාණය බාරගත යුතුව ඇත්තේ අන් කවුරුත් නොව විකෘති මැතිවරණ ක්‍රමයක් හදා මැතිවරණ පවත්වා නොසිටීමට ආණ්ඩුවට හේතු සකස්කර දුන් රාජපක්ෂ කල්ලියය.

කෙසේ වුවත් පළාත් පාලන ඡන්දය කල් නොදමා පැවැත්වීමේ අවශ්‍යතාවය ඉටුකර ගැනීමට නම් පළාත් පාලන මැතිවරණ ක්‍රමයේ විකෘතිය ඉවත්කර ගත යුතු විය. එහිදී පැරණි මනාප ක්‍රමයට ආපසු යාම කළ නොහැකි නම් රාජපක්ෂ ආණ්ඩුව සම්මතකර තිබූ 'නව ක්‍රමය' වැරදි නම් එම ක්‍රම දෙකම නොව නවතම මැතිවරණ ක්‍රමයක් නිර්මාණය කර ගතයුතු විය. මේ වනවිට පාර්ලිමේන්තු මහ මැතිවරණය සඳහා නව ඡන්ද ක්‍රමයක් යෝජනා වී තිබූ අතර එය මනාප පොරය නැති කොට්ඨාස හා සමානුපාතික මිශ්‍ර එහෙත් සමානුපාතික ක්‍රමය පදනම් කරගත් සාපේක්ෂකව හොඳ ක්‍රමයක් විය. එම ඡන්ද ක්‍රමය පළාත් පාලන ඡන්දය සඳහා යොදාගන්නා ලෙස ජ.වි.පෙ.ත් තවත් පක්ෂ ගණනාවකුත් ආණ්ඩුවට බල කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය අගෝස්තු 25දින පළාත් පාලන පනත සංශෝධනය කොට කාන්තා නියෝජනයද ඇතුළත් කර අලුත්ම ඡන්ද ක්‍රමයක් සහිතව එය සම්මත කරගනු ලැබීය.

මේ තත්වය මත පළාත් පාලන ඡන්ද පැවැත්වීමට තිබූ තාක්ෂණික බාධා ඉවත් විය. එහෙත් මේ සඳහා ආණ්ඩුව සැලකිය යුතු කාලයක් ගැනීමත් ආණ්ඩුවේ අරාජික හැසිරීමත් නිසා පළාත් පාලන ඡන්ද විමසීම් කිරීම සඳහා නෛතික තත්වය සැපිරෙන විට රටේ පළාත් සභා 3ක නිල කාලය අහෝසිවීමට ආසන්න විය. ඒ අනුව නැගෙනහිර, උතුරු මැද හා සබරගමුව පළාත් සභාවල නිල කාලය ඔක්තෝබර් මුල වන විට අවසන් වන අතර පළාත් සභා පනතට අනුව එම ඡන්ද පැවැත්වීම (පළාත් 3ක) අනිවාර්යවීම නිසාත් ඡන්ද දෙකක් එකවර පැවැත්විය නොහැකි නිසාත් යළි පළාත් පාලන ඡන්දය කල් යෑමේ අනතුර මතුවීය. මෙම දෙසැම්බරයේ ස/පෙළ විභාගය පැවැත්වීම නිසා දෙසැම්බරයේ ඡන්ද පැවැත්වීමද නොකළ හැකි විය.

මෙහිදී ආණ්ඩුව උත්සාහ කළේ මේ තත්වය උපයෝගී කරගෙන පළාත් සභා ඡන්දය කල්දැමීමට ක්‍රමයක් සෙවීමටය. පළාත් සභා එකම දිනයක පැවැත්වීම සඳහා අවසන් පළාත් සභා විසිරෙන තුරු අනෙක් පළාත් සභා කල් දැමීම සඳහා ආණ්ඩුව 20වැනි සංශෝධනය සකස් කළේය. රාජපක්ෂ පාලනය තුළ පළාත් සභා විටින් විට පවත්වනු ලැබුයේ එය දේශපාලන සූදුවක් කරගෙනය. එබැවින් පළාත් සභා සියල්ල එකම දිනයක පැවැත්වීම හොඳ වුවත් ඒ මත පදනම්ව පළාත් සභා ඡන්ද වසර 2ක් පමණ කල් දැමීමට ජ.වි.පෙ. එකඟ වූයේ නැත. කෙසේ වෙතත් මෙම සංශෝධනයට ජනමතවිචාරණයක්ද අවශ්‍ය බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රකාශ කිරීම නිසා 20වැනි සංශෝධනය අත්හැර දැමීමට ආණ්ඩුවට සිදුවිය.

එහෙත් ඒ සමග අලුත් ගැටලුවක් ඉතිරිවිය. ඒ පළාත් සභා තුනේ ඡන්දය නිසා පළාත් පාලන ඡන්දය යළි කල්යාමය. ඊට ආණ්ඩුවද අකමැති වූයේ නැත. මන්ද ඡන්දවලින් මගහැර යා හැකිනම් ආණ්ඩුවට මේ මොහොතේ එය හොඳ නිසාය. එහෙත් අපේ අවශ්‍යතාවය වූයේ රටපුරාම පවත්වන පළාත් පාලන ඡන්දය ඉක්මනින් පවත්වා ගැනීමය. ඊට පැහැදිලි හේතු තිබේ. පළමුවැන්න දැන් වසර දෙකකට වඩා කල්ගොස් තිබෙන්නේ පළාත් පාලන ඡන්දයය. එය වහාම පැවැත්විය යුතුය. රටේ ජීවත්වන ජනතාවගේ එදිනෙදා ජීවිතය හා බැඳී තිබෙන්නේ, පළාත් පාලන

02 වැනි පිටුවට

මේ වනවිට ලංකාවේ පළාත් පාලන ඡන්දය නොපවත්වා අවුරුදු 2කට වඩා ගතවී තිබේ. පොදුවේ ගත්කල වර්තමාන ආණ්ඩුව කුඩා ඡන්දවලට බියක් දක්වයි. ඒ, ඔවුන් දුබල නිසාත් හවුල් ආණ්ඩුවේ හවුල ඡන්දයකදී අවුල් වන නිසාත්ය. එසේම ශ්‍රීල.නි.ප.යද ඡන්දවලට දක්වන්නේ අකමැත්තකි. ඒ ඔවුන්ගේ පක්ෂයේ කැඩී බිඳී තිබෙන නිසාය. ඒ නිසා ඔවුන් තමන්ට සාධාරණීකරණය කර ගැනීමට කරුණු තිබේ නම් ඒ මගින් ඡන්ද කල්දමා ගැනීමට කටයුතු කරයි. එය සත්‍යයකි. අප කළ යුතු වන්නේ ඊට ඉඩ නොදීමය.



"විප්ලවය ඉතිහාසයේ ප්‍රවර්තක යන්ත්‍රය වේ යයි මාක්ස් කීය. විප්ලව සූරාකෑමට හා පීඩනයට ගොදුරු වූවන්ගේ ප්‍රීති උත්සව වෙති. පොදු ජනතාවට නව සමාජයක නිර්මාතෘවරයින් ලෙසින් ක්‍රියාශීලීව පෙරට පැමිණීමට විප්ලව සමයකදී මෙන් වෙනත් කිසිම කාලයකදී බැරිය. අනුක්‍රමික ප්‍රගතිය පිළිබඳ පටු අශ්ශීල මට්ටම අනුව සමකර බලන විට, එබඳු අවදියකදී, ප්‍රාතිහාර්ය දැක්වීමට මහජනයා සමත් වේ. එහෙත්, එබඳු කාලවලදී, විප්ලවකාරී පක්ෂවල නායකයින්ද ස්වකීය ඉලක්ක වඩාත් සුබාවබෝධී හා පැහැදිලි කළ යුතු වෙයි."

**ලෙනින්**
**'ප්‍රජාතාන්ත්‍රික විප්ලවයේදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ උපක්‍රම දෙකක්', 112 පිටුව**

# ජාතික සමගිය උදෙසා

එදා මෙදා තුර ජාතිවාදය යන්න බලය රැක ගැනීම සඳහා මෙන්ම බලය ලබා ගැනීම සඳහාද පැවති ධනේශ්වර ආණ්ඩුවලට සහ පක්ෂවලට කදිම කට ගැස්මක් විය. වත්මන් දේශපාලන වටපිටාව තුළද මේ බව නොයෙක් සිදුවීම් මගින් පිළිබිඹු වෙමින් තිබේ. ඉතාම සුළු සිදුවීමක් පවා ජාතිවාදී පදනමින් විග්‍රහ කරමින් කටයුතු කිරීමට ඇතැම් කල්ලි, කණ්ඩායම් කටයුතු කරමින් සිටී.

මෙවන් දේශපාලන වටපිටාවක් තුළ කඳුරට ජනතා පෙරමුණෙ තරුණ අංශය වන කම්කරු තරුණ පෙරමුණේ මහා සමුළුවේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයාට සහභාගි වීමට ඉඩ ලැබීමම ජාතිවාදයට ප්‍රබල පහරක් විය. ඔවුන් එම තෝරා ගැනීම කරන්නට ඇත්තේ මේ රටේ ජාතිවාදයට එරෙහි ජාතික මට්ටමේ එකම දේශපාලන ව්‍යාපාරය ජ.වි.පෙ. නිසා වන්නට ඇත.

මෙම සමුළුව පසුගිය සැප්තැම්බර් 18 වෙනිදා කොටගල හින්දු සංස්කෘතික ශාලාවේදී කඳුරට ජනතා පෙරමුණේ නායක වී. රාධා ක්‍රිෂ්ණන් මහතා ඇතුළු එම පක්ෂයේ ප්‍රධානීන්ගේ මූලිකත්වයෙන් පැවත්විණි. මේ අවස්ථාව සඳහා කඳුරට ජනතා පෙරමුණේ තරුණ ක්‍රියාකාරීන් ඇතුළු විශාල පිරිසක් සහභාගි වී සිටි අතර එහිදී අනුර දිසානායක සහෝදරයාට ඔවුන්ගේ උණුසුම් ප්‍රතිචාර හිමි විය.





# දිරිය සමුළු ඉදිරියටම

ආණ්ඩුවේ ප්‍රධාන කාර්යය භාරය වී ඇත්තේ, තම අභ්‍යන්තර ගැටලු නිරාකරණය කර ගැනීම විනා රටේ ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටීම නොවන බව මේ වන විට තහවුරු වී තිබේ. දිනපතාම වගේ ආණ්ඩුවේ මෙන්ම එ.ජා.ප., ශ්‍රීල.නි.ප. සහ ඒකාබද්ධ කල්ලියේ අභ්‍යන්තර ප්‍රතිවිරෝධතා වාර්තා වෙමින් පවතින තත්වයක් තුළ ජනතාවට සිදුව ඇත්තේ කබලෙන් ලිපට වැටීමටය.

මෙවන් වාතාවරණයක් තුළ රටේ ජනතාව මේ තත්වයෙන් මුදා ගැනීම සඳහා ජ.වි.පෙ. ඔවුනට දේශපාලන අවබෝධය ලබා දෙමින් තමන්ව පීඩාවට පත් කළ සහ පත් කරමින් සිටින පක්ෂ, කල්ලි සහ කණ්ඩායම්වලට එරෙහිව සංවිධානය කරමින් සිටී.

"ගමට දිරියක් - රටට බලයක්" යන තේමාව යටතේ දිරිය පුරවැසි දිසා සමුළු ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා යන සහෝදරවරුන්ගේ ප්‍රධානත්වයෙන් දිවයිනේ සියලු දිස්ත්‍රික්ක පුරා පැවැත්වෙමින් තිබේ. මේ අතර පසුගිය සැප්තැම්බර් 17වැනිදා කුරුණෑගල සත්‍යවාදී පිටියේදී එම දිස්ත්‍රික් දිරිය පුරවැසි දිසා සමුළුව උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහ ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික නාමල් කරුණාරත්න සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු මෙම සමුළුවට පුරවැසි සමිති නියෝජනය කරමින් විශාල පිරිසක්ද මෙයට සහභාගි වී සිටියහ. එසේම සැප්තැම්බර් 16 නුවරඑළියේදිද, 24 බදුල්ලේදී දිසා සමුළු පැවැත්විණි.

# වෙනිසියුලාවට සහය පළකර

හියුගෝ චාවේස් වෙනිසියුලාවේ බලයට පත් වූ පසු ඔහු බලයෙන් පහ කිරීම සඳහා ඇමරිකානු එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදී රටවල් සහ චාවේස්ට එරෙහි කණ්ඩායම් අනවරත අරගලයක නිරත විය. 2002 වසරේ අසාර්ථක හමුදා කුමන්ත්‍රණය එහි එක් අවස්ථාවක් විය. සැකකටයුතු චාවේස්ගේ මරණින් පසුව තමන් ගේ බලාපොරොත්තු ඉටු වේ යැයි ඔවුන් සිතුවද එය එසේ නොවීය. ඉන්පසු බලයට පැමිණි චාවේස්ගේ දේශපාලන මිතුරු මදුරෝගේ පාලනය බිඳ වැට්ටීම සඳහාද ඔවුහු නොනැවතී වෙහෙසෙමින් සිටිති. වෙනිසියුලාව වැනි ආර්ථික අතින් යම් ශක්තිමත් රටක් හා සම්බන්ධ වෙමින් කියුබාව විසින් ලතින් ඇමරිකානු කලාපය තුළ අධිරාජ්‍ය විරෝධී කඳවුරක් ගොඩ නැගීමට කටයුතු කිරීම කිසිසේත්ම ඇමරිකානු එක්සත් ජනපදයට ඉවසා සිටිය හැක්කක් නොවේ. මේ මොහොත වන විටත් ඇමරිකාව විසින් වෙනිසියුලානු ආණ්ඩු විරෝධී කණ්ඩායම් සඳහා සහයෝගය දෙමින් සිටින අතර ට්‍රම්ප් පාලනය විසින් නව ආර්ථික සහ මූල්‍ය සම්බාධක පනවමින් වෙනිසියුලානු ජනතාව පීඩනයට පත් කිරීමට කටයුතු කරමින් සිටී.

මෙවන් වටපිටාවක් තුළ ලොව පුරා ප්‍රගතිශීලී රටවල්ද වාමාංශික දේශපාලන ව්‍යාපාර මෙන්ම අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරයන්ද වෙනිසියුලාවට තම සහයෝගය පළ කරමින් තිබේ.

ජනතා විමුක්ති පෙරමුණද තම සහයෝගය වෙනිසියුලාවට පළකිරීම සඳහා "වෙනිසියුලාවට එරෙහි අධිරාජ්‍යවාදී අතපෙවීම් වහා නවතනු!" යන මැයෙන් සම්මන්ත්‍රණයක් පසුගිය සැප්තැම්බර් 28වැනිදා කොළඹ තැපැල් අමාත්‍යංශ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ කියුබානු තානාපති එලීනා රාමෝස්, මහාචාර්ය අජන්තා හපුආරච්චි, ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා මෙහි ප්‍රධාන දේශන පැවැත්වූහ.



# උක් ගොවි ගැටලු විසඳන ලෙසට බලකර



යුරෝපයේ පැවති වැඩවසම් සමාජ ආර්ථික ව්‍යුහය තුළ මූලික පංති බෙදීම වූයේ ඉඩම් හිමියන් සහ ප්‍රවේණි දාසයන් අතරය. සැබවින්ම ප්‍රවේණි දාසයා යනු ඉඩමට බැඳි වහලෙක්ම විය. ඔහුට ඉඩමෙන් තොර ජීවිතය සිහිනයක්ම විය. වර්තමානය වන විට ධනවාදී අර්ථ ක්‍රමයක් සහිත සමාජයක අප ජීවත් වුවද, නිෂ්පාදන උපකරණවල සංවර්ධනය වැඩවසම් යුගයට වඩා පිම් ගණනාවකින් ඉදිරියට ගොස් තිබුණද ඒ වැඩවසම් නෂ්ඨාවශේෂ වත්මනේද දැකිය හැකිය.

පසුගිය සැප්තැම්බර් 25වැනිදා සෙවණගල උක් ගොවියෝ තම ඉල්ලීම් ලබා ගැනීම සඳහා සමස්ත ලංකා ගොවිජන සම්මේලනය හා එක්ව උද්ඝෝෂණ ක්‍රියා මාර්ගයකට එළඹුණහ. සැබැවින්ම මේ උක් ගොවියන්ද වැඩවසම් යුගයේ මෙන් ඉඩමට බඳිනු ලැබ තිබේ. ඔවුනට තම ඉඩම්වල උක් වගා කරනු හැර වෙන විකල්පයක් ඉතිරි කර නොමැති හෙයින් ඔවුහු ගැටලු ගණනාවකට මුහුණ දී සිටිති. ජීවන වියදමට සරිලන සේ උක් මිල වැඩි කරවා ගැනීම, අත්හිටුවා ඇති ගොවීන්ට ලැබිය යුතු මුදල් වහා නිදහස් කර ගැනීම, පොහොර සහනාධාර ලබා ගැනීම, උක් පර්යේෂණ ආයතනයේ නිර්දේශවලට අනුව බීජ ලබාගැනීම ඔවුන් සිදු කළ උද්ඝෝෂණයේ ප්‍රධාන ඉල්ලීම් විය.

සෙවණගල උක් ගොවි සංගමය හා සමස්ත ලංකා ගොවිජන සම්මේලනය එක්ව සිදු කළ මෙම උද්ඝෝෂණය සඳහා විශාල ගොවීන් ප්‍රමාණයක් සහභාගි වූ අතර ඔවුහු කිලෝ මීටර් පහක් පමණ දුර ගෙවා පැමිණ සෙවණගල සීමාසහිත ලංකා සීනි සමාගම ඉදිරිපිට විරෝධතාවයේ නිරත වූහ.

# සමාජවාදය තුළ ආපදා කළමනාකරණය

පාරිසරික ආපදාවන් මේ දිනවල ලෝකයේ සෑම රටක්ම බහුලව අත්විදින සිදුවීමකි. මිනිසාගේ ක්‍රියාකාරීත්වය හේතුවෙන් සිදුවී ඇති පරිසර දූෂණය, මෙම ආපදාවන් බොහොමයකට හේතු ලෙස සඳහන් වේ. පරිසර දූෂණය මේ තරම් ප්‍රමාණයකට වර්ධනය වීමට වගකිව යුත්තේ වත්මන් ධනවාදයයි; අධිරාජ්‍යවාදයයි. හුදෙක් ලාභය පසුපස හඹා යාමත් අධිපාරිභෝජනවාදී ජීවන රටාවත් මෙම තත්වයට පාර කපා ඇත.

මේ ආකාරයෙන් පාරිසරික ව්‍යසනයන්ට වගකිවයුතු ධනවාදය ආපදා කළමණාකරණයේදීද පෙන්නුම් කරන්නේ සිය අසමත්භාවයයි. ආපදා කළමණාකරණයේදී අදටත් සමස්ත ලෝකයටම ආදර්ශය සපයමින් සිටින්නේ සමාජවාදයයි. ජීවමාන, සජීවී ආදර්ශය වී තිබෙන්නේ සමාජවාදයයි.

ධනවාදය තුළදී ආපදා කළමනාකරණය කොතරම් අසමත්ද යන්න ශ්‍රී ලාංකිකයන් ලෙසට අපි දනිමු. ගංවතුර අවස්ථාවලදීත් නායයාම්, කුණු කඳු කඩා වැටීම්වලදීත් ධනපති පාලකයන් කෙතරම් අසරණවේද ධනපති රාජ්‍ය යන්ත්‍රය කොතරම් අසමත්ද යන්න අපි අත්දකිමු. රජයේ මැදිහත්වීමෙන් තොරව ක්‍රියාත්මක වන ස්වෙච්ඡා සංවිධාන හා ජනතා ක්‍රියාකාරීත්වය නොවන්නට ජනතාවට මුහුණ පාන්නට සිදුවන ගැටලු මීටත් වඩා බරපතළ වනු ඇත.

ධනවාදය තුළදී පවා ජනතාවට විපතක් වූ සෑම අවස්ථාවකදීම වමේ ව්‍යාපාරය ජනතාව වෙනුවෙන් සදා නොමැකෙන කාර්යභාරයක් ඉටු කර ඇත. ශ්‍රී ලංකාව තුළ පැතිරී ගිය මැලේරියා වසංගතයේදී එවකට ශ්‍රී ලංකාවේ වමේ ව්‍යාපාරය විසින් සූරියමල් ව්‍යාපාරය මගින් ජනතාව වෙනුවෙන් ඉටුකළ කාර්යභාරය ලාංකේය මෑත ඉතිහාසයේ නොමැකෙන සටහනකි. 1979 සුළි සුළං ආපදාවේදීත්, ගංවතුර, නායයාම්, සුනාමි ව්‍යසනයන්හිදීත් ජනතා විමුක්ති පෙරමුණේ 'රතු තරුව' සහන සේවා බලකාය ඉටු කළ කාර්යභාරයද එවැන්නකි.

දේශීය වශයෙන් පමණක් නොව, ජාත්‍යන්තරවද වමේ ව්‍යාපාරය සතු අත්දැකීම් එමටය. උදාහරණයක් ලෙස කොමියුනිස්ට් පක්ෂ පාලකයන් පවතින ඉන්දියාවේ කේරළ ප්‍රාන්තයේ 'රතු සෙබළු' සංවිධානය ඉටුකරන කාර්යභාරය දැක්විය හැකිය. ඉන්දියාවේ මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂය විසින් පවත්වා ගෙන යනු ලබන 'රතු සෙබළු' ස්වෙච්ඡා සංවිධානය කේරළ ප්‍රාන්තයේ සෑම ප්‍රදේශයකම පිහිටුවා ඇත. ස්වේච්ඡා පදනමින් බඳවා ගනු ලබන තරුණ තරුණියන් ප්ලැටූන් ලෙස සංවිධානය කරන අතර ඔවුන්ට හදිසි ආපදා අවස්ථාවන්හිදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ පුහුණුවක් ලබා දෙයි. හදිසි අපදා අවස්ථාවනහිදී පක්ෂය විසින් ඔවුන් කැඳවනු ලබන අතර සහන සේවා කටයුතුවල යෙදවේ.



සමාජවාදය තුළදී ආපදා කළමණාකරණය කෙසේවේද යන්න පිළිබඳ ජීවමාන සහ හොඳම අත්දැකීම ලැබෙන්නේ කියුබාවෙනි. පසුගියදා කැරිබියානු කලාපයේ ලතින් ඇමරිකානු රටවල් හරහා හඹා ගිය ඉර්මා කුණාටුවට කියුබාව මුහුණ දුන් ආකාරය ලොවටම ආදර්ශයක් වී ඇත.

ඉර්මා කුණාටුව කැරිබියන් කලාපය හරහා හඹා ගියේ පැයට කි.මි. 280ක වේගයෙනි. එය කුණාටු වර්ගීකරණය අනුව 5වැනි හෙවත් දරුණුම කුණාටු ගණයට අයත් එකකි. ඇතැම් වෙබ් අඩවි වාර්තා කළ ආකාරයට එය චන්ද්‍රිකා තාක්ෂණය මගින් අනතුරු ඇඟවීම් සිදු කිරීම ආරම්භ කිරීමෙන් පසු හටගත් දරුණුම කුණාටුව එයය. එය පැය 72 ක් පුරා, එනම් දින 03 ක් පුරා කියුබාව හරහා ගමන් කළාය.

- ඉර්මා කුණාටුව පැමිණීමට පෙර, ඊට මුහුණ දීම සඳහා සහ ඉන් ආරක්ෂා වීම සඳහා කියුබානු රජය සිදුකළ සූදානම, කියුබාව සතු සීමිත සම්පත් ප්‍රමාණය හා සීමිත මූල්‍ය ප්‍රමාණය හා සැසඳූ කල ඉතාම දියුණු ධනපති රටකට පවා නොදෙවෙනිය.

කියුබානු රජය ඉර්මා කුණාටුව පැමිණීමට දින 07 කට පෙර සිටම ඒ පිළිබඳව ජනතාව දැනුවත් කළේය. එම දැනුවත් කිරීම් කෙතරම් සාර්ථකද වීදයත් කුණාටු වර්ගීකරණයේ අංක 5 යන්න කුමක්ද යන වග සෑම පුරවැසියෙකුම දැන සිටියෝය. කල් තබා දැනුවත් කිරීම් සිදුකළ නිසා ඇතිවන ආපදාවට සූදානම් වීම සඳහා ජනතාවට ප්‍රමාණවත් කාලයක් ලැබිණි.

- කියුබානු කොමියුනිස්ට් පක්ෂය හා කියුබානු රජය වැඩි අවධානය යොමු කළේ, ජනතාව අනතුරුදායක ප්‍රදේශවලින් ඉවත් කිරීමට වඩා ඔවුන්ට ආරක්ෂාව සැලසීමටයි. ගිනි නිවීමේ කාර්යාංශය, සෞඛ්‍ය හා ප්‍රවාහන සේවාවන් සම්බන්ධ කර ගනිමින් හදිසි අවස්ථාවකදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ පෙරහුරු ගණනාවක්ම ජනතාව සමග සිදු කරන ලදී.

- කියුබාව සිය සූදානම සැලසුම් කර තිබුණේ, රටේ සියලු දෙනාටම ආරක්ෂාව සැලසෙන ආකාරයෙනි. පුද්ගලයා ජීවත් වන්නේ කොහිද, නගරබදද, ගම්බදද, ඔහුගේ තරාතිරම කුමක්ද යන්න නොසලකා සෑම දෙනාගේම ආරක්ෂාව තහවුරු වන පරිද්දෙන් එය සැලසුම් කර තිබුණි. කියුබාවේ කිසිම පුරවැසියෙකුට තමන් අත්හැර දමා ඇතැයි යන හැඟීමක් ඇති නොවුණි. සෑම දෙනෙකුටම සුරක්ෂිතභාවය පිළිබඳ සහ ළඟ එන ව්‍යසනයට එරෙහිව එක්ව අරගල කිරීමට අවශ්‍ය විශ්වාසය ජනතාව තුළ ගොඩනැගීමට කියුබාව කටයුතු කළේය.

> කුණාටුවෙන් පසු විනාශ වූ කියුබාව යළි ගොඩනගද්දි කියුබානු ජනතාව කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයෙන් පුදුම සහගත ධෛර්යකින් ඊට මැදිහත් විය. එහිදී ඔවුහු වික්‍රමාන්විත අයුරින් කටයුතු කරමින් ඉතා වේගයෙන් රට ප්‍රකෘතිමත් කළහ.

- ආපදාවට මුහුණ දීමේදී කියුබාව එකම පවුලක් ලෙස කටයුතු කළේය. සර්ම කලාපීය කුණාටුවලට මුහුණ දීමේදී එක් එක් පවුල් ඒකකය තම පවුලේ සාමාජිකයින්, සතුන්, දේපළ, පවුලේ ආර්ථිකය හා අසල්වැසියන්ගේ ආරක්ෂාව සඳහා පියවර කිහිපයක් ගත යුතුව තිබුණි. මෙම පියවරයන් කවරේද යන්න කියුබානු රජය කල් තබා ජනතාව දැනුවත් කර තිබුණි. තමන් යා යුත්තේ කවර ස්ථානයටද කවර වේලාවකදීද යන්න ඔවුන්ට පවසා තිබුණි.

පවුලේ ප්‍රධානියෙකු නිෂ්පාදන ක්‍රියාවලියේ හෝ සහන සේවා කටයුතුවල යෙදී සිටියේනම් ඔහු වෙනුවට පවුලේ කටයුතු බලාගන්නා කෙනෙකු නම් කර තිබිය යුතු විය. පවුලේ එක් එක් පුද්ගලයාටද නිශ්චිත වගකීමක් පවරා තිබිය යුතුය. සතුන් ආරක්ෂා කර ගැනීම, වගාවන් ආරක්ෂා කර ගැනීම, නිවෙස ආරක්ෂා කර ගැනීම සහ තම ප්‍රදේශයේ අනෙකුත් අයගේ කටයුතු සොයා බැලීම ආදිය සඳහා මෙලෙස වගකීම පැවරිය යුතු විය.

- මේ ආකාරයෙන් පුද්ගලයන් 700,000ක් පමණ කුණාටුව පැමිණීමට පෙරම, ආරක්ෂිත ස්ථාන කරා ගෙන යාමට ඔවුන්ට හැකි විය. මුළු කියුබාවම ඉර්මා කුණාටුවට ගොදුරු වෙද්දි මරණ සංඛ්‍යාව 10ක් වැනි අඩු මට්ටමකින් සිදුවූයේ ඒ නිසාය.

හැටේ දශකයේ සිට පවත්වාගෙන යන 'විප්ලවය ආරක්ෂා කිරීමේ කමිටු' ජනතාව දැනුවත් කිරීමේදීත්, ඔවුන් ආරක්ෂිත ස්ථාන කරා ගෙන යාමේදීත්, ඔවුන්ගේ අනිවාර්ය අවශ්‍යතා සම්පාදනයේදීත් වැදගත් කාර්යභාරයක් ඉටු කළේය.

එහෙත් ආර්ථික වශයෙන් ලොව බලවත්ම රටවන එක්සත් ජනපදයේ ජනතාවට මෙම සුරක්ෂිතභාවය හෝ මැදිහත් වීම නොලැබුණි. ඒ වෙනුවට ඔවුන්ට අත්විදීමට සිදුවූයේ අනාරක්ෂිතභාවයයි. මෙම ආපදා අවස්ථාව ලාභ ඉපැයීමේ නිමිත්තක් කර ගත් ව්‍යාපාරිකයෝ ඛනිජ තෙල්, ජානීය ජලය වැනි අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ඉතා අධික මිල ගණන්වලට ජනතාට අලෙවි කළෝය. එක් අවස්ථාවකදී මැරියට් හෝටලයේ පාලකයින් ආපදාවට ලක්වූ පුද්ගලයන් 35 දෙනෙකුට සහන සැලසීම ප්‍රතික්ෂේප කළේ ඔවුන් සිය පාරිභෝගිකයින් නොවන බව පවසමිනි. එක්සත් ජනපදය තුළදී මෙම ආපදාව බලපෑවේ සෑම දෙනාටම එකම ආකාරයට නොවේ. ධනවතුන් කල් තබා ආරක්ෂක පියවරයන් ගෙන ආරක්ෂා වූ අතර දුප්පතුන් මෙම ව්‍යසනයේ අහිංසක ගොදුරු බවට පත්විය.

කුණාටුවෙන් පසු විනාශ වූ කියුබාව යළි ගොඩනගද්දි කියුබානු ජනතාව කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයෙන් පුදුම සහගත ධෛර්යකින් ඊට මැදිහත් විය. එහිදී ඔවුහු වික්‍රමාන්විත අයුරින් කටයුතු කරමින් ඉතා වේගයෙන් රට ප්‍රකෘතිමත් කළහ.

මේ අතර කියුබානු රජය විනාශ වී ගිය සිය නිවෙස් ආදී පුද්ගල දේපළ යථා තත්වයට පත්කර ගැනීම සඳහා පියවර ගණනාවක් ගෙන තිබේ. ඒ අනුව නිවස මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් විනාශ වී ඇත්නම් එය ගොඩනැගීමට යන වියදමින් හරි අඩක් රජය විසින් දරනු ලැබේ. ආරක්ෂක මණ්ඩලය එක් එක් නිවසට සිදුවූ අලාභය තක්සේරු කරනු ඇත. නිවෙස් සාදා ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා නිවැසියන්ට අඩු පොලියට දිගුකාලීන ණයක් ලබා ගත හැකිය.

සිදුවී ඇති හානිය විශාල නම් බැංකු ණයෙහි පොලිය රජය විසින් ගෙවා දමනු ඇත. අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් හැකියාවක් නොමැති පුද්ගලයන්ට ආරක්ෂක මණ්ඩලයේ අනුමැතිය යටතේ භාණ්ඩ මිලදී ගැනීම සඳහා සහන ලබා දේ.

සමාජවාදී කියුබාව ආපදා කළමනාකරණයෙහිලා දැක්වූ හැකියාව සමාජවාදය මිනිසුන් කෙරෙහි දක්වන මානවවාදී ආකල්පයේ සහ සැලසුම් සහගත සමාජ සංවිධානයේ පිළිබිඹුවකි.



"මිනිසුන් විශ්වාස කිරීමට පෙර ඔවුන් අඳුනා ගැනීමට උත්සාහ කරන්න. මක්නිසාද අප ජීවත් වනුයේ, පිළිගැනීමේ බීම වීදුරුවට කෘත්‍රිම දෙහි රස පාවිච්චි කරන්නාවූද අත සෝදන භාජනයට සැබෑ දෙහි පාවිච්චි කරන්නාවූද අන්දමේ ලෝකයක වීම නිසාය."

**අබ්දුල් කලාම්**

# මියන්මාරය: ජාත්‍යන්තරකරණය වන රෝහින්ගයා ගැටලුව

මියන්මාරයේ රෝහින්ග්‍යාවරුන්ගේ ගැටලුව මේ දිනවල ජාතිකවත් ජාත්‍යන්තරවත් සාකච්ඡාවට ලක්වෙමින් තිබේ. ශ්‍රී ලංකාව තුළ විවිධ දේශපාලන බලවේග හා කණ්ඩායම්ද, දකුණු ආසියානු කලාපයේ සියලු රටවල ආණ්ඩු මෙන්ම වාමාංශික පක්ෂද, එක්සත් ජනපදය ද, එක්සත් ජාතීන්ගේ සංවිධානයද, මේ පිළිබඳව විවිධ අයුරින් ප්‍රතිචාර දක්වා තිබේ. මේ අතර ඇතැම් ප්‍රතිචාරයන් ජාතිවාදී ප්‍රවේශයන් වන අතර සමහර ප්‍රතිචාරයන් අධිරාජවාදී අත පෙවීම්වලට ආරාධනා කෙරෙන ප්‍රතිචාරයන්ද වී තිබේ.



රෝහින්ග්‍යවරුන්ගේ ප්‍රශ්නය පසුගිය වසර දෙක තුළදී යළිත් වරක් උත්සන්න වුවද මෙම ප්‍රශ්නයට දශක ගණනාවක ඉතිහාසයක් ඇත.

සංඛ්‍යාවෙන් මිලියන 1 - 1.3 ක් පමණ වූ රෝහින්ගාවරුන් බහුලව ජීවත් වන්නේ, වයඹ දිග මියන්මායේ රක්හීන් පළාතේය. රක්හීන් පළාත උතුරින් බංගලිදේශයටත් ඉන්දියාවටත් මායිම් වන අතර බටහිරින් ඉන්දියන් සාගරයෙන් මායිම් වී ඇත. මෙම පළාතේ බහුතර ජනතාව බෞද්ධාගමික මියන්මාර් වැසියන්ය. රෝහින්ග්‍යාවරුන් සුළුතරයයි. රෝහින්ග්‍යා භාෂාව කථා කරන රෝහින්ග්‍යාවරුන්ගෙන් බහුතරය ඉස්ලාම් භක්තිකයන්ය. සුළු පිරිසක් හින්දු භක්තිකයන්ය. දශක ගණනාවක් පුරා මියන්මාරයේ ජීවත් වුවද, මියන්මාරය ඔවුන් සිය පුරවැසියන් ලෙස නොසලකයි. මියන්මාර පාලකයෝ රෝහින්ග්‍යවරුන් බංගලිදේශයෙන් පැමිණි නීති විරෝධී සංක්‍රමණිකයන් ලෙස හඳුන්වති. බංගලිදේශය හා ඉන්දියාව ඔවුන් තම රට වල පුරවැසියන් ලෙස නොපිළිගනී. මේ නිසා ඔවුහු කිසිදු රටක පුරවැසිභාවය නොලබා ජීවත්වන ජන කොටසක් බවට පත්වී සිටිති. එතැනින් නොනැවතී ඔවුන්ට මියන්මාරයේ බෞද්ධාගමික ජාතිවාදීන්ගේ නිරන්තර පීඩනයට හා ප්‍රහාරයට ලක්වී ජීවත් වීමට සිදු වී තිබේ.

දෙවන ලෝක යුද්ධසමයේදී එවකට බුරුමය ලෙස හැඳින්වූ මියන්මාරයේ බෞද්ධ පාලනය ජපානයට සහය පළ කළද රෝහින්ග්‍යා ජනතාව බ්‍රිතාන්‍යයට සහය පළකර තිබුණේ ඔවුන්ට වෙනම රාජ්‍යයක් ලබාදීමේ පොරොන්දුව පිටය. යුද්ධයෙන් පසු එය ලබානොදුන් අතර නැගෙනහිර පාකිස්ථානයට තමන් සම්බන්ධකර ගන්නා ලෙස ඔවුන් කළ ඉල්ලීමද අලි ජින්නා ප්‍රතික්ෂේප කළේය. 1948 සිට 1961 පමණ වනතුරු රෝහින්ග්‍යා මුජාහිදීන්වරු වෙනම රාජ්‍යයක් උදෙසා සටන් වැදුණහ. ඔවුන්ගේ අරමුණ වූයේ මියන්මාරයෙන් වෙන්වී නැගෙනහිර පකිස්ථානය සමග එක්වීමයි. මියන්මාර රජයේ හමුදා මෙහෙයුම් හමුවේ පරාජයවූ ඔවුහු රජයට අවි භාරදී සිය සටන අත්හැරියෝය. පසුව 1972 දී මුජාහිදීන්වරුන්ගේ නායකයෙකුගේ ප්‍රධානත්වයෙන් රෝහින්ග්‍යා විමුක්ති පක්ෂය ගොඩනගනු ලැබුණි. මේ සංවිධානයද විසුරුවා හැරීමට සිදුවූ අතර 1974දී එහි නායකයෙකුගේ ප්‍රධානත්වයෙන් රෝහින්ග්‍යා දේශප්‍රේමී පෙරමුණ පිහිටුවනු ලැබිණි. 1978දී මියන්මාර පාලනය එකී අරගලයට එරෙහිව ක්‍රියාත්මක කළ යුදමය මෙහෙයුමත් සමග මේ ආකාරයෙන්ම සරණාගත ප්‍රශ්නයක් උද්ගත විය. රෝහින්ග්‍යා දේශප්‍රේමී පෙරමුණෙන් කැඩී ගිය කොටසක් විසින් රෝහින්ග්‍යා සහයෝගීතා සංවිධානය පිහිටුනු ලැබුවේ 1982 දීය. පසුව 1998 දී අරකාන් රෝහින්ග්‍යා ඉස්ලාම් පෙරමුණ හා රෝහින්ග්‍යා සහයෝගීතා සංවිධානය එක්ව අරකාන් රෝහින්ග්‍යා ජාතික සංවිධානය ගොඩනගනු ලැබීය. ඒ යටතේ පිහිටවූ රෝහින්ග්‍යා ජාතික හමුදාව මේ වන විට රෝහින්ග්‍යාවරුන්ට වෙනම රාජ්‍යයක් දිනා ගැනීම සඳහා සටන් වැද සිටියි. ලොව පුරා විහිදුණු මුස්ලිම් අන්තවාදී සංවිධාන මෙම සටන සඳහා විවිධාකාරයෙන් සහය ලබාදෙමින් තිබේ.

රෝහින්ග්‍යාවරුන්ගේ ගැටලුව මේ මොහොතේදී ජාත්‍යන්තර වශයෙන් විශාල අවධානයක් දිනාගෙන තිබෙන්නේ එය හුදෙක් මියන්මාර් පාලනයේ හෝ රෝහින්ග්‍යාවරුන් අතර ප්‍රශ්නයක් නොවී ඉන් ඔබ්බටද වර්ධනය වී ඇති නිසාය. එය බංගලිදේශය හා ඉන්දියාව වැනි රටවල සරණාගත ප්‍රශ්නයක් බවට පත්වී ඇත. එතැනින් නොනැවතී එය ලෝක ආර්ථික හා දේශපාලන බලවතුන්ගේ වුවමනාවන් ගැටෙන තැනක් බවටද පත් වී තිබේ.

රක්හින් පළාත චීනය ගොඩනගන නව සේද මාවතේ මර්මස්ථානයකි. රක්හින් පළාතේ ක්‍යූපියු ප්‍රදේශය මෙහිදී විශේෂ වැදගත්කමක් දරයි. ක්‍යූපියු වරායේ සිට චීනයේ කුන්මින් දක්වා ගොඩනගා ඇති කි.මී. 2806ක් දිගැති ගෑස් නල මාර්ගය චීනයට විශේෂයෙන් වැදගත් වේ. එමගින් මලක්කා සමුද්‍ර සන්ධිය මගහරිමින් මැදපෙරදිග ස්වාභාවික වායු හා බනිජතෙල් චීනය වෙත ගෙන යා හැකි බැවිනි. ඊට අමතරව චීනයේ මූලිකත්වයෙන් රටවල් හයක සමාගම් එක්වී ගොඩනගා ගත් සංගතයක් ක්‍යූපියු වරාය සංවර්ධනය කරමින් සිටියි. තවද ඒ මගින් මෙම ප්‍රදේශය විශේෂ ආර්ථික මධ්‍යස්ථානයක් ලෙසද, ගොඩගනගමින් සිටියි. මේ නිසා රෝහින්ග්‍යා ප්‍රශ්නය චීනයට මගහැර යා නොහැකි ගැටලුවකි.

යුරෝපය හා එක්සත් ජනපදය මෙම ගැටලුව 'මානුෂීය අර්බුදයක්' (Humanitarian Crisis) ලෙස හඳුන්වා දී ඇත. එහි අනෙක් අර්ථය වන්නේ, මෙම ගැටලුව කිසියම් රටක ස්වාධීනත්වය නොසලකා ජාත්‍යන්තර වශයෙන් මැදිහත්විය යුතු තත්වයක් දක්වා වර්ධනය වී ඇති බවය.

එක් පසෙකින් රෝහින්ග්‍යා වැසියන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රශ්නයක් වන මෙය අනෙක් අතින් රෝහින්ග්‍යාවරුන් හා බෞද්ධ අන්තවාදීන් අතර ගැටුමක් ද වී තිබේ. එහෙත් ඒ අතරම එතැනින් නොනැවතී එක් එක් රටවල හා ලෝක ආර්ථික හා දේශපාලන බලවතුන්ගේ උවමනාවන් අතර ගැටුම් ඇති කෙරෙන තැනක් බවට ද මෙය පත් වී ඇත. එබැවින් මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් උනන්දුව දක්වන හා ප්‍රතිචාර දක්වන පාර්ශවයන් එය සිදුකරමින් සිටින්නේ ප්‍රශ්නය තමන්ට බලපාන ආකාරයට අනුව බව පෙනෙන්නට තිබේ.

වර්ධනය වන තත්වය පිළිබඳ මත පළකරන දේශපාලන විචාරකයින් සමහර දෙනෙක් රෝහින්ග්‍යා ගැටලුව ආසියානු කලාපයේ යුගෝස්ලෝවියාව බවට පත්විය හැකියයි අනතුරු අඟවා තිබේ. ඔවුන් පවසන අකාරයට එක්සත් ජනපදයත් යුරෝපයත් මෙම ගැටලුව මානුෂීය අර්බුදයක් ලෙස විග්‍රහ කරමින් අවශ්‍ය තත්වයන් සකසා ගන්නේ ජාත්‍යන්තර යුදමය මැදිහත් වීමක් සඳහාය. අවසානයේ රක්හින් පළාත කොසෝවෝ මෙන්ම එක්සත් ජනපද මර්මස්ථානයක් බවට පත්කර ගැනීව සඳහාය.

චීනයේ අදහස වී ඇත්තේ මෙම ප්‍රශ්නය මියන්මාරය විසින් විසඳාගත යුතු ගැටලුවක් බවයි. ඒ අතරම එය සාකච්ඡාවෙන් හා සම්මුතියෙන් විසඳාගත යුතු ප්‍රශ්නයක් බවද ඔවුහු පවසති. ඒ අතරම මේ නිසා මේ ප්‍රශ්නය යුගෝස්ලෝවියාවේ මතුවූ තත්වය දක්වා වර්ධනය නොවනු ඇතැයි බොහෝ දෙනෙකු අපේක්ෂා කරයි.

රෝහින්ග්‍යාවරුන්ගේ ප්‍රශ්නය බැලූ බැල්මට පෙනෙන හුදු අයිතිවාසිකම් පිළිබඳ එහෙත් නැත්නම් හුදු ජාතික ගැටලුවට වඩා වැඩි යමක් බවට මේ වන විටත් වර්ධනය වී ඇති බව පෙනේ. මේ නිසා මෙම ගැටලුවට විසඳුම් සෙවීමේදී එක් පසෙකින් රෝහින්ග්‍යාවරුන්ගේ අයිතින් ආරක්ෂා වන අතරම අනෙක් පසින් අධිරාජ්‍යවාදයට මෙම ප්‍රශ්නය දඩමීමා කර ගනිමින් සිය ආර්ථික, දේශපාලන හා යුදමය වුවමනාවන් ඉටුකර ගැනීමට ඉඩනොදෙන්නාවූ එකක් විය යුතුය.

## චීනය: කොමියුනිස්ට් පක්ෂයේ 19වැනි සමුළුවට සූදානම් වෙමින්




චීන කොමියුනිස්ට් පක්ෂයේ 19 වන සමුළුව ඔක්තෝබර් 18 වන දින ආරම්භ වීමට නියමිතය. එහිදී නව මධ්‍යම කාරක සභාවක්, විනය පරීක්ෂණය සඳහා නව මධ්‍යම මණ්ඩලයක් පත්කර ගැනීමට නියමිතය.

මේ වන විට මිලියන 88ක් වන කොමියුනිස්ට් පක්ෂ සාමාජිකත්වය නියෝජනය සඳහා පක්ෂ නියෝජිතයින් 2300ක් පමණ තෝරා අවසන් කර තිබේ.

මෙම සමුළුවේදී 2012 වසරේ සිට මේ දක්වා සිදුකෙරුණ වැඩ කොටස සමාලෝචනය කිරීමටද නියමිතය.

## කියුබාව: ආරක්ෂක සමුළුවට ප්‍රජාතන්ත්‍රවාදය ඉල්ලා



එකත්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ විනිවිදභාවයෙන් තොරවීම කියුබාව පසුගිය අගෝස්තු 28 වන දා විවෙචනයට ලක් කළේය. එහිදී කියුබාව වඩා වැඩි විනිවිදභාවයකින් යුතු හා ප්‍රමාණාත්මකව වැඩි සහභාගිත්වයකින් යුතු ආරක්ෂක මණ්ඩලයක් යෝජනා කළේය. තවද ආරක්ෂක මණ්ඩලයේ වැඩකරන විලාසයේ ඉක්මන් වෙනසක් සිදුකළ යුතු බවට එය යෝජනා කළාය. ඒ අනුව,

i. රහස් සාකච්ඡා නැවැත්විය යුතු බවටත්,
ii. ප්‍රජාතන්ත්‍ර විරෝධී නිෂේධ බලය අවසන් කළ යුතු බවටත්,
iii. ස්ථාවර හා ස්ථාවර නොවන සාමාජිකත්වය යන බෙදීම අවසන් කළ යුතු බවටත්,
iv. වසර 70 ක් පුරා අනුගමනය කරන ක්‍රියා පිළිවෙත වෙනස් කළ යුතු බවටත් කියුබාව යෝජනා කර සිටියාය.

පසුගිය වසර පිළිබඳව ඉදිරිපත් කළ වාර්තාව විවේචනයට ලක්කළ කියුබාව එය හුදෙක් රැස්වීම් හා තීරණ පිළිබඳ සඳහන් හුදු ලියවිල්ලක් පමණක් බවත් අවශ්‍ය වන්නේ, ගැඹුරින් අධ්‍යයනය කළ විශ්ලේෂණයක් බවත් කියා සිටියාය.

## ඉරානය: සම්බාධක මැද මිතුරන් සොයමින්




චීනය එක්සත් ජනපද ඩොලර් බිලියන 10 ක මුදලක් ඉරානයට ලබාදීමට තීරණය කර තිබේ. පොදු යටිතල පහසුකම් සහ බලශක්ති, ප්‍රවාහන ක්ෂේත්‍රවල යටිතල පහසුකම් ගොඩනැගීම සඳහා ලබාදෙන මෙම ආධාර මුදල ලබාදෙන්නේ යූරෝවලිනි. මීට පෙරද ලබාදුන් මුදලත් සමග චීනය ඉරානයට ලබාදෙන මුළු මුදල එක්සත් ජනපද ඩොලර් බිලියන 15කි.

ඉරානයෙන් වැඩිම තෙල් ප්‍රමාණයක් අපනයනය කරනු ලබන්නේ, චීනයට වන අතර ඉරාන ආනයනයන්ගෙන් 1/3 ක් සිදුකරන්නේ චීනයෙනි. මේ අතර සම්බාධක නොතකා ඉරානය සමග ගනුදෙනු කිරීමට ඕස්ට්‍රියාව, ඩෙන්මාර්කය හා ජර්මනිය සාකච්ඡා කරමින් සිටින බවද වාර්තා වේ.

## ජර්මනිය: චාන්සලර්වරිය සිව්වැනි වතාවටත් ජය ලබා



සැප්තැම්බර් 24වැනි දින පැවැති ජර්මන් මහ මැතිවරණයෙන් ඇන්ජෙලා මාකෙල්ගේ මැතිවරණ සන්ධානය හතරවන වතාවටත් ජය තහවුරු කර ගෙන තිබේ. ඇයගේ නායකත්වයෙන් යුතු මැතිවරණ සන්ධානය 32.0%ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් පාර්ලිමේන්තුව තුළ ආසන 200ක් දිනා ගත්තේය. මෙවර එය ලබා ගෙන ඇත්තේ ගියවර ලබාගත්තාට වඩා ආසන 55ක් අඩුවෙනි.

දෙවන ස්ථානයට පත් වූයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයයි. එය ඡන්ද 20.5%ක ප්‍රතිශතයක් ලබා ගනිමින් ආසන 153ක් දිනා ගත්තේය. එය ගියවරට වඩා ආසන 40ක අඩුවකි.

තෙවන ස්ථානයට පත්වූයේ 'ජර්මනිය සඳහා විකල්පය' පක්ෂයයි. එය අසන 94 ක් දිනාගත්තේ 12.6%ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගනිමිනි. දක්ෂිණාංශික, ජාතිකවාදී, සංක්‍රමණ විරෝධී හා යුරෝපා සංගම් විරෝධී පක්ෂයක් වන එය පළමු වරට පාර්ලිමේන්තුව නියෝජනයක් ලබා ගත්තේ මෙම මැතිවරණයේදීය.

# ආර්ථිකය ගිලාබස්සන එයාර් බස් ගනුදෙනු

'එයාර් ලංකා' ගුවන් සේවය රජයේ ගුවන් සේවයයි. වෙනත් රටවල් මෙය රජය මෙන්ම පෞද්ගලික හිමිකරුවන් මඟින්ද ගුවන් සේවාවක් පවත්වා ගෙන යාමක් ශ්‍රී ලංකාවේ නොමැත.

### එයාර් ලංකා ඉතිහාසය:

1978 දී එවකට පැවැති 'එයාර් සිලෝන්' වසාදමා 1979 දී නව විවෘත ආර්ථික ප්‍රතිපත්තියට ගැලපෙන ලෙස 'එයාර් ලංකා' ස්ථාපිත කරන ලදී. 1998දී චන්ද්‍රිකා කුමාරතුංග රජයේ විකිණීමේ ප්‍රතිපත්තිය යටතේ ඩුබායි මූලික කරගත් එමිරේට්ස් සමූහ ව්‍යාපාරය වෙත පෞද්ගලීකරණය කරන ලදී. එම ගිවිසුම අනුව 'එයාර් ලංකා' නාමය 'සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගම' ලෙස වෙනස් කරන ලදී. යළිත් 2008 මාර්තු 31 දින ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ එමිරේට්ස් කොන්ත්‍රාත් කාලය අවසන් වූ පසු එතෙක් එමිරේට්ස් සමාගම හිමිකරගෙන තිබූ කොටස් අයිතිය යළි ශ්‍රී ලංකා රජයට මිලදී ගැනීමෙන් ශ්‍රී ලංකන් ගුවන් සමාගම 99.11%ක් (ඉතිරිය සේවක අර්ථසාධක අරමුදල 0.36 හා වෙනත් (සේවක කොටස් හිමියන්) 0.53%ක්) අයිතිය රජය සතු සමාගමක් බවට පත් කරන ලදී.

### ශ්‍රී ලංකන් වර්තමානය

'එයාර් ලංකා' ඉතිහාසය ගෙන හැර දක්වන ලද්දේ 2008න් පසු ගතවූ වසර 9ක කාලය තුළ ශ්‍රී ලංකන් ගුවන් සේවය ලෙස පවතින රජයේ ඒකාධිකාරී අයිතිය ඇති එකම ගුවන් සේවය මේ වන විට කෙතරම් විනාශයක් රටට සහ ජනතාවට සිදුකර ඇත්දැයි තේරුම් ගැනීම පහසු කිරීම සඳහාය.

2007/2008 ගිණුම් පරීක්ෂණ සඳහා පිළියෙල කළ ලේඛන අනුව, එමිරේට්ස් සමාගම විසින් ශ්‍රී ලංකා රජයට ගුවන් සේවය ආපසු පවරන විට රුපියල් මිලියන 4428ක් (කෝටි 442.8ක්) ශුද්ධ ලාභ ලැබූ ආයතනයක් විය. වසරක් තුළදී පමණක් එහෙම 2008/2009 වසරේදී එම ලාභය රුපියල් මිලියන 9306ක ශුද්ධ අලාභයක් බවට පත් කිරීමට එවකට සිටි රාජපක්ෂ පාලනයේ දේශපාලන හෙංචයියෝ සමත් වූහ. එම වසරේදී මෙහෙයුම් අලාභය පමණක් රුපියල් මිලියන 11487ක් විය. මිලියන 4400ක් ලාභ ලැබූ ආයතනයක් එම ලාභය දෙගුණයකින් අලාභයක් කරනු ලැබුවේ කෙසේද? කවුරුන්ද? ගතවූ වසර 09ක් තුළ එකදු වසරකදීවත් ලාභ ලැබීමේ මොහොතක් නොඑළඹි එයාර් ලංකා (ශ්‍රී ලංකන් ගුවන් සේවය) මෙම වසර 9 තුළ ලැබූ සමස්ත අලාභයේ එකතුව පමණක් රුපියල් මිලියන 169,755ක් (රුපියල් කෝටි 16,975ක්) විය. 2016/2017 වසරේදී පමණක් මෙම ශුද්ධ අලාභය රුපියල් මිලියන 28,930ක් (කෝටි 2893ක්) විය.

### අලාභය ජනතාව කර මත තැබීම

මෙම අඛණ්ඩ අලාභය දරා ඇත්තේ, ශ්‍රී ලංකන් ගුවන් සමාගම ඔවුන් උපයන ආදායම කාබාසිනියා කරනවාට අමතර, ගුවන් සේවාවක් පවත්වා ගෙන යාම අවශ්‍යතාවය වෙනුවෙන් 2011 සිට 2014 දක්වා රුපියල් මිලියන 46,470ක් (රුපියල් කෝටි 4647ක්) භාණ්ඩාගාරය මඟින්ද ලබාදීමෙනි. එසේ 2015 සිට 2017 මාර්තු 31 වන විට භාණ්ඩාගාරයේ ඇප මත ලංකා බැංකුව සහ මහජන බැංකුව වරින් වර ඩොලර් මිලියන 400ක් ණය ලබාදී ඇත. එය ආසන්න වශයෙන් තවත් රුපියල් මිලියන 60,000කි. ඒ සියල්ලම රටේ ජනතාවගේ මුදල්ය. උදාහරණ ලෙස ලංකා බැංකුව සහ මහජන බැංකුව ගුවන් සේවාවට ලබාදුන් රුපියල් මිලියන 60,000ක ණය රුපියල් ලක්ෂ 10 බැගින් ලංකාවේ කුඩා ව්‍යාපාරිකයන් 60,000කට ණය ලබාදීමට හැකි මුදලකි. අවසානයේ විශාල අලාභයකට කර ගැසීමට සිදුව ඇත්තේ සාමාන්‍ය ජනතාවටය. එම අලාභයේ අර්බුදය කොතරම්ද යන්න ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ මූල්‍ය තත්වය නිරීක්ෂණයෙන් තවත් පැහැදිලි වේ.

### ගුවන්ගත මූල්‍ය තත්වය

2009/10 වසරේදී ජංගම වත්කම්වලට වඩා ජංගම වගකීම වැඩිවීමේ හිඟය රුපියල් මිලියන 12,489ක් විය. එසේම එදිනට ශුද්ධ වත්කම් ප්‍රමාණය පැවැතියේ සෘණ රුපියල් මිලියන 3589ක් වශයෙනි. එමිරේට්ස් සමාගමෙන් ශ්‍රී ලංකා රජයට පවරාගෙන වසරක් තුළ ගුවන් සමාගම වත්කම් සෘණ කර, සෘණ මට්ටමෙන් බැස්සීමට රාජපක්ෂ ඥාති සමාගම සමත් විය. ඉන්පසු රාජපක්ෂ හා වික්‍රමසිංහ දෙපාර්ශවයේම පාලනය තුළ එම තත්ත්වය වර්ධනය වී ඇත්තේ කෙසේද? 2015/2016 වසරේදී ජංගම වත්කම හා වගකීම අතර පරතරය සෘණ රුපියල් මිලියන 73.434ක් විය. එම වසර වන විට ශුද්ධ වත්කම සෘණ මිලියන 87,781ක් විය. එම අගය 2016/17 වන විට ශුද්ධ වත්කම සෘණ 115,074ක් දක්වා ඉහළ ගියේය.

රනිල් වික්‍රමසිංහගේ එ.ජා.ප. පාලනයේ වසරකදී පමණක් ශ්‍රී ලංකන් ගුවන් සමාගම වත්කම සෘණ තත්වයට පත් කිරීමේ වෙනස පමණක් රුපියල් මිලියන 27,293කි. (රුපියල් කෝටි 2729කි) රාජ්‍ය බැංකු දෙකෙන් රුපියල් කෝටි 6000ක් පොම්ප කර තිබියදීත්, භාණ්ඩාගාරය ඇති තරම් ණය මුදල් ලබාදී තිබියදීත්, වසරකට ආයතනයක් රුපියල් කෝටි 2729ක් පාඩු කළ හැක්කේ කාටද? කෙලෙසද? ආසන්න වශයෙන් මාසයකට රුපියල් කෝටි 228ක් වත් පාඩු කරනු ලැබ ඇත. එසේ පාඩුකර ඇත්තේ ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන්ම මාසයකට වැටුප රුපියල් දශලක්ෂයකට වඩා ලබන නිලධාරින් 190ක් විසිනි. එයිනුත් 4 දෙනෙක් මාසයකට ලක්ෂ 40කට වඩා වැඩි වැටුප් ලබන්නන්ය.

### දූෂිත එයාර් බස් ගනුදෙනුව

ඉහතින් දක්වන සියලු මූල්‍ය දත්ත අනුව ශ්‍රී ලංකන් ගුවන් සමාගම එමිරේට්ස් සමාගමෙන් රජයට යළි භාරගත් වසරේ සිටම පාඩු ලබා ඇත. වත්කම සෘණ මට්ටමට පත්වෙමින් පැවැතී ඇත. එසේ තිබියදී මහින්ද රාජපක්ෂ මස්සිනා වූ නිශාන්ත වික්‍රමසිංහ සභාපතිත්වය යටතේ 2013 දී එක් ගුවන් යානාවකට වසරකට ඩොලර් මිලියන 1.45ක් කල්බදු පදනමට ගෙවීමේ කොන්දේසිය යටතේ A 350-900 ගුවන් යානා 4ක් මුලින් ලබාගැනීමටත් පසුව 2017 වසරේදී තවත් 3ක් ලබා ගැනීමටත් තීරණය කර ඇත. ඒ සඳහා ගෙවීමට නියමිත වූ මුළු මුදල ඩොලර් මිලියන 835.2ක් විය.

පාඩු ලබමින් තිබෙන, රජයේ භාණ්ඩාගාරය හා රජයේ බැංකු අහිංසක ජනතාවගේ මුදල් එදිනෙදා පොම්ප කරමින් නඩත්තු කරන ගුවන් සමාගම ඩොලර් මිලියන 835.2ක් ගෙවීමට මුදල් සොයා ගත්තේ කෙසේද? ඒ සඳහා නිර්දේශ කරන්නේ කවුරුන්ද? අඩුතරමේ මෙම ගනුදෙනුව කැබිනට් මණ්ඩලය හෝ අනුමත කර ඇත්ද? ඒ කිසිවක් නොමැත. එයාර් ලංකා ලොක්කන්ම සොයා ගත් සීබර් නම් සමාගමකට ඩොලර් 612,000ක් ගෙවා ඔවුන් සකස් කළ ඉදිරිපත් කිරීමක් (Power Point presentation) මගින් මිලදී ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ විට මහින්ද රාජපක්ෂ ජනාධිපති ලෙසත් මුදල් ඇමති ලෙසත් නිර්දේශ කර ඇත්තේ, "ශ්‍රී ලංකන් ගුවන් සමාගම, පනත යටතේ පිහිටුවන ලද පොදු සමාගමක් බැවින් එම ගුවන් යානා ලබාගැනීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් නිසා කැබිනට් මණ්ඩලයේ අනුමැතියක් අනවශ්‍ය බවයි. 2013 අප්‍රේල් 16 පැවැති විශේෂ සාකච්ඡාවකදී එවකට මුදල් අමාත්‍යාංශයේ ලේකම් පී.බී. ජයසුන්දර ද ඒ අදහසම සනාථ කර ඇත. ඒ නිසා කලින් රාජපක්ෂ පාලනයේදී ඩොලර් මිලියන 835ක ගනුදෙනුවක් සිදුකර ඇත්තේ අඩුතරමේ කැබිනට් අනුමැතියක් පවා නොමැතිවය.





### පැටව් ගහන පාඩුව

රාජපක්ෂ සහ ඥාති සමාගම ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ගුවන් යානා මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කළේ අඩුතරමේ කැබිනට් අනුමැතියක් පවා නොමැතිවය. ඉන්පසු 2015 දී බලයට පත් යහපාලනය තීරණය කළේ මෙම ගුවන් යානා මිලදී ගැනීම නතර කිරීමටය. නමුත් ඒ වනවිට ලංකාව වෙනුවෙන් (Aircup) එයාර් කප් සමාගම ගුවන් යානා 4ක් නිෂ්පාදනය කිරීම ආරම්භ කර තිබුණි. 2017 දී එම ගුවන් යානා ලංකාවට භාරදීමට නියමිත විය. එයින් 2017 නොවැම්බර් භාරදීමට නියමිත ගුවන් යානාවක් සඳහා ලංකාවට භාර නොදීමට, මිලදී ගැනීමේ ගිවිසුම අවලංගු කිරීමට ඩොලර් මිලියන 17.7ක් වන්දි ගාස්තුවක් ගෙවීමට සිදුවිය. ඉතිරි නිෂ්පාදනය කරමින් පැවැති යානා 3ක ගිවිසුම් අවලංගු කිරීමට ඩොලර් මිලියන 75-85 අතර ගාස්තුවක් ගෙවීමට සාකච්ඡා කරන ලෙස ආර්ථික කළමනාකරණ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව ගුවන් සමාගමට පැවරීය. එම සාකච්ඡා සඳහා ගුවන් සමාගම භාර රාජ්‍ය ව්‍යාවසාය අමාත්‍යාංශයේ ලේකම්වරයාද සහභාගි කරවා ගත යුතු වුවත් සාකච්ඡා සිදුකළේ සම්පූර්ණ වශයෙන්ම රහසිගතවය. එම රහසිගත සාකච්ඡාවල ප්‍රතිඵලය වූයේ ඉතිරි ගුවන් යානා 3 සඳහා ගිවිසුම අහෝසි කිරීමට නම් තවත් කොන්දේසි සහිතව ඩොලර් මිලියන 98ක් ගෙවීමට තින්දු වීමය. ඒ අනුව ගුවන් යානා 4 සඳහා ගෙවීමට සිදුවන පාඩුව ඩොලර් මිලියන 115.7කි. (ආසන්න රුපියල් 150×115.7 = මිලියන 17,355කි) ගුවන් යානාවක් නොදැකම ගුවන් යානා 4ක් මිලදී ගැනීමට ගොස් පාඩු ලෙස වන්දි ගෙවීමට ශ්‍රී ලංකාවේ ජනතාවට සිදුවී ඇත.

අපූරු තීරණ සඳහා වගකිවයුත්තෙක් නැත. එම වන්දිය ගෙවීමට සිදුවී ඇත්තේ ද අදාළ සමාගම විසින් පැනවූ තවත් කොන්දේසි රැසකට යටත්වය. ඒ අනුව, දැනට එයාර් කප් සමාගමෙන් ලබාගෙන ඇති 330-200 ගුවන් යානා 2කක් බදු කාලය තවත් වසර 10ක් දික් කිරීම, මිහින් ලංකා සමාගමට බදුදී ඇති යානා 2ක් එයාර් ලංකා වෙත ලබාගැනීම ආදී වශයෙනි. ගැමි වහරේ ඇති "අතින් කාලා හරක් බලනවා"ටත් එහා යන තරමේ තකතීරු දේශපාලන තීරණවලින් රටේ ජනතාවට පාඩු කර ඇත්තේ එලෙසය. එසේම, 2020දී ලංකාවට භාරදීමට නියමිත තවත් ගුවන් යානා 4ක් සැප්තැම්බර් මාසයෙන් පසුව යළිත් නිෂ්පාදනයටද නියමිතය. එම ගුවන් යානාද මිලදී නොගෙන ගිවිසුම මගින් ඉවත් වන්නේ නම් තවත් මෙවැනිම හෝ ඊට වැඩි වන්දියක් ගෙවීමට ශ්‍රී ලංකා රජයට සිදුවනු ඇත.

මෑත ඉතිහාසයේ අප අත්දුටු දූෂිතම ගනුදෙනුව යහපාලනය යටතේ සිදුකළ බැඳුම්කර ගනුදෙනුව වුවද ඊට නොදෙවැනිම මහා දැවැන්ත පාඩුවක් සිදුකළ හා අදටත් සිදුවෙමින් පවතින ගනුදෙනුවකි. එපමණක් ද නොවේ. රටේ ජනතාවට මහා දැවැන්ත බරක් බවට පත්කර ඇති නමුත් එසේ විනාශ කිරීමට පාලකයන් නිල්, කොළ භේදයෙන් තොරව වගකිව යුතු ආයතනයකි එයාර් ලංකා. එයාර් ලංකා ආයතනයකට සිදුකර ඇති විනාශය දූෂිත දේශපාලනයේ මනා කැඩපතකි.

> රහසිගත සාකච්ඡාවල ප්‍රතිඵලය වූයේ ඉතිරි ගුවන් යානා 3 සඳහා ගිවිසුම අහෝසි කිරීමට නම් තවත් කොන්දේසි සහිතව ඩොලර් මිලියන 98ක් ගෙවීමට තින්දු වීමය. ඒ අනුව ගුවන් යානා 4 සඳහා ගෙවීමට සිදුවන පාඩුව ඩොලර් මිලියන 115.7කි. (ආසන්න රුපියල් 150×115.7 = මිලියන 17,355කි) ගුවන් යානාවක් නොදැකම ගුවන් යානා 4ක් මිලදී ගැනීමට ගොස් පාඩු ලෙස වන්දි ගෙවීමට ශ්‍රී ලංකාවේ ජනතාවට සිදුවී ඇත.



"ජනතාව සංවිධානය කිරීම අපගේ කර්තව්‍යයක්. චීනයේ ප්‍රතිගාමීන් සම්බන්ධයෙන්, ඔවුන් පරාජය කරන්නට ජනතාව සංවිධානය කිරීම අපට අයිති වැඩකි. ප්‍රතිගාමී සියලුම දේ ප්‍රතිගාමීය. අප එයට පහර නොදෙන්නේ නම් එය පරාජය වන්නේ නැත. සිරිතක් වශයෙන්, කොස්ස නොවදින තැන කුණු දූවිලි ඉවත් නොවන්නා සේය."

**මාඕ සේ තුං**
**තෝරාගත් කෘති,**
**4වැනි කාණ්ඩය,**
**19 පිටුව**



# සාරි පොටක එල්ලූ ළමා පරපුර...

රැක්කද කනගාටුවට කරුණ වන්නේ ඇතැම් දෙමාපියන්ද මෙවැනි ක්‍රියා සාධාරණය කිරීම සඳහා හඬ නැගීමය. දේශපාලකයන්ගේ, බලධාරීන්ගේ උවමනාවන් වෙනුවෙන් 'අපේ දරුවන් කෙසේ පාවිච්චි කළද අපට කම් නැතැයි' යනුවෙන් සිතන, හා ඒ වෙනුවෙන් දේශපාලකයන්ගේ පැත්තේ සිටගන්නා දෙමව්පියන්-ගෙන්ද අඩුවක් නොමැති බව පෙනේ.

එසේම අපේ රට ඇතුළු ආසියාතික රටවල ආර්ථික අපහසුතාවලින් පෙළෙන ජනතාවට කුමක් හෝ ලබාදී ඡන්දය ලබා ගැනීමට හෝ යමක් ලබාදෙන පුද්ගලයාගේ පැත්තට නම්මවා ගැනීමට කටයුතු කිරිම සම්බන්ධයෙන්ද පවතින්නේ දිගු ඉතිහාසයකි. ඊට වඩාත් ප්‍රබලව ඉලක්ක වන්නේ ස්ත්‍රීන්ය. මෑත කාලීනව නැවත කරළියට ආ 'සිල් රෙදි' කතාව තුළින්ද, පසුගිය සැප්තැම්බර් මාසයේ ඉන්දියාවේ තෙළඟානා පළාතේ මහ ඇමතිවරයා විසින් හින්දු කාන්තාවන් සමරන උත්සවයකදී සාරි බෙදා දීමේ කතාව තුළින්ද මෙය මනාව පැහැදිලි වේ. ඉන්දියාවේ තෙළඟානා පළාතේ ස්ත්‍රීන්ට බෙදා දුන් කෝටි 1.04කට ආසන්න සාරි ප්‍රමාණය ඉතා බාල වර්ගයේ සාරි බැවින් එයට විරෝධය පා ඔවුන් ඒවා වීදිවලට ගෙනවිත් පුළුස්සා දැමූ බවද වාර්තා විය. සැබැවින්ම දරිද්‍රතාවයෙන් පෙළෙන වටපිටාවක ස්ත්‍රීන්ගේ එම විරෝධය අගය කළ යුතුව තිබේ.

මේ සියලු සිදුවීම් පසුපස සැඟව ඇති යථාර්ථය අප තේරුම් ගන්නේ කවදාද? ස්ත්‍රීන් වන අප විසින් මැතිවරණයක් ආසන්නයේදී ලබාදෙන කුමන හෝ අල්ලසක්, ප්‍රතිලාභයක් හමුවේ මංමුලාවට පත් නොවී පුද්ගලික ලාභය ගැන පමණක් නොසිතා ප්‍රගතිගාමී ලෙස රටේ පොදු යහපත ගැන සිතන්නට පුරුදු විය යුතු නොවේද? එලෙස සිතන්නට පුරුදු වනවිට, වඩා වැදගත් වන්නේ 'දිගම සාරි පොට' ඇල්ලීමට පාසල් ළමුන් යොදා ගිනස් වාර්තා පොතට එක්වනවාට වඩා පාසල් ළමුන් අතර වර්ධනය වන මන්දපෝෂණ තත්වය තුරන් කිරීම සඳහා, නිරෝගී දරු පරපුරක් බිහි කිරීම සඳහා, අධ්‍යාපනය උසස් තලයකට ගෙනඒම සඳහා බලධාරීන්ගේ ඇස් ඇරවීම වගේම ළමුන්ට වඩා හොඳ ලෝකයක් හදා දීමට අවබෝධයෙන් කටයුතු කිරීමත් බව අපට වැටහෙනු ඇත.

## එක මල් දමක් ගොතමු

මඩ දිය පිරී ඇති කල්
නොදුටුව නමුත් හැමකල්
කොඳ මල් පිපුණු විල්
පිනවති දනන් මනකල්

අතැති කළඹක මල්
සිඹිති සනහති සැමකල්
කාණු ගැට්ටක පුල්
තණ මලක් පරවෙලා බෝ කල්

බිම වැටුණු මේ මල්
පයට පෑගෙන කල්
නොදුටු සේ සිටි විසල්
දෑස්, විවරව ඇතේ මේ කල්

එක් දිනෙක සොයලා
කැකුළු මල් වට්ටියට නෙළලා
පුදසුනක තබලා
තැලුණු පරවුණු මල් ඉවතලා

නෙක නෙක මල් නෙලා
එක් මල් දමක් ගොතලා
මව් බිමට පළඳා
සිරි විඳිමු දරුවනේ මතුදා



ලෝක ළමා දිනයට දින කිහිපයක් තිබියදී පාසල් ළමුන් පිරිසකගේ ළමා අයිතීන් උල්ලංඝනය කළ සිදුවීමක් පිළිබඳව මහනුවරින් අසන්නට ලැබුණි. ඒ මහනුවර ගන්නෝරුව ප්‍රදේශයේ මංගල උත්සවයකදී ''ලොව දිගම සාරි පොට'' සඳහා වූ ගිනස් වාර්තාව තැබීමේ අරමුණින් සැතපුම් තුනක් දිග මනාලියගේ සාරි පොට ඇල්ලීම සඳහා ප්‍රාථමික පාසල් ළමුන් 250ක් යොදාගෙන තිබීමය.

මේ සිදුවීම දේශීය හා ජාත්‍යන්තර මාධ්‍ය ඔස්සේ, සමාජ ජාල අඩවි ඔස්සේ කතාබහට, විවේචනයට ලක්විය. එනිසාම අදාළ බලධාරීන්ට ඒ පිළිබඳව මුනිවත රැකීමට නොහැකි තත්වයක් උදාවී ඇත. එහෙත් කුමන පරීක්ෂණ ආරම්භ කළද ඊට සම්බන්ධ දේශපාලන බලවතුන් නම් සියලු චෝදනාවන්ගෙන් නිදොස්වන බව නම් සහතිකය.

කෙසේ වුවද දේශපාලකයන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන උත්සව සඳහා පාසල් දරුවන් යොදා ගැනීම සම්බන්ධයෙන් මෙරට තුළ දිගු ඉතිහාසයක් ඇත. ඒ පිළිබඳව වන සමාජ විරෝධය නිසාම වත්මන් ජනාධිපතිවරයා, තමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන කිසිදු රාජ්‍ය උත්සවයකට පාසල් ළමුන් සහභාගි කර නොගන්නා බව පැවසුවද අධ්‍යාපනය හා ඊට අදාළ වෙනත් ක්‍රියාකාරකම්වලට පරිබාහිරව වෙනත් උත්සව අවස්ථා සඳහා පාසල් ළමුන් සහභාගි කර ගැනීම තවදුරටත් සිදුවෙමින් පවතී.

දේශපාලකයන් සහභාගි වන උත්සව සඳහා ළමුන් අව්වේ පෙළට සිටවා තැබීමෙන් හෝ නැතහොත් ගිනස් වාර්තා තැබීමට අව්වේ වේලෙමින් සාරි පොටවල් අල්ලාගෙන සිටීමෙන් හෝ ළමයාගේ පෞරුෂත්වය, කුසලතාවය, මානසික ශාරීරික හැකියාවන් වර්ධනය වන්නේ නැත. අධ්‍යාපන හෝ බාහිර ක්‍රියාකාරකම්වලට අයත් නොවන මෙවැනි කටයුතු සඳහා දරුවන් යොදා ගැනීම ළමුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකි. බලධාරීන් මෙවැනි ක්‍රියා නොදැක්කා සේ සිටිමින් මුනිවත

# ප්‍රමාදයට පෙර වචනයක්



''ගෑස් ලිපෙන් කසිප්පු පෙරා කතක් දැලේ.'' ''තලවතුගොඩ ප්‍රදේශයේ කාන්තාවක් මහලු අය බලා ගැනීමට රට යවන බව පවසා මිනිසුන් රවටමින් මුදල් වංචාකර හසුවේ'' මේ පසුගිය කාලයේ මාධ්‍යවල පළ වූ සිදුවීම් දෙකකි.

සැබැවින්ම ඉතිහාසයේ අසා නැති මෙවැනි කූට ජාවාරම්කාරියන් බවට කාන්තාවන් පත්වීමට හේතුව කුමක්ද? 1948 සිට මෙතෙක් කල් බලයට පත්වූ ආණ්ඩු බලය අත්පත් කරගනු ලැබුවේ ජනතාවට හතර අතේ බොරු පොරොන්දු දීමෙනි. එහෙත් බලය අත්පත් කරගත් පසු ඒ සියල්ල ඔවුනට අමතකය. ජනතාවටද ඒ ගැන වගක් නැත. එපමණක් නොව ජනපතිට, මැති ඇමති වරුන්ට සුඛෝපභෝගී ජීවිත ගතකිරීමට යානවාහන ගනිති. මාලිගා තනති. ස්විස් බැංකුවල මුදල් තැන්පත් කරති. දළදා මාලිගාව හරස්කර ''කාර් රේස්'' පදිති. තවත් නොයෙක් විදියේ ජාවාරම් කරති. ඒ සියල්ල කරන්නේ රටේ ජනතාවගේ මුදල් වලිනි. එම මුදල් එකතුකර ගැනීමට රට උකස් කර ණය ගනිති. විවිධ වර්ගයේ බදු වර්ග ජනතාවට හඳුන්වා දෙති. දැනට ක්‍රියාත්මක 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතින් හා එයට පසුව එකතු කළ විවිධ පනත් මගින් විවිධ බදු හඳුන්වා දී ඇත. ඉහළ ආදායම් ලබන පුද්ගලයින් හා ආයතනවලින් සෘජු බදු අය නොකිරීම, ඔවුන්ට මග හැරයාමට ඉඩදීම මගින් සෘජු බදු අය නොකර, වැටුපෙන් ජීවත්වන ජනතාව-ගෙන් සහ අඩු ආදායම්ලාභී ජනතාවගෙන් වක්‍ර බදු තුළින් බදු අයකර ගැනීම වැඩි කර ඇත. බහුතරයක් පීඩිතයින් වන අපේ සමාජය මේ හේතුවෙන් උඩුයටිකුරු කර ඇත.

එහි ප්‍රතිඵලය වන්නේ ජනතාව අයුතු ක්‍රියාවන් හරහා හෝ මුදල් සෙවීමට පෙළඹීමය. අද වන විට කාන්තාවද එතනට පත්වී ඇත. රැකියා විරහිතබවද, ඉහළ යන බඩු මිලද ජීවිත තව තවත් බිඳ වැටීමට ලක්කර ඇත. හෘද සාක්ෂිය පවා බිඳ වැටී, සියල්ල මුදල් මත තීරණය වන සමාජ වටපිටාව තුළ බහුතරයක් දෙනා ජීවත් වනවාද නැද්ද යන්න නැවත නැවතත් සිතා බලන තත්වයට පත්ව ඇත.

එයින් වැඩිපුරම පීඩාවට පත්වන්නේ කාන්තාවන්ය. මුළුතැන්ගේ අඩුපාඩුවලට මුහුණ දෙන්නේද ඔවුන්මය. එසේම දරුවන්ගේ ඕනෑ එපාකම් කියාපාන්නේද මවට බැවින් එයට මුහුණ දෙන්නට සිදුවන්නේද ඇයටමය. විරැකියාව බරපතළ ලෙස බලපාන අතර දෙදෙනාම රැකියාවක නියැලුණද ලැබෙන සොච්චම් මුදලින් ගෙදර වියදම් පිරිමසාගෙන වැඩ කිරීමට සිදුවන්නේ ඇයටමය. එවිට කාන්තාව විවිධ අතුරු රැකියා කිරීමට පෙළඹේ. එයද අසාර්ථක වූ විට නීතිවිරෝධී, සදාචාර විරෝධී ජාවාරම් පවා කිරීමට පෙළඹීම අරුමයක් නොවේ. ඉතින් ඇය ගෑස් ලිපෙන් කසිප්පු පෙරනු ඇත; රට යවන බව පවසා රවටමින් මුදල් කොල්ලකනු ඇත; තවත් විශ්වාස කිරීමට පවා නොහැකි ක්‍රියාවලට පෙළඹීමට ඉඩ ඇත; ඒවා එළිදරව්වීමෙන් පසු සමාජය ඉදිරියේ ගැරහීමට ලක් වනු ඇත. අද කාන්තාවගේ තත්වය එබඳුය.

මෙලෙස වරද කරන නීති විරෝධී කටයුතුවල නියැලෙන, දරුවන් මහ මග දමා යන කාන්තාවන්ට දොස් පැවරීමෙන් හෝ ඔවුන්ට 'දැඩි දඬුවම් පැමිණවීමෙන් හෝ මේ ප්‍රශ්න විසඳෙන්නේ නැත. මෙම ගැටලු හුදෙකලාව ගෙන විසඳිය නොහැක්කේ මේ සියල්ල එකම මූලයකින් බිහිවන නිසාය. ඒ මූලය නම් ලංකාවේ සමාජ ආර්ථික දේහයේ අර්බුදයය. මේ තත්වය තුළ කාන්තාව බරපතළ ඛේදවාචකයකට මුහුණ දෙමින් සිටී. මේ තත්වයෙන් මිදීමට නම්, අර්බුදයේ හේතු සොයා එහි මූලයට පිළියම් ලැබෙන පූර්ණ සමාජ වෙනසක් අවශ්‍ය වේ. එබැවින් අපේ කාන්තාවන් දැන්වත් කාන්තාවගේ අයිතීන් සුරකින, ඇයට නිසිතැන දෙන ජනතා ව්‍යාපාරය සමග පෙරමුණ ගෙන ජයග්‍රහණය අත්පත් කර ගැනීමට ප්‍රමාද නොවිය යුතුය.

දැනුම, සමාජය හා චින්තනය 21

# සමාජය තුළ හුදකලා වන මිනිසා

ලෝකය 21 වන සියවසට පා තබන විටත් එය ගෝලීකරණය නම් දේශපාලන හා ආර්ථික සංකල්පයට ලක්ව තිබුණි. නවීන තාක්ෂණයේ මහා ඉදිරි පිමි සහිත වර්ධනය විසින් විශේෂයෙන් තොරතුරු තාක්ෂණයට අදාළව අන්තර්ජාලය, ජංගම දුරකථනය, මුහුණු පොත (Face Book) ආදිය විසින් ලෝකය එකම ගම්මානයක්ව ඇතැයි මත පළවිය. එය සත්‍යයක්ද විය. තොරතුරු තාක්ෂණයේ වේගවත් වර්ධනය විසින් ලොවපුරා මිනිසුන් එකට එක්කරන ලදී. ලෝකය විශ්ව ගම්මානයක් විය.


**වර්ධනයේ ප්‍රතිවිරෝධය**

මෙලෙස ලෝකය වඩාත් සමීපවුවාය යන කථාව අතරම දැන් ලොව පුරා ඊට මුළුමනින්ම ප්‍රතිවිරුද්ධ මතයක්, අදහසක් වර්ධනය වෙමින් පවතී. ඒ, නවීන තාක්ෂණය විසින් මිනිසා (විශේෂයෙන් නව පරපුර) එකිනෙකාගෙන් හුදකලා කරමින් යන බවය. ලෝකය විශ්ව ගම්මානයක් බවට පත්වුවායයි පුරසාරම් දෙඩූ අයම දැන් 'මිනිසා සමාජ ක්‍රියාකාරකම්වලින් මිදී හුදකලා වෙමින් යන්නේය' යනුවෙන් කනස්සලු වීමට පටන්ගෙන තිබේ. මෙම ප්‍රතිවිරෝධී මත දෙකම නිර්මාණය වූයේ තොරතුරු තික්ෂණය පදනම්කරගෙනය. එසේ වූයේ ඇයි?

වත්මන් ලෝක ධනවාදය, ප්‍රාග්ධනය මත පදනම්වූ ධනපති ක්‍රමය දැන් පවතින්නේම ප්‍රතිවිරෝධයකය. එබැවින් ඒ තුළ නිර්මාණය වන සෑම 'ජයග්‍රහණයක්ම' ඒ සමගම පොදු ජනතාවගේ, සමාජයේ 'පරාජයක්'ද වේ. ඒ තුළ ඇතිකර ගන්නා සෑම ඉදිරි පියවරක්ම සාපේක්ෂව ජනතාවගේ ආපසු පියවරකි. එය මෙලෙස තේරුම් ගත හැක. ධනවාදය තුළ සොයා ගන්නා නව යන්ත්‍රයක් විසින්, නිෂ්පාදන උපකරණයක් මගින් කරනුයේ වැඩකරන ජනතාවගේ වැඩ පහසුකිරීම නොව ඒ වෙනුවට ප්‍රාග්ධනයට වැඩිපුර ලාභ එකතුකර ගැනීම සඳහා නව යන්ත්‍රය හෝ තාක්ෂණික මෙවලම මගින් වඩාත් වැඩියෙන් ශ්‍රමය සූරාකෑම හෝ වැඩකරන ජනතාව සැලකිය යුතු ප්‍රමාණයකට රැකියා අහිමි කිරීමය. ධනවාදයේ 'ජයග්‍රහණ' ජනතාවගේ 'පරාජයන්' වන්නේ එසේය. ඒ අනුව සන්නිවේදන තාක්ෂණයේ ජයග්‍රහණ තාවකාලිකව හෝ මිනිසාගේ 'පරාජයන්' වී තිබේ.

**හුදකලාවට සමාජයක් විය හැකිද?**

මානව සමාජයේ එක් ප්‍රධාන ලක්ෂණයක් වූයේ මිනිසුන් සාමූහිකවීමය. එම සාමූහිකත්වයේ පදනම වූයේ නිෂ්පාදනය, පරිභෝජනය හා නැවත නිෂ්පාදනයයි. තම පැවැත්ම සඳහාත්, ආරක්ෂාව සඳහාත් සාමූහිකව ජීවත්වීමට මිනිසාට බලකළ අතර මිනිසා සත්ව රංචුවක් වෙනුවට සමාජයක් වූයේ එම සාමූහිකත්වය නිෂ්පාදනය මත පදනම් වූ නිසාය. මිනිසා යනු නිෂ්පාදනය කරන හා පරිභෝජනය කරන සත්වයෙක් පමණක් නොව ඔහු සංස්කෘතික සත්වයෙක්ද වේ. විනෝදය, අධ්‍යාපනය, සංවාද, සාමූහික ක්‍රියාකාරකම්, එකිනෙකා තේරුම් ගැනීම, එකිනෙකාට උදව් කිරීම, අභියෝගවලදී එක්ව කටයුතු කිරීම ආදී බොහෝ ක්‍රියාකාරකම් හා ලක්ෂණ මිනිස් සමාජයට නැතිවම බැරි දේවල්ය.



එහෙත් නූතන ධනවාදයේ සමහර තාක්ෂණික මෙවලම් මගින් අභියෝගයට ලක්කර ඇතැයි බොහෝදෙනා පවසන්නේ මෙම චර්යා රටාවන්ය.

කාර්යාලයේදී, කෝච්චියේදී, කෑම පැයේදී, එකිනෙකා හා දොඩමලුවන, විහිළු තහළු කරන, කැරම් හෝ කාඩ් සෙල්ලම් කරනා පිරිසක් වෙනුවට අද සිටින්නේ, තම ජංගම දුරකථනයේ තිරය දෙස බලාගෙන එය එහා මෙහා කරන පිරිසක් බව බොහෝදෙනා කියති. එහි සත්‍යයක්ද තිබේ. එසේම දුම්රියේ, බස්රියේ යනවිටද දැන් අපට හමුවන්නේ, එකිනෙකා සමග දොඩමලු වන පිරිසක් නොව කරබාගෙන දුරකථනය සමග ක්‍රීඩාකරන පිරිසකි. නිවෙස තුළදී, කෑම මේසයේදී, විනෝද ගමනකදී පවා මේ අත්දැකීම විඳීමට හැකිව තිබේ. වරක් කියුබානු තනාපතිවරයෙක් මේ තත්වය පිළිබඳ සඳහන් කරමින් පැවසුවේ දැන් සිටින්නේ, Screen Genaration එකක් බවය. ලෝකයේ බොහෝ වමේ පක්ෂද මේ පිළිබඳව කථාකරන අතර තරුණ පරපුර දේශපාලනයට ඒමට මැලිකමක් දක්වන බවත් ඔවුන් මෙම තාක්ෂණයේ සිරකරුවන්ව සිටින බවත් පවසති. මේ අනුව පෙනෙන්නේ, මෙම ගැටලුව සරල නොවන බවය. මේ අනුව මෙම හුදකලාවීම විසින් සමාජය අහෝසි වේද? අප සිතා බැලිය යුතු කරුණු ඒවාය.

**තාක්ෂණය අවුලක්ද?**

සමාජය තුළ හුදකලාව සිටින බවක් අපට පෙනෙන කිසිවෙකු සැබැවින්ම හුදකලාවී නැත. ඒ තුළද ඇත්තේ ප්‍රතිවිරෝධයකි. තමන් ළඟම සිටින, තමා අසල සිටින තැනැත්තා සමග කථා නොකොට දුරකථනයේ ගිලී සිටින පුද්ගලයා ඒ මගින්, විවිධ සමාජ ජාල වෙබ් පිටු හරහා විශාල පිරිසක් හා බැඳී සිටී. ඔහු පෙනුමෙන් හුදකලා වුවත් හරයෙන් හුදකලා නැත. ඔහු තම අදහස් හා මතවාද විශාල පිරිසක් සමග බෙදා හදා ගනී. අන් අයට ප්‍රතිචාර දක්වයි. එහෙත් ඒ තාක්ෂණය හරහාය. ඔහු දැන් සමාජය සමග ගනුදෙනු කරන්නේ 'ඩේටා' මගිනි. ඔහුගේ ජීවිතය 'ඩේටා' සමග බැඳී තිබෙන අතර 'ඩේටා' බැඳී තිබෙන්නේ ප්‍රාග්ධනය සමගය. ඒවා සිදුකරන්නේ, ප්‍රාග්ධනයට ලාභ උපයා දීමය. අවසානයේ සියලුදෙනා 'ඩේටා' වල (ප්‍රාග්ධනයේ) සිරකරුවන් බවට ධනවාදය විසින් පත්කර තිබේ. සත්‍යය එයයි.

> "ඔහු දැන් සමාජය සමග ගනුදෙනු කරන්නේ 'ඩේටා' මගිනි. ඔහුගේ ජීවිතය 'ඩේටා' සමග බැඳී තිබෙන අතර 'ඩේටා' බැඳී තිබෙන්නේ ප්‍රාග්ධනය සමගය. ඒවා සිදුකරන්නේ, ප්‍රාග්ධනයට ලාභ උපයා දීමය. අවසානයේ සියලුදෙනා 'ඩේටා'වල (ප්‍රාග්ධනයේ) සිරකරුවන් බවට ධනවාදය විසින් පත්කර තිබේ. සත්‍යය එයයි."

සැබැවින්ම මෙය තාක්ෂණයේ අවුලක් හෝ වැරැද්දක් නොවේ. තාක්ෂණය උපයෝගී කර ගැනීමේ ගැටලුවකි. වත්මන් පරපුරට මෙම නවීන, ඉතාම වටිනා තාක්ෂණය හඳුන්වා දෙන්නා කවුද? ආණ්ඩුවක්ද? වගකිව යුතු ආයතනයක්ද? නැත. මේවා අලුත් පරපුරට හඳුන්වා දෙන්නේ ජංගම දුරකථන සමාගම්ය. විවිධ මෘදුකාංග නිපදවන්නන්ය. විවිධ සමාජජාලා වෙබ් අඩවිවල හිමිකරුවන්ය. ඔවුන්ට පැහැදිලි අරමුණක් තිබේ. ඒ හැකිතරම් ලාභ ලැබීමය. සමාගම්වලට වැඩියෙන් ලාභ ලැබීමට නම්, වැඩියෙන් ආදායම් ලැබිය යුතුය. එසේ ආදායම් ලැබීමට නම් ජනතාව මෙම තාක්ෂණික උපකරණ වැඩියෙන් (අවශ්‍යතාවය නොසලකා) හා නිතර පරිහරණය කළයුතුය. එවිට සිදුවන්නේ කුමක්ද? ප්‍රාග්ධන හිමියන්ගේ ගොදුරු බවට පත් 'ඩේටා' පාරිභෝගිකයා සමාජයෙන් හුදකලාවන අතරම තම තුට්ටුදෙකද නොදැනුවත්වම වියදම් කර ගැනීමය.

සමාජය සමග වඩා වැඩියෙන් සබඳතා පැවැත් වීමට, එකිනෙකා හඳුනා ගැනීමට, තොරතුරු හා අදහස් හුවමාරු කර ගැනීමට මෙන්ම මතවාදී අරගලයන් සඳහාද මෙම නවීන තොරතුරු තාක්ෂණය යොදාගත හැක. එබැවින් මෙම තාක්ෂණය ඉතා හොඳ එකකි. එහෙත් එය නිවැරදිව යොදා ගැනීමට මඟ පෙන්වීමක් නොමැති විට හා වැරදි මඟපෙන්වීම් පමණක් තිබෙන විට සමාජයේ අප කථාකරන ප්‍රතිවිරෝධතා මතුවේ. එබැවින් සිදුවිය යුත්තේ, මෙම නවීන තාක්ෂණය වඩා හොඳ අරමුණු සඳහාත්, සංයමයක් හා විනයක් සහිතවත් පාවිච්චි කිරීමට ජනතාවට උගැන්වීමය. එය ධනවාදය විසින් සිදුකරන්නේ නැත. වමේ ව්‍යාපාර පෙරමුණ ගත යුත්තේ ඒ සඳහාය.

**මෝහනයෙන් මිදීමට නම්**

ධනවාදය තුළ මිනිසුන්, විශේෂයෙන් පීඩාවට පත් තරුණ පරපුර සිහිනයක ගිල්වා තැබීමට හැකිනම්, මෝහනය කර තැබීමට හැකිනම්, හුදකලා කර තැබීමට හැකිනම් එය ධනවාදයට වාසිදායකය. එබැවින් ධනවාදය හැම විටම කටයුතු කරන්නේ, ඒ වෙනුවෙනි. මේ අප දකින්නේද එයයි. එහෙත් සමාජයක් තුළ මිනිසාට හුදකලා විය නොහැක. ඔහු තාවකාලිකව හුදකලා වුවත් හුදකලාභාවයේ දිගට සිටීමට ඔහුට නොහැක. මන්ද ඔහුගේ ජීව විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක කොන්දේසි විසින් මානව සාමූහිකත්වය ඉල්ලා සිටින නිසාය. මිනිසුන් නිදිකරවා මෝහනය කරවා තැබිය හැකිය. එහෙත් ඒ ටික කලකට පමණි. මන්ද මිනිසුන්ගේ බරපතළ අවශ්‍යතා විසින් ඔවුන් මෝහනයෙන් මුදවන බැවිනි. නින්දෙන් අවදිකරවන බැවිනි. මානව සමාජයට, නව පරපුරට මෙම ප්‍රතිවිරෝධය තුළ එනම් 'සාමූහිකත්වය වෙනුවට හුදකලාව' නම් ප්‍රතිවිරෝධය තුළ දිගට ජීවත්විය නොහැක. ඔහු දිනක සමාජය තුළ සාමූහිකත්වය සොයා එනු ඇත. එබැවින් දැන් කළ යුත්තේ, නව පරපුරට ඒ සඳහා මඟ පෙන්වීමය. එම මඟ පෙන්වීම කළ හැක්කේද තාක්ෂණය ඉවත ලීමෙන් නොව එය මගින්ම එය නිවැරැදිව පරිහරණය කිරීමට අවශ්‍ය ඥානය හා දැක්ම ඇතිකිරීම තුළිනි.

මාක්ස් වරක් මෙසේ පවසා තිබුණි. ඒ "**ඉතිහාසය විසින් ඉදිරිපත් කරනු ලබන්නේ, එයට විසඳිය හැකි ගැටලු පමණි. ඉතිහාසය සිය ගැටලු විසඳාලන්නේ, නව ගැටලු මතුකරමිනි**" යනුවෙනි.

ඉතිහාසය, මානව සමාජය ගමන් කරන දයලෙක්තිකය එයයි. සමාජය ගැටලු මතුකරන්නේ නම් ඒ සඳහා විසඳුමක්ද තිබේ. ඒවා අපට විසඳාලිය හැක්කේ ඒ නිසාය. එහෙත් ඒ සමගම නව ගැටලුවලට මුහුණ දීමට මිනිසාට සිදුවේ. ඉතිහාසය ගමන්කරන්නේ එසේය. ගැටලු ඉදිරිපිට කම්පා වීමට හෝ බිය වීමට පෙළඹිය යුතු නැත්තේ ඒ නිසාය. කෙසේ වුවත් ධනවාදය විසින් නිර්මාණය කර ඇති හුදකලා සිරගෙයින් මිදී මානව සමාජය වෙත ඒමට මිනිසාට සිදුවීම අනිවාර්යක් වන අතර එවිට ධනවාදයේ බැම්ද පුපුරා විනාශ වනු ඇත.



"පක්ෂය කෙරෙහි සහ මහජනයා කෙරෙහි අපට විශ්වාසය තිබිය යුතුමය. මෙය අතිශයින් වැදගත් මූලධර්මයකි. අපි මෙම මූලධර්මය ගැන සැක කරනවා නම් අපට කිසිවක් ඉටුකර ගැනීමට නොහැකි වනු ඇත.''

**මාවෝ සේ තුං**
**කෘෂිකාර්මික සමූපකාරය පිළිබඳ ප්‍රශ්නය ගැන**

# ජනතාවගේ පිරිහෙන සෞඛ්‍යය සහ ආණ්ඩුවේ බොරුව

රටක හෝ සමාජයක ඉදිරි ගමන සඳහා නිරෝගී උගත් මානව සම්පතක් පැවතීම අත්‍යාවශ්‍ය සාධකයකි. සමාජයක් රෝගී නම්, නූගත් නම් ඒ සමාජයට හෝ රටට ඉදිරි සංවර්ධන ඉලක්ක කරා යාම ඉතාම අසීරු වේ. මේ නිසා බොහෝ ධනේශ්වර රටවල් මෙන්ම සමාජවාදී රටවල්ද අධ්‍යාපනය හා සෞඛ්‍ය බාධාවකින් තොරව තම තමන්ගේ ආර්ථික දැක්මට අනුව හැකි උපරිම මට්ටමකින් ජනතාව වෙත ළඟා කර දීම කෙරෙහි අවධානය යොමු කොට ඇත.

සම්පූර්ණ කායික මානසික සුවය හා සමාජීය සහජීවනය සෞඛ්‍ය ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිර්වචනය කර ඇත. සමාජයක සෞඛ්‍යය කෙරෙහි බලපාන සාධක ගණනාවක් ඇත. සෞඛ්‍ය සේවාව යනු සෞඛ්‍ය සඳහා බලපාන සාධක අතුරින් එකක් පමණි. අධ්‍යාපන මට්ටම, සෞඛ්‍ය සේවාව, ආදායම, නිවාස, ජලය, පරිසරය, කර්මාන්ත, ක්‍රීඩාව, කෘෂිකර්මාන්තය ඇතුළු සමාජ, ආර්ථික, දේශපාලන තත්වය විසින් රටක සෞඛ්‍යයේ තත්වය තීරණය කරනු ලබයි. ඒ අනුව රටක ජනතාවගේ සමස්ත සෞඛ්‍ය තත්වය තීරණය වන්නේ, පවතින සෞඛ්‍ය සේවාව මත පමණක් නොව රටේ සමස්ත දේශපාලන ආර්ථික ව්‍යුහය මතය. කෙසේ වෙතත් පවතින සෞඛ්‍ය සේවය රටේ ජනතාවගේ සෞඛ්‍ය කෙරෙහි බලපාන තීරණාත්මක සාධකයකි.

වඩා හොඳ සෞඛ්‍ය සේවාවක් ජනතාව වෙත සැපයීම සඳහා නිසි නායකත්වයත්, අවශ්‍ය ප්‍රමාණයට මුදල් වෙන් කිරීමත්, අවශ්‍ය මානව හා භෞතික සම්පත් (වෛද්‍ය, හෙද ඇතුළු සෞඛ්‍ය කාර්ය මණ්ඩලය, ඖෂධ, උපකරණ, යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි ආදිය) අවශ්‍ය ප්‍රමාණයට උත්පාදනය වීමත්, අත්‍යාවශ්‍ය වේ.

### අසාර්ථක සෞඛ්‍ය සේවය

අද වන විට අප රටේ සෞඛ්‍ය සේවාව අයාලේ යෑමට හේතුවී ඇත්තේ, ඉහතින් සඳහන් කළ පරිදි නිසි නායකත්වයක් නොමැති වීමත් අවශ්‍ය ප්‍රමාණයෙන් අඩක්වත් රජය විසින් මුදල් වෙන් නොකිරීමත් සම්පත් උත්පාදන අවශ්‍ය ප්‍රමාණයට සිදු නොවීමත් නිසා බව පැහැදිලිය.

වරින්වර පත්වන ආණ්ඩුවල දේශපාලකයන් විසින් අප රටේ නිදහස් සෞඛ්‍ය සේවාවක් ඇතැයි කියමින් ජනතාව රැවටීමට ලක්කරනු ලබයි. නමුත් රටේ සමස්ත සෞඛ්‍ය වියදමෙන් ආණ්ඩුව විසින් දරනු ලබන්නේ 40% ක් ප්‍රමාණයක් පමණි. ඉතිරි 60% ක සෞඛ්‍ය වියදම් ජනතාව විසින් දෛනිකව වියදම් කළ යුතුව ඇත ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශවලට අනුව සමස්ත සෞඛ්‍ය වියදමෙන් 70%ක් වත් රජය මගින් දැරිය යුතු වේ. එසේ නොවුවහොත් සෞඛ්‍ය සේවාව අසාර්ථක වන බව පැහැදිලිව සඳහන් කර ඇත. ඒ අනුව අද අප රටේ ඇත්තේ අසාර්ථක සෞඛ්‍ය සේවාවකි.

නවීන වෛද්‍ය විද්‍යාවේදී බෝවන රෝග මෙන්ම බෝ නොවන රෝග පාලනය කිරීමේදී ඖෂධවලට ඉතා වැදගත් තැනක් හිමි වේ. ප්‍රතිජීවක ඖෂධ, අධි රුධිර පීඩනය, හෘදයාබාධ, දියවැඩියාව, කොලෙස්ටරෝල් වැනි රෝග සඳහා භාවිතා කරන ඖෂධ, පිළිකා නාශක ඖෂධ සහ වේදනා නාශක ඖෂධ ඒවා අතර ප්‍රමුඛ වේ. නමුත් අද වන විට අපේ රටේ රෝගීන්ට අත්‍යාවශ්‍ය ඖෂධ නොලැබී යන තත්වයක් උද්ගත වී ඇත.

සංවර්ධිත යැයි සලකනු ලබන රටවල්වල සමස්ත සෞඛ්‍ය වියදමෙන් 20% ක් පමණ ඖෂධවලට යොදවනු ලබයි. නමුත් අප රටේ ඖෂධ සඳහා සමස්ත සෞඛ්‍ය වියදමෙන් 60% ක් පමණ වියදම් කරයි. එය ඉතා බරපතළ තත්වයකි. නිසි සෞඛ්‍ය ප්‍රතිපත්තියක් නොමැති වීමත්, ඖෂධ ප්‍රතිපත්තියක් නොමැති වීමත් නිසා සෞඛ්‍ය සඳහා වෙන්කරන සුළු මුදල් ප්‍රමාණයෙන් ඖෂධ සඳහා වැඩි ප්‍රතිශතයක් වියදම් කළ විට අනෙකුත් නිවාරණ කටයුතු, සම්පත් උත්පාදනය, සඳහා මුදල් ඉතිරි නොවීම නිසා සෞඛ්‍ය සේවාව පහළට ඇද වැටේ. අනෙක් පැත්තෙන් අත්‍යාවශ්‍ය නොවන ඖෂධ (විටමින් හා




ඛණිජ ලවණ වැනි) සඳහා විශාල වියදමක් සිදු කිරීමද, සිදුවී ඇත.

### හවුල් ඖෂධ ජාවාරම

රටකට ඖෂධ ප්‍රතිපත්තියක් අවශ්‍ය වන්නේ, අවශ්‍යතාවය අනුව රෝගීන්ට ඖෂධ ලබාදීම සඳහාය. නමුත් අද වන විට ඖෂධ සමාගම් ආණ්ඩු සමග එක්වී ඖෂධ ප්‍රතිපත්තියක මූලික අවශ්‍යතාව ඉටු කරනු වෙනුවට වෙළඳපොළ තුළ ලාභ ඉපයීම පමණක් අරමුණු කරගෙන ඖෂධ වෙළඳපොළ හසුරවනු ලබයි.

මහාචාර්ය සේනක බිබිලේ මහතා විසින් හඳුන්වා දුන් ඖෂධ ප්‍රතිපත්තිය පදනම් කර ගනිමින් ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් හඳුන්වාදී ඇත. එම ප්‍රතිපත්තිය සදනම් කරගෙන ලෝකයේ රටවල් 100ක පමණ ඖෂධ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් ඖෂධ සමාගම්වලට යම් යම් සීමා පනවා ඇත. එමගින් ඖෂධ වෙළඳපොළ තුළ ජනතාව සූරාකෑම යම් ප්‍රමාණයකට අඩු කර ගැනීමට හැකිවී තිබේ.

නමුත් අපේ රටේ ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් හඳුන්වා දුන් ජාතික ඖෂධ ප්‍රතිපත්තිය හෝ මහාචාර්ය සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය හෝ ක්‍රියාත්මක වන්නේ නැත. ඒ වෙනුවට ක්‍රියාත්මක වන්නේ, ඖෂධ සමාගම් ආණ්ඩුව සමග එක්වී සිදුකරනු ලබන ඖෂධ ජාවාරමකි. එහි ප්‍රතිඵල ලෙස අද වන විට ඖෂධ මිල විශාල ලෙස ඉහළ ගොස් ඇත. රජයේ රෝහල්වලට ඖෂධ සැපයීම අඩුවීම නිසා අත්‍යාවශ්‍ය ඖෂධ අවශ්‍ය ප්‍රමාණයට, අවශ්‍ය මාත්‍රාවෙන් රෝගීන්ට නොලැබේ. ඖෂධ ප්‍රමිතිය පරීක්ෂා කර බැලීමට විධිමත් ක්‍රමවේදයක් නොමැති නිසා රට පුරා සංසරණය වන ඖෂධවල ප්‍රමිතිය පිළිබඳව කිසිදු වගකීමක් ආණ්ඩුව විසින් දරනු නොලබයි. එසේම ඖෂධ අවභාවිතය ඉහළ

> "අපේ රටේ ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් හඳුන්වා දුන් ජාතික ඖෂධ ප්‍රතිපත්තිය හෝ මහාචාර්ය සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය හෝ ක්‍රියාත්මක වන්නේ නැත. ඒ වෙනුවට ක්‍රියාත්මක වන්නේ, ඖෂධ සමාගම් ආණ්ඩුව සමග එක්වී සිදුකරනු ලබන ඖෂධ ජාවාරමකි. එහි ප්‍රතිඵල ලෙස අද වන විට ඖෂධ මිල විශාල ලෙස ඉහළ ගොස් ඇත. රජයේ රෝහල්වලට ඖෂධ සැපයීම අඩුවීම නිසා අත්‍යාවශ්‍ය ඖෂධ අවශ්‍ය ප්‍රමාණයට, අවශ්‍ය මාත්‍රාවෙන් රෝගීන්ට නොලැබේ."

ගොස් ඇත. පාසල් ළමුන් අතර මත් පෙති පාවිච්චිය ඉහළ යාමද එහි ප්‍රතිඵලයකි. සෞඛ්‍ය ඇමතිවරයා විසින් වරින්වර බොරු කියමින් ජනතාව රවටනු ලබයි.

### සිල්ලර වූ සිල්ලර මිල

නව ඖෂධ පනත මගින් ඖෂධ වර්ග 48ක් සඳහා උපරිම සිල්ලර මිලක් හඳුන්වා දීමද එවැනි රැවටීමකි. උපරිම සිල්ලර මිලට වඩා බොහෝ අඩු මිලට වෙළඳපොළේ තිබූ ඖෂධවල මිල ගණන් අද වනවිට විශාල ලෙස ඉහළ ගොස් ඇත. අඩුම කරමින් ඖෂධවල මිල ගණන් සොයා ගැනීමට ක්‍රමවේදයක් හෝ සෞඛ්‍ය අමාත්‍යංශට නැත. සමාගම් විසින් තමන්ගේ හිතු මනාපයට ඖෂධ මිල තීරණය කරනු ලබයි.

සෞඛ්‍ය ඇමතිවරයා පිළිකා රෝගීන්ට ලබාදෙන ඖෂධ, අක්ෂි කාච, හෘද රෝගීන්ට අවශ්‍ය කැතීටර් සහ ස්ටෙන්ට් නොමිලේ ලබාදෙන බවට විශාල ප්‍රචාරයක් දියත් කරමින් දේශපාලන වාසි ලබාගැනීමට උත්සාහ කළේය. නමුත් අද වන විට සියල්ල බොරු බවට පත්වී ඇති අතර එම උපකරණ කිසිවක් අවශ්‍ය ප්‍රමාණයට රෝහල්වලට සැපයීමක් සිදු නොවේ.

බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලෙස තිබූ සමාජ බලපෑම නිසා නව ඖෂධ පනත 2015 වර්ෂයේදී සම්මත කරන ලදී. නමුත් එම පනත කිසිසේත්ම ඖෂධ ප්‍රතිපත්තියක් ලෙස සැලකිය නොහැක. එම පනත මගින් ඖෂධ වෙළඳපොළ නියාමනය කිරීමට අදාළ වගන්ති කීපයක් ඇතුලත් කර තිබුණි. නමුත් රජයේ රෝහල්වලට නොමිලේ ඖෂධ සැපයීම පිළිබඳව, රාජ්‍ය ඖෂධ සංස්ථාව මගින් ඖෂධ නිෂ්පාදනය ඉහළ නංවන ආකාරය පිළිබඳව, ඖෂධ හිඟයට විසඳුම් සොයන ආකාරය ඇතුළු ඖෂධ සම්බන්ධව පැන නැගී ඇති ගැටලු විසඳීම කෙරෙහි කිසිදු අවධානයක් යොමු කර නැත.

බිබිලේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන බව පවසමින්, වැඩකට නැති නව පනතක් ගෙන එමින් ජනතාව තවදුරටත් මුලා කිරීමට උත්සාහ ගෙන ඇත.

### යහපත් සෞඛ්‍ය සේවාවක් සඳහා

මේ තත්වය හමුවේ නිදහස් සෞඛ්‍ය සේවයක් වෙනුවෙන් වඩා හොඳ සෞඛ්‍ය ප්‍රතිපත්තියක් සහ වඩා හොඳ ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් වෙනුවෙන් සටනක් අපට ඉතිරිව ඇත. සෞඛ්‍ය සේවාව සඳහා රාජ්‍ය වියදම දැනට දළ දේශීය නිෂ්පාදිතයෙන් 1.5% ක් පමණ වේ. ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ අනුව අවම වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් 5%ක් සෞඛ්‍ය සේවාව සඳහා වෙන් කිරීම අත්‍යාවශ්‍ය වේ. නමුත් ආණ්ඩුවේ දේශපාලඥයන් විසින් සිදුකරනු ලබන මහා පරිමාණ මූල්‍ය වංචා මගින් රාජ්‍ය ආදායම ඉතා පහළ මට්ටමකට ඇද දමා ඇත. සාධාරණ බදු ප්‍රතිපත්තියක් නොමැති වීමත්, සැලසුම් සහගත ආර්ථිකයක් නොමැති වීමත් නිසා අද වන විට රාජ්‍ය ආදායම දළ දේශිය නිෂ්පාදිතයෙන් 11%ක් පමන පහළ මට්ටමකට වැටී ඇත. දකුණු ආසියාවේ අනෙකුත් රටවල් සැලකුවද මෙම ප්‍රමාණය 20%ට වඩා වැඩිය.

එම නිසා වඩා හොඳ සෞඛ්‍ය සේවාවක් මහජනතාව වෙත ළඟා කර ගත හැකි වන්නේ හොරකම්, වංචා දූෂණ, නොමැති සැලසුම් සහගත ආර්ථික වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ හැකි ජනතාවට සමානාත්මතාවයෙන් සලකන පාලන ක්‍රමයකට පමණි. එතෙක් අප ඒ සඳහා අරගල කළ යුතුව ඇත.

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2017 සැප්තැම්බර් 06

# තීරු බදු සහන මුවාවෙන් සිදුවන මහා පරිමාණ වංචා නතර කළ යුතුයි

පාර්ලිමේන්තු මන්ත්‍රී
විජිත හේරත් සහෝදරයා

(නිෂ්පාදන බදු (විශේෂ විධි විධාන) පනතේ නියමයන් පිළිබඳ විවාදයට එක්වෙමින්)



රජයේ සේවකයන්ට වාගේම, ඒ හා සමාන්තර වෘත්තිකයන්ටද තීරු බදු රහිත සහන යටතේ වාහන ලබා දීම හොඳයි. නමුත් ආණ්ඩුව බලයට පත් වූ ගමන් ලබා දුන් එම සහනය එකපාර නතර කළා. රජයේ සේවකයන්ගෙන් හා වෛද්‍යවරුන්ගෙන් ආපු ප්‍රබල විරෝධය හමුවේ තමයි නැවතත් මේ සහනය ලබා දෙන්න ඔබතුමන්ලා පෙලඹුණේ. කොහොම වුණත්, එම සහනය ලබා දීම පිළිබඳව අපේ එකඟතාවක් තිබෙනවා. හැබැයි රජයේ සේවකයන්ට ලබා දෙන තීරු බදු සහනය පසුගිය කාලය තුළ ව්‍යාපාරිකයන් කොහොමද පාවිච්චි කළේ, එම ව්‍යාපාරිකයන්ට එම සහනය ලබා දීම පිටුපස ඉන්න නිලධාරීන් කවුද. එම නිලධාරීන් පිටුපස ඉන්න දේශපාලනඥයන් කවුද කියන එක පිළිබඳවත් වහාම සොයා බලන්න ඕනෑ. මොකද 2013 - 2014 කාලය තුළ විශේෂයෙන්ම රජයේ සේවකයන්ට ගෙන්වපු BMW වාහන 1,675ක් පිළිබඳව බරපතළ මූල්‍ය වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා. එම වාහන 1,675 ගෙන්වීම නිසා රුපියල් බිලියන 16ක - රුපියල් ලක්ෂ 160,000ක - මුදලක් රජයට අහිමි වෙලා තිබෙනවා.

BMW වාහන ගෙන්වන ලංකාවේ නියෝජිතයා වෙන්නේ, Prestige Automobil (Pvt) Limited එකයි. මෙම සමාගම වාහන ගෙන්වීමේදී ටොයොටා සහ පර්ජෝ සමාගම එක්කත් තරග වදිනවා. ඇත්තටම කිව්වොත් මේ සමාගම්වලින් සුඛෝපභෝගී වාහන ගෙන්වීමේදී සියයට 300ක තීරු බද්දක් අය කරනවා.

යම් බදු සහනයක් ලබා දෙන කොට, ඒ බදු සහනය තමයි ඇත්තටම රජයේ සේවකයන්ට ලැබෙන්න ඕනෑ. නමුත්, රජයේ සේවකයන්ට මේ සහනය ලැබෙනවා වෙනුවට, මෙම ආයතන මේ හරහා business එකක් කිරීමයි සිදු වන්නේ. ඒ business එක පිටුපස Sri Lanka Customs එකේ නිලධාරීන් ඉන්නවා. ඒ විතරක් නොවෙයි, එම Sri Lanka Customs නිලධාරීන් පිටුපස දේශපාලනඥයොත් ඉන්නවා. ඒක තමයි අද සිද්ධ වෙලා තිබෙන්නේ. රජයේ සේවකයන් සහ වෘත්තිකයන් වෙනුවෙන් ගෙන්වන වාහනයක උපරිම මිල සීමා වුණේ ඇමෙරිකානු ඩොලර් 35,000කටයි. ඇමෙරිකානු ඩොලර් 35,000ට වඩා වැඩි මිලක් තිබෙන වාහන ගෙන්වනවා නම්, ඒ සඳහා වන බදු මුදල අදාළ ආයතනයෙන්, එහෙම නැත්නම් ගෙන්වන නියෝජිතයා මගින් ගෙවිය යුතුව තිබුණා.

පසුගිය කාලයේ ගෙන්විය හැකි වාහන මිල සීමාව වෙනස් කරලා, ව්‍යාජ ඉන්වොයිස් බලපත්‍ර පෙන්වලා වාහන ගෙන්වීමක් සිදු කර තිබුණා. අදත් ඒක සිදු වෙනවා. වාහන ගෙන්වීමේ මව් සමාගම වන්නේ ජර්මනියේ පිහිටි BMW AG කියන සමාගමයි. ඒක තමයි සත්‍ය සමාගම. ඒ සත්‍ය සමාගමෙන් නිකුත් කළ ඉන්වොයිස්වල ඉතා පැහැදිලිව ඒ වාහනවල සත්‍ය මිල සඳහන් වෙලා තිබෙනවා. එහෙම නැත්නම් සත්‍ය ඉන්වොයිස් එක නිකුත් කර තිබෙනවා. හැබැයි, ලංකාවේ Prestige Automobil (Pvt) Limited කියන සමාගම මේ වාහන ගෙන්වද්දී "Navigare International GmbH" කියන ව්‍යාජ කොම්පැනියක් ජර්මනියේ ස්ථාපිත කරලා, එම ව්‍යාජ කොම්පැනියෙන් ව්‍යාජ ඉන්වොයිස් ගෙන්වා ගෙන Sri Lanka Customs එකට පෙන්වා තිබෙනවා. එතැන මිල පෙන්වීමේදී ඇමෙරිකානු ඩොලර් 35,000ට වඩා අඩු මුදල් ප්‍රමාණයක් තමයි පෙන්වා තිබෙන්නේ. නමුත් ඇත්තටම ගෙන්වා තිබෙන වාහන ඇමෙරිකානු ඩොලර් 35,000ට වඩා වැඩි වටිනාකමක් තිබෙන වාහනයි. එම නිසා ගෙන්වපු වාහනවල සත්‍ය ඉන්වොයිස් අරගෙන බැලුවොත්, ඒ වාහන 1,675 වෙනුවෙන් රජයට අය විය යුතු මුළු බදු මුදල රුපියල් ලක්ෂ, එක්ලක්ෂ හැටදහසක් වෙනවා. මෙතැනදී කර තිබෙන්නේ ඉතාම බරපතළ වංචාවක්. ව්‍යාජ ඉන්වොයිස් පෙන්වලා, අඩු මිල ගණන් පෙන්වලා වාහන ගෙන්වලා රජයට අය විය යුතු බදු මුදලක් රජයට ලබා දෙන්නේ නැතිව බරපතළ වංචාවක් කරලා තිබෙනවා.

එම සමාගම හරහා ගෙන්වපු වාහන පිළිබඳව ඒ සමාගමේම නිලධාරියෙක් තමයි රේගුවට ඔත්තු ලබාදීලා තිබුණේ. රේගුවට ලබාදී තිබුණු ඔත්තුව මත පරීක්ෂණයක් කළා. ඒ පරීක්ෂණයෙන් ඉතා පැහැදිලිව ඔප්පු 15වැනි පිටුවට

> "පරීක්ෂණ කමිටුව සියල්ල අවසානයේදී තීන්දුව දීලා තිබෙන්නේ මේ දඩ මුදල බිලියන 1.6කට සීමා කරන්නයි. ලැබිය යුතු වූ බිලියන 16ක මුදල බිලියන 1.6 දක්වා අඩු වෙලා තිබෙනවා. කරපු ඒ වංචාව නිසා; අනුගමනය කරපු ඒ කූට උපක්‍රමය නිසා. එහෙම නම්, ඒ පිළිබඳව ඔබතුමන්ලා ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද? ඒක තමයි වැදගත් වන්නේ. රජයේ සේවකයන්ට මීට වඩා තීරු බදු සහන සහිතව, මීට වඩා තවත් වැඩි ප්‍රමාණයකට මේ සහනය ලබා දෙන්න පුළුවන්."

2017 සැප්තැම්බර් 07

# නව ආදායම් පනත නිසා කලා සංස්කෘතික ක්ෂේත්‍රයන් කාන්තාර වෙනවා

පාර්ලිමේන්තු මන්ත්‍රී
බිමල් රත්නායක සහෝදරයා

(නව දේශීය ආදායම් පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට එක්වෙමින්)



අද දිනයේදී ජනමාධ්‍යවලින් අපට දැනගන්න ලැබුණා, ලලිත් වීරතුංග මහතාට හා අනූෂ පැල්පිට මහතාට වසර 3 බැගින් සිර දඬුවම් සහ රුපියල් ලක්ෂ 20ක් බැගින් දඩ හා රුපියල් මිලියන 50 බැගින් වන්දි ගෙවන්නැයි මහාධිකරණයෙන් නියෝගයක් ලබා දීලා තිබෙන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලලිත් වීරතුංග මහතා සහ අනූෂ පැල්පිට සම්බන්ධ වෙලා, බදු මුදල් රුපියල් මිලියන 600ක් පසුගිය ජනාධිපතිවරණයේදී ඡන්ද අරමුණු සඳහා බෙදා දී මැතිවරණ ප්‍රචාරක කටයුතුවලට සම්බන්ධවීම හේතුවෙන් මේ දඬුවම් නියම වූ බව ඔබතුමා දන්නවා ඇති. නමුත්, අපි හොඳටම දන්නා දේ තමයි, ලලිත් වීරතුංග මහතා ඡන්දය ඉල්ලුවේ නැහැයි කියන එක. අනික, එතුමා ඉහළ පරිපාලන නිලධාරියෙකු වශයෙන් කටයුතු කළා. යම් කිසි පාලකයෙකු සමග එක දිගට වැඩ කිරීම නිසා එතුමාගේ නම සවුත්තු වුණා. ඒක වෙනම කථාවක්. නමුත්, එතුමා ඡන්දය ඉල්ලුවේ නැහැ. මේ බදු සල්ලි වියදම් කළේ රාජපක්ෂ මහත්තයාගේ ඡන්දයට නේ. නමුත් එතුමන්ලාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මේවාට ආවරණ ලැබිලා තිබෙනවා. නමුත් ඒ දූෂිතයන්ට, ඒ වැරදිවලට උදව් කරපු නිලධාරීන්ට අධිකරණය දඬුවම් දීලා තිබෙනවා. අපි අධිකරණයට තිබෙන ඒ අයිතිය පිළිගන්නවා. එම නිසා අපි පැහැදිලිවම කියනවා, බදු මුදල් වංචා කිරීම සම්බන්ධයෙන් අද ලබා දුන් මේ නඩු තීන්දුව ඓතිහාසික නඩු තීන්දුවක් කියලා.

මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මා තවත් කරුණක් කියන්න කැමැතියි. හිටපු ජනාධිපති ලේකම්වරයෙකුට තමයි අද හිරේ යන්න නියමිත වෙලා තිබෙන්නේ.

දැනුත් බලය අතට අරගෙන රාජ්‍ය බදු මුදල් වංචා කරනවා. ඊයේත් සඩෑ එකට ඒ විස්තර ආවා. Sri Lankan Airlines ඩොලර් මිලියන සිය ගණන් වියදම් කරනවා. කැබිනට් මණ්ඩලයේ කිසිම අනුමැතියක් නැතිව. ඒ නිසා, රටේ බදු සල්ලි හොරකම් කරන දේශපාලනඥයන්ට කත් අදින නිලධාරීන්ට සහ දේශපාලනඥයන්ටත් මේක හොඳ පූර්වාදර්ශයක් වෙයි කියලා අපි හිතනවා. මේ තීන්දුව නිසා රාජ්‍ය නිලධාරීන් කුලප්පු වෙනවා කියලා සමහර අය කියනවා. අපි පැහැදිලිවම කියනවා, රාජ්‍ය නිලධාරීන්ගෙන් සියයට 10ක පිරිසක් තමයි දූෂණයේ යෙදෙන්නේ කියලා. ඒ සියයට 10 නිසා ඉතිරි සියයට 90ම මඩ කනවා. මේක මහාධිකරණයෙන් ලබා දුන් තීන්දුවක්. ඇත්තටම මේ තත්වය ඉදිරියට ගෙන යන්න ඕනෑය කියන අදහස තමයි අපට තිබෙන්නේ.

ඊළඟට මේ පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන්නම්. මේ පනත් කෙටුම්පතේ ඉතා බරපතළ ගැටලුවක් තිබෙනවා. ව්‍යවස්ථාවේත් තිබෙන යම් කිසි බාධාවක් එක්ක. කිසිදු සහනයක් සඳහා මෙම පනත් කෙටුම්පතට කාරක සභා අවස්ථාවේදී අලුතෙන් සංශෝධන ඉදිරිපත් කරන්න බැහැ. මුදල් වැය වෙන දේවල් සම්බන්ධයෙන්. ඒක අපේ ව්‍යවස්ථාවේ තිබෙනවා. ඒක ඇත්ත. ඔබතුමා දන්නවා. මේක අයවැයක් තරම්ම විශාල පනත් කෙටුම්පතක්. මේකේ බලපෑම මුළු මහත් අයවැයක් තරම්මයි. නමුත් මෙයින් බලපෑමට ලක්වන පාර්ශ්ව ගණනාවක් ඉන්නවා. ඔවුන් සමග තවම කිසිදු සාකච්ඡාවක් කර නැහැ. බලගතු දැනුවත් පාර්ශව සමග සාකච්ඡා කර තිබෙනවා. රක්ෂණ සමාගම්, සමහර වෘත්තීය සමිතිත් එක්ක. නමුත් උදාහරණයක් වශයෙන් ගත්තොත් මේ කාරණය ගැන බලන්න. එක එක සංශෝධන පොඩි ප්‍රමාණයක් කිව්වා. නමුත් වැදගත්ම දෙය මොකක්ද? රුපියල් කෝටියේ ඒවා එක් ලක්ෂ හැට දාහක් තිබෙන, රුපියල් බිලියන 1,600ක් තිබෙන EPF එකට ඔබතුමන්ලා දැනට තිබෙන බදු මුදල තව සියයට හතරකින් වැඩි කරනවා. සියයට හතර වුණාට, හැම අවුරුද්දේම මේ අරමුදලෙන් කෝටි දහ දාහකට වඩා ලබා ගන්නා බව මතක තබා ගන්න. බලාපොරොත්තු වෙන්නේ රුපියල් බිලියන හතළිස් පහයි කිව්වා. බිලියන හතළිස් පහ ගන්නත් ඔබතුමන්ලා බිලියන දහයක් විතර වියදම් කරන්න ඕනෑ. හැම කෙනෙකුට tax file එකක් open කරනවා කියන එකට වියදමක් යන්නේ නැද්ද? ඇඩම් ස්මිත් කියා තිබෙන්නේ මොකක්ද? බදු එකතු කරද්දී ඒ සඳහා කරන වියදමට වඩා බද්ද වැඩි වෙන්නට ඕනෑ කියලායි. නිකම් ජොලියට හැම කෙනෙකුටම බදු file එකක් open කළාම, එයට වියදමක් යනවා. බිලියන 45යි expected income එක. ඒකෙන් බිලියන දහයක්ම ඔබතුමන්ලා ගන්නේ මේ EPF එකට ගහලාය කියන එක මතක තියා ගන්න. තව බිලියන 10ක් විතර ඔබතුමන්ලා වියදම් කරයි. බදුකරණය සඳහා පරිපාලන වැඩවලට. ඊට පස්සෙ ඇත්තටම ඔබතුමන්ලාට ලැබෙන්නේ කීයද? තව රුපියල් බිලියන දහයක් පහළොවක් ඒ අවශ්‍යතාවන්ට වියදම් වුණාම රුපියල් බිලියන හතළිස් පහම ලැබෙන්නේ නැහැ නේ. ඇත්තටම සිදු වන්නේ, මේක EPF එකෙන් ලබා ගන්න එකයි. අපි ආණ්ඩුවට අවධාරණය කර කියනවා, එම ඇජෟ සල්ලි තමයි අර්ජුන් ඇලෝසියස්ලායි, ඇමතිවරුයි එකතු වෙලා ඔරීමරහ ඊදබ්බි වලින් ගැහුවේ කියලා.

EPF සල්ලි තමයි, සියයට අනුවක්ම Perpctïl Tresuries Limited එකේ ආදායම. අද නාරාහේන්පිට තට්ටු තිහේ බිල්ඩින් එකක් හදනවා. මම හතන විධියට බිලියන 50කට වැඩියි වියදම. ඒත් EPF සල්ලියි.

ඉතාම වැදගත් සංශෝධනයක් තිබෙනවා, කලාකරුවන් සම්බන්ධයෙන්. කලාකරුවන්ගේ සංවිධාන රාශියක් තිබෙනවා. ඔවුන්ට මේක සුවිශාල වශයෙන් බලපානවා. එකම එක සාකච්ඡාවක්වත් මේ ගැන කරලා නැහැ. එම නිසා අපි ඉල්ලා සිටින්නේ මෙයයි. ව්‍යවස්ථාවේ තිබෙන කරුණු නිසා අපට මෙතැනදී සංශෝධන ඉදිරිපත් කරන්න බැරි වෙන්න පුළුවන්. අපි කියන්නේ මේ පනත් කෙටුම්පත අද විවාද කරලා, සම්මත කර ගැනීම සඳහා සතියකට කල් දමන්න කියලායි. අපේ සංශෝධනත්, තව තිබෙන සංශෝධනත් කැබිනට් එකෙන් අනුමත කර ගෙන මේක සම්මත කර ගැනීම සඳහා ගෙනෙන්න. මේක අයවැයක් තරම් ලොකු පනත් කෙටුම්පතක්, මේක නිකම්ම නිකම් පනත් කෙටුම්පතක් නොවෙයි.

වේදිකා නාට්‍යකරුවන්ට ඔවුන් නිෂ්පාදනය කරන නාට්‍ය සඳහා පළමු වසරේ ආදායම සියයට පණහකින් ආදායම් බද්දෙන් නිදහස් කර තිබුණා. මෙ පනත් කෙටුම්පතේ ඒ බදු නිදහස නැහැ. වේදිකා නාට්‍යය කියන්නේ, මේ රටේ කර්මාන්තයක් නොවෙයි. නාට්‍යකරුවාගේ ඇම්මට අතින් කාලා කරන වැඩක්. ඒ බදු නිදහස අයින් කර තිබෙනවා. ලේඛකයන් හා පොත් ප්‍රකාශකයන්ට පළමුවන edition එක විකුණුවාම ඒකෙන් සියයට පණහක බදු නිදහසක් මුලින් ලබා දී තිබුණා. අද ඒ බදු නිදහස නැහැ. ඔබතුමා දන්නවා. අද කවි පොත් පන්සියයක් විකිණෙන්නේ නැති බව. ඒකටත් බදු ගහනවා. සංගීත නිර්මාණකරුවන්ටත් බදු නිදහසක් තිබුණා. අද ඒකත් මේ පනත් කෙටුම්පතෙන් ඉවත් කර තිබෙනවා. බලන්න, නවෝත්පාදන සඳහා වෙහෙසන පුද්ගලයන් පර්යේෂණයක් කර අලුත් දෙයක් සොයා ගත්තොත් බදු ගහනවා. කලාකරුවන් පමණක් නොවෙයි, කෘෂි විද්‍යාඥයන් පවා බද්දට යටත් වෙනවා. ඔබතුමා දන්නවා. මොරටුව විශ්වවිද්‍යාලයේ මහාචාර්ය රංගික හල්වතුර මැතිතුමා, තුන්වන ලෝකයේ හොඳම විද්‍යාඥයා වුණු බව, මේ අනුව එතුමාටත් බද්දක් ගෙවන්න වෙනවා. මෙහෙම රටවල් හදන්න පුළුවන්ද?

ඊළඟට, චිත්‍රපට කර්මාන්තය. ලංකාවේ චිත්‍රපට දහයයි, පහළොවයි නිර්මාණය වෙන්නේ. එයින් බලන්න පුළුවන් චිත්‍රපට තිබෙන්නේ හතරයි, පහයි. මගේ දැනීමේ හැටියට කලින් බදු සහනයක් තිබුණා. රුපියල් මිලියන විසිපහකට වඩා ආදායමක් ගත්තොත් තමයි බදු ගෙවන්න ඕනෑ. දැන් සිනමා පටයෙන් පාඩු වුණත් බදු ගෙවන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මෙයයි. මේවා ඍජුවම කලා ක්ෂේත්‍රය, සංස්කෘතික ක්ෂේත්‍රය කාන්තාරයකට ගෙන යනවා. එම නිසා මේ සංශෝධන පිළිගන්න. එහෙම නැත්නම් ජනතාව වෙනුවෙන් මේ පනත් කෙටුම්පතට අපේ සම්පූර්ණ විරෝධය පළ කරන බව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා.

> "මේක අයවැයක් තරම්ම විශාල පනත් කෙටුම්පතක්. මේකේ බලපෑම මුළු මහත් අයවැයක් තරම්මයි. නමුත් මෙයින් බලපෑමට ලක්වන පාර්ශ්ව ගණනාවක් ඉන්නවා. ඔවුන් සමග තවම කිසිදු සාකච්ඡාවක් කර නැහැ. බලගතු දැනුවත් පාර්ශව සමග සාකච්ඡා කර තිබෙනවා. නමුත් උදාහරණයක් වශයෙන් රුපියල් කෝටියේ ඒවා එක් ලක්ෂ හැට දාහක් තිබෙන, රුපියල් බිලියන 1,600ක් තිබෙන EPF එකට දැනට තිබෙන බදු මුදල තව සියයට හතරකින් වැඩි කරනවා."

කවුළුව හැරමි තබමි

# බදු බරයි - දඩ බරයි බඩු මිලයි හරි සැපයි...



'අලුත් බදු පනතක් ගෙනල්ලා. රටේ හැම පුරවැසියටම බදු අංකයක් දෙනවලු' ඒ කියන්නේ හැම එකාම බදු ගෙවන්න ලැස්ති වෙයල්ලා කියන එකය. දැන් යහපාලන ආණ්ඩුව සූදානම් වෙන්නේ, රටේ ධන කුවේරයන්ට හා විදෙස් ධන කුවේරයන්ට සහන පිට සහන දෙන ගමන් රටේ අන්තිම දුප්පතාවත් යටිපතුලේ ඉඳන් සූරාගෙන කෑමටය. වෙන රටවල ජනතාවගෙන් බදු අරගෙන කරන්නේ ජනතාවගේ පොදු අවශ්‍යතා සඳහා යම් පමණකට හෝ ඒවා පාවිච්චිකරන එකය. අපේ රටේ කරන්නේ, පොඩි එකාව හම ගහලාගන්න පුළුවන් සේසතම අරගෙන මහ එවුන්ගේ සාක්කු පුරවන එකය. ලෝකයේ ධන කුවේරයෝ එකතු වෙලා අපේ රටේ මුදල් ඇමතිලාට ලෝකයේම හොඳම මුදල් ඇමතිකම දෙන්නේ ඒ නිසා වෙන්න ඕනෑය.

මෙය අපේ රට කෙනෙකුගේ උපතේ සිට විපත දක්වාම බදු ගහන රටකි. මෙහෙම ගියොත් ගෙදර ඇතිකරන බල්ලාට බලු බදුත් ගසනු ඇත. දැනටත් අප සිටින්නේ මදුරුවන්ටත් දඩ සහ බදු ගෙවමින්ය. මේ ආණ්ඩුව දැන් රටයි මිනිසුන්ගේ ලේ රීරි මාංශ උරාබීමට දත් විලිස්සාගෙන ඉන්න මකරාක්ෂයෙක් වගේය. බදු බරයි, දඩ බරයි, බඩු මිලයි ආණ්ඩුවේ ත්‍රිවිධ රත්නය වගේය. 'අපි වෙනුවෙන් අපි රට කමු. තොපිවත් කමු.' මෙය යහපාලන ආණ්ඩුවේ ආදර්ශපාඨයයි. යහපාලනය කියාගෙන ආවත් සුභ අනාගතයක් කියාගෙන ආවත් යකා යකාමය. මේක සුදු රෙදි ඇඳගත්තු (විටෙක සිල් රෙදි බෙදන) යක්ෂයින් රජකරන රටකි. යක්ෂ සාපයෙන් මිදීමට නම් රටේ ජනයාට අවුරුදු 68 ක් මළකාපු තමන්ගේ ඔළු සුද්දකර ගන්නම වෙනවාය.

# 'මාරප්පච්චි'



ලංකාව කියන්නේ හරිම අපූරු දේවල් සිදුවන රටක්ය. ඒ අරුම පුදුම දේවල් වඩාත්ම එළියට පනින්නේදේශපාලනයේදීය.ලංකාවේ කසිප්පු මුදලාලිලාට තමන් වෙනුවෙන් හිරේ යන බිලීබෝයිස්ලා ගම්වල ඉන්නවාය. කුඩු මුදලාලිලාටත් එහෙමය. මහා හොරුන්ටත් එහෙමය. පසුගියදා අහල ඉවර වුණ සිල් රෙදි නඩුවෙන් රාජ්‍ය මුදල් අවභාවිත කරමින් සිල්රෙදි බෙදපු ලලිත් වීරතුංග සහ අනූෂ පැල්පිට අධිකරණයේදී වරද ඔප්පු වුණ නිසා අවුරුදු දෙකකට හිරේ දැම්මේ බරපතළ වැඩ ඇතිවය. එහිදී සාක්ෂි දුන් එවුන් කිව්වේ එදා ජනාධිපති මහින්දගේ නියෝගයක් මත එහෙම කළා කියලාය. ඒ දෙන්නා හිරේ දැම්මට පස්සේ මහින්ද කියන්නේ, ඔවුන්ට නියෝග දුන්නේ තමන් තමයි කියලාය. මහින්දට අවංකවම ඔවුන් දෙන්නා බේරා ගන්න ඕනෑකම තිබුනනම් ඒක කියන්න තිබුණේ ඔවුන්ට චෝදනා ඉදිරිපත් වෙච්ච ගමන්මය. මහින්ද ගේමක් දීලා බොරුවට රඟපාන්න හරිම දක්ෂයාය. එයා මීට කළිනුත් චිත්‍රපටිවල රඟපාලා තිබෙන්නේය. විධායක ජනාධිපතිවරයාට එරෙහිව නීති ක්‍රියාමාර්ග ගන්න බැහැ කියලා ඔහු හොඳටම දන්නේය. එහෙම තියෙද්දී මහින්ද හදන්නේ, තමන්ගේ ගෝලයෝ බිල්ලට දීලා ඊට පස්සේ ඒ සිද්ධියේදීත් තමන්ට ලකුණු දාගන්නය. ඊට පස්සේ මහා හොරා එළියේ ලිට්ල් ජෝන්ලා ඇතුලේය. ඊට පස්සේ ලිට්ල් ජෝන්ලා දෙන්නත් ඇප දීලා එළියේ මහින්දගේ ලණු කාපු කී දෙනෙක් දැනට අමාරුවේ වැටිලා ඉන්නවාද? ඒවා කෙසේ වෙතත් මේ රටේ නීතිය ක්‍රියාත්මක වන විදිහත් දැන් මුළු ලෝකයාම දැනගෙන හමාරය. එය පොඩි එකාට එක විදිහකි. ලොකු එවුන්ට තව විදිහකි. රටේ මහ හොරු ඕනෑම කුපාඩි වැඩක් කරලා පන්සල් ගියාම ඔක්කොම ඉවරය. පාවාදීමේ හොඳම විදිය ඉගෙන ගත හැක්කේ මහින්දගෙන්ය. මේවා ගැන වගක් නැතිව ඉන්න පුළුවන් මොළයේ පෝලියෝ හැදිච්ච එවුන්ට විතරය.

# වැඩිහිටි 'සිඟිති සුරතල්'



"මම ලංකාවට ආවට පස්සේ මගේ බෑණගෙයි දුවගෙයි ගෙදර අපි එකට එකම කෑම මේසෙයේ කෑම කෑවා තමයි. හැබැයි මහ බැංකු බැඳුම්කර සිද්ධිය ගැන මම මාගේ බෑනා එක්කවත් කවදාවත් කථා කරලා නෑ. ඒ ගොල්ලොත් මාත් එක්ක කථා කරලා නෑ."

මෙහෙම කියන්නේ හය හතර නොතේරෙන පොඩි එකෙකුත් නොවේය. තොත්ත බබෙකුත් නොවේය. හිටපු මහ අධිපති අර්ජුන් මහේන්ද්‍රන්ය. රනිල් එක්ක එකතු වී ඔහු දුන්න ගේම දැන් දැන් මුළු රටම දනී. ඔහුගේ ගෝල බාලයෝ බැඳුම්කර කොමිෂම ඉදිරියේ දැන් ඒ සියල්ල වමාරති. එත් එම කොමිෂම ඉදිරියේ අර්ජුන මහේන්ද්‍ර රඟපාන්නේ කටේ කිරි සුවඳවත් නොගිය කුක්කු පැටියෙක් සේය. අනෙක් පුදුමය නම් මේ රටේ මෙතෙක් සිද්ධ වෙච්ච ලොකුම හොරකම කරපු එකාව ආරක්ෂා කිරීමට රටේ සමහර කළුකෝට්ධාරීන්ද ඉදිරිපත්වීමය. එකඅතකට පුදුමයක් නැත. ධනවාදය යනු ක්ලීන්ෂූට් එක ගහගෙන පීඩිතයන්ගේ පොකැට් එකට විදින සමාජ ක්‍රමයකි. විදේශයක පුරවැසියකුට මහ බැංකු අධිපතිකම් දී රනිල් එදා කීවේ ඔහු අති දක්ෂයකු බවය. එක අතකින් එය ඇත්තකි. මෙතරම් කෙටි කාලයකින් මෙච්චර ගේමක් දෙන්න අදක්ෂ හොරෙකුට බැරිය. හොරුන්ට සහතික දෙන්නේ ඊටත් වඩා හොරුන්ය. රට පාලනය කරන හොරුන් කිරෙන් නාද්දී ගොවියෝ වස බොති. දරුවෝ සාගින්නේ මියෙති. උන්ගෙන් සියයට විසිදෙකක් මන්දපෝෂිතයෝය. රටේ ජනයා විඳින දුක ගැන අටුවා ටීකා අවශ්‍ය නැත. ඒ දුකට හේතුව මහේන්ද්‍රන්ලාගේ පංතිය බව කවදා මිනිසුන් තේරුම් ගනු ඇත්තේ කවදාද?

# පොලිටිකල් පංතිය

පොලිටික්ක පංතියට ඇතුල් වෙද්දි පාපිස්සෙ පය ගහපු විදිහ මොන තරම් සද්දෙට ඇහුණද කියනවනම් කට්ටිය කතාව නැවැත්තුවෙ කවුරු හරි පොල් ගෝනියක් අතෑරිය කියල.

"ගුඩ් මෝනිං ස....ර්" වසන්තිය ඇද...ල කිවුවෙ සැර බාල කරන්න හිතල.

"අද සර් ලස්...සන ෂර්ට් එකක් ඇඳලා" අනුරුද්ධියත් ඇරියෙ නෑ.

"මෝනිං ළමයිනේ...අපි ලස්සන වුණාට වැඩක් තියෙනවද ළමයො රටේ අවලස්සන වැඩ වෙනකොට" පොලිටික්ක ළඟ නැමුව.

"ඒ වුණාට සර් වර්ල්ඩ් රෙකෝඩ් එක අපිටනෙ. කාටද ආඩම්බර?" කනිය අන්දෝ සංසාරයක් නතුව උත්තරයක් බැන්ද.

"ඈ ළමයො, මොකක්ද ඔය හරුපෙ තේරුම. මොකද්ද අවලස්සන වර්ල්ඩ් රෙකෝඩ් එක?" පොලිටික්කත් අන්දුන් කුන්දුං.

"ඇයි සර් දිගම සාරි පොටේ කේස් එක. මං හිතුව සර් අවලස්සන වැඩේ කිවුවෙ ළමයි සාරි පොට අල්ලන්න දාපු එකට කියල." කනිය වටපිට බැලුවෙ උදව් ඉල්ලන්න වගේ.

"ඔව් සර් හුඟක් අය කියල තිබුණ ඉස්කෝල ළමයි ගත්ත ඒක කැත වැඩක් කියල." ජයන්තියත් පොලිටික්කගෙ 'අවලස්සන' වැඩේ තේරුම් කළා.

"මං කිවුවෙ අවලස්සන වැඩ කිවුවෙ ඒවට නෙමෙයි ළමයිනේ." පොලිටික්ක කතාව ට්‍රැක් එකට ගන්න හදනව. "දැන් බලන්න, ජනතාවගෙ පරමාධිපත්‍ය බලය... ඔයගොල්ලො දන්නවනෙ ඒක..." පොලිටික්ක පොඩ්ඩකට වටපිට බැලුව.

"ඔව්...ඔව් සර් අර 'පාර දිගේ' චිත්‍රපටියෙ මාලනී කියන්නෙ 'කාටවත් නොතේරෙන කුණුහබ්බයක්' කියල. ඒක අපි දන්නව" මංජුව කින්ඩියට කණවැල ඇල්ලුව.

"ඇති. ඇති...ඔය දන්න තරම ඇති." පොලිටික්කට අහපු මෝඩකම කියල හිතුණ. "එක ජනතාවගෙ අයිතිය. ඒකට අත තියන්න කාටවත් බෑ. දැන් මේ ආණ්ඩුවෙ ලොක්කො හිතාගෙන ඉන්නෙ පරමාධිපත්‍යය තියෙන්නෙ තමුන් ළඟ කියල" පොලික්කෙ හිතේ හිරකරගෙන හිටිය දේවල්වලින් ටිකක් විතර එළියට දැම්ම.

"සහතික ඇත්ත සර්.. මහින්ද මහත්තයත් ඕක තමන්ගෙ අතේ තියාගෙනනෙ හිටියෙ." සමනට කියල ඉවරකරන්න හම්බවුණේ නෑ.

"හානේ අර කට්ටිය වශී බොලෙ කිය කිය හිටියෙත් ඒකද..." වෙන කතාවක ඉඳල අනුරුද්ධිය කඩා පැන්න.

"ඔව් මහින්ද මහත්තයත් පරදිනකම්ම හිතාගෙන හිටියෙ එහෙම තමයි." සමන කිවුවෙ පොලිටික්කගෙ කට නලියන අතරෙ.

"නැහැනෙ ළමයො දැන් බලන්න මිනිස්සුන්ට සිල් රෙද්දක් දුන්නටත් හිරේ දාන්න බලන්නෙ. මිනිස්සු ඉල්ලන වෙලාවට ඡන්ද නැහැ, කල්දානව. ඉතින් මේ උල්ලංඝනය වෙන්නෙ පරමාධිපත්‍ය බලය. " පොලිටික්ක තියරි හදනව.


"සිල් රෙදි බෙදිල්ලයි පරමාධිපත්‍යයයි අතරෙ සම්බන්දෙ මොකද්ද සර්" කනිය අහිංසක මූඩ් එකෙන් ඇහුව.

"ඒ මෙහෙමනෙ. සිල් රෙදි ගන්න මිනිස්සුන්ට අයිතියක් තියෙනව. මහින්ද මහත්තයට බෙදන්න අයිතිය තිබුණා. ඡන්දෙද නැද්ද කියල නෑ මහින්ද මහත්තය බෙදුව. අනික ඡන්ද කල් දැම්මෙ නෑ, ඉල්ලන්න කලින් ඡන්දෙ තිබ්බ."පොලිටික්ක පර්පෙචුවෙල් සමාගමේ නීතීඥයෙක් වගේ නිදහසට කරුණු කියනව.

"මහින්ද මහත්තය ඕනෙ රෙද්දක් බෙදුවට කමක් නැහැ, මැදමුලන වලව්වෙ පෙට්ටමේ සල්ලිවලින් නම්. මේවා අපේ සල්ලි. තවත් ප්‍රශ්නයක් ඡන්දෙ අස්සෙ බෙදන එක. අල්ලස් දෙන එක මැතිවරණ නීතියෙන් තහනම්. නීති විභාගෙ ප්‍රශ්න පත්තරේට 100% ගත්තු පුතාගෙන් ඇහුවනම් කාගෙන් හරි අහල කියල දෙනවනෙ. අනෙක මහින්ද මහත්තය ඡන්දෙ තිබ්බෙ දාන් අදිනව වගේනෙ. පස්සෙ අදින ඉත්තො පස්සෙ ඇද්ද. කලින් අදින්න ඕනෙ ඒවා කලින් ඇද්ද. අවුරුදු තුනටත් සමහර පළාත් සභා විසුරෝල ඡන්ද තිබ්බෙ මිනිස්සුන්ට ආදරේට නෙමෙයිනෙ. අනික අධිකරණෙ උපරිම නැවුව. නැවෙන්නෙ නැති තැන කොන්ද අයින් කළා. අර පරමාධිපත්‍යය අතේ හරි සාක්කුවෙ හරි තියෙනව කියල හිතාගෙන වෙන්න ඇති..." සමනගෙ නන්ස්ටොප් කතාව ඇතුළෙ පොලිටික්ක ඉතුරු ටික එළියට නොදාන්න තීරණය කළා.

## ඔක්තෝබර් විප්ලවයේ...

03 පිටුවෙන්



අවස්ථාවාදී කොටස් විසින් ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයේ ජයග්‍රහණය ආපසු හරවනු ලැබූවත් අපි හිතනවා, ඔක්තෝබර් විප්ලවයේ ජයග්‍රහණ මකා දමන්න බැරි බව. විශේෂයෙන්ම දෙවන ලෝක යුද්ධයේදී සෝවියට් දේශය නොසිටින්න හිට්ලර්ගේ නාසි හමුදාව ලෝකයම යටත්කර ගන්නවා. ඒ නිසා දෙවැනි ලෝක යුද්ධයේදී විශාල කැපකිරීමක් කරලා තමන්ගේ රටේ පුරවැසියො කෝටි දෙකකට කිට්ටු ප්‍රමාණයක් මිය යද්දී සෝවියට් දේශය සමත්වුනා, සමාජවාදයත් රැකගෙන නාසිවාදය පරද්දන්න. ඒ අනුව ඔක්තෝබර් විප්ලවය ලෝකයට දායද කළ දේවල් බොහොමයි.

අපේ රට ගත්තාම බොහෝ රටවල් අපේ රටට උදව්කරන්නේ පටු අරමුණු තියාගෙන. නමුත් සෝවියට් දේශය තමයි ලංකාවේ 1970 කාලයේ තිබූ ආණ්ඩුවලට තමන්ට කිසිම ආර්ථික ලාභයකින් තොරව උදව් උපකාර කළේ. සෝවියට් දේශයෙන් අපට ලැබුණු කර්මාන්ත බොහොමයක් තිබුණා. වානේ කම්හල, ටයර් කම්හල, තුනීලැලි කම්හල වැනි කම්හල් ගණනාවක් අපට සෝවියට් දේශයෙන් නොමිලේ ලැබුණා. අනික් පැත්තෙන් ගත්තාම මාක්ස්වාදී පොතපත පළකරමින් මාක්ස්වාදය පතුරුවා හැරීම සඳහා සෝවියට් දේශය කරපු කාර්ය බොහෝයි.

එසේ ගත්විට සෝවියට් දේශය පවතිද්දී ලෝකයට කරපු බලපෑම ඉතාමත් ඉහළයි කියන්න පුළුවනි. අනෙක් අතට දැන් සෝවියට් දේශය බිඳවැටීමේ යථාර්ථය තුළ අධිරාජ්‍යවාදය විශාල අර්බුදයකට ගිහින් තිබෙනවා. අධිරාජ්‍යවාදීන් ලෝකය තමන් යටතේ පවත්වා ගැනීමට විශාල විනාශයක් කරගෙන යනවා. අද ලෝකය පුරාම ජාතිවාදී ගැටුම් ආගමික ගැටුම් නිර්මාණය වෙලා, විවිධ ලෙඩදුක් හැදිලා මිනිස්සු මිය යමින් පවතිනවා. පරිසරය විනාශවෙමින් පවතිනවා. එනිසා ජනතාවට මරණය උරුම කරපු ධනවාදය, අධිරාජ්‍යවාදය වෙනුවට නැවත මිනිසුන්ට ජීවිතය, සිනහව, සතුට ගේන්න, සමාජවාදය එන්න ඕනෑ. එහිදී නැවත සමාජවාදය පිළිබඳව, සමාජවාදී දර්ශනය පිළිබඳව, මාක්ස් ලෙනින්වාදය පිළිබඳව, ජනතාව තුළ සංවාදයක් ගොඩනැගීම ඉතාමත් වැදගත් කියලා අපි හිතනවා, ඒකට හොඳම අවස්ථාව තමයි මේක.

ඔක්තෝබර් විප්ලවයට වසර 100ක් පිරෙන මේ අවස්ථාවේ. ලංකාවේදී අපි ඔක්තෝබර් විප්ලවයේ සියවස් සමරුව ඉතාමත් ඉහළින් සමරන්න කටයුතු සූදානම් කර තියෙනවා. විශේෂයෙන් ඔක්තෝබර් මාසෙ 27, 28 දින දෙකේ විහාරමහදේවී එළිමහන් රංගපීඨය යොදාගනිමින් සෝවියට් දේශය ගැන ප්‍රදර්ශනයක්, පොත් එළිදැක්වීමක්, සංවාද සාකච්ඡා රැසක් ආදියෙන් සමන්විත වැඩසටහන් මාලාවක් සූදානම් කර තිබෙනවා. විශේෂයෙන්ම රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ නියෝජිතයනුත් තානාපතිවරුත් අපේ රටේ සමාජවාදය පිළිබඳ විශ්වාස කරන බුද්ධිමතුන්, සෝවියට් දේශයේ - කියුබාවේ ඉගෙන ගත්ත උගතුන්, කලාකරුවන් මෙයට සම්බන්ධ වේවි. ජනතාවට දැනෙන ලෙස ඉතාමත් ඉහළින් ඔක්තෝබර් විප්ලවය සැමරීමට කටයුතු සූදානම් කර තියෙනවා. අපි හිතනවා ඒ සමග අපේ රට තුළ නැවත සමාජවාදය පිළිබඳව සංවාදයක් ආරම්භ කර ගන්න පුළුවන් වේවි කියලා. එය අපිට අත්‍යාවශ්‍යයි.

දැන් අපේ රට අවුරුදු 70ක පමණ කාලයක් මේ බංකොලොත් ධනපති මාවතේ දිගට ඇවිත් තියෙනවා. ධනපති පක්ෂ දෙකත් මාරුවෙන් මාරුවට මේ රටේ පාලන බලයට පත්කරලා රට විනාශ කරලා තියෙන්නේ. රටේ අපරාධ වැඩිවෙලා. හොරකම් වංචා දූෂණ වැඩිවෙලා. දුප්පත්කම වැඩිවෙලා. ණය බර වැඩිවෙලා. ඊළඟට හොරුන්ව රකින සංස්කෘතියක් හදලා. මේ නිසා තවදුරටත් ලංකාවට මේ මාවතේ මෙහෙම යන්න බැහැ. ඒනිසා මේ මගින් අපි ඉවත්වෙන්න ඕනෑ. සමාජ සංවර්ධනය, සමාජ සාධාරණත්වය තියෙන මඟකට අපි යන්න ඕනෑ. ඒ සඳහා ජනතා බලවේගයක් අපි නිර්මාණය කරන්න ඕනෑ. එවැනි බලවේගයක් නිර්මාණය කිරීමේදීත් ඔවුන්ට සමාජවාදය පිළිබඳ විශ්වාසය, සමාජවාදය පිළිබඳ බලාපොරොත්තුව, සමාජවාදයට ප්‍රශ්න විසඳන්න පුළුවන් කියන සත්‍යය තහවුරුකිරීම වැදගත් වෙනවා. ඒ හැම අර්ථයෙන්ම ගත්තොත් අපි හිතනවා, ඔක්තෝබර් විප්ලවයේ සියවස් සැමරුම අපිට ඉතාමත් වැදගත් එකක්. අපි හැමෝටම ආරාධනා කරනවා ඒ සඳහා සහභාගි වෙන්න කියලා.

***නියමුවා:- වත්මන් ආණ්ඩුව තුළත් පොදුවේ ලාංකේය ධනේශ්වර දේශපාලනය තුළත් අරාජික සහ අවිනිශ්චිත දෝලනයන් පෙන්නුම් කෙරෙනවා. මෙහිලා හොඳම නිදසුනක් ලෙස පළාත් සභා මැතිවරණය සම්බන්ධ අවිනිශ්චිත තත්වය සහ නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ කථිකාව දැකිය හැකියි. මේ තත්වය පිළිබඳ ජ.වි.පෙ. කියවීම කෙබඳුද?***

*ටිල්වින් සිල්වා සහෝදරයා:-* ලංකාවේ වර්තමානයේ තියෙන්නේ ජනතාව හදපු ආණ්ඩුවක් නොවෙයි. අටවගත්ත ආණ්ඩුවක් තියෙන්නේ. අපි කවුරුත් දන්නවා 2015 ජනාධිපති මැතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහත්තයා පැරදුණා. පැරදුණාට පස්සේ ආණ්ඩුවක් හැදුණේ නැහැ. ආණ්ඩුවක් හදන ඡන්දයක් තිබ්බේ 2015 අගෝස්තු මාසයේ. ඒ මැතිවරණයේදී අපේ රටේ ජනතාව, අපේ රටේ ධනපති දේශපාලන පක්ෂ දෙකෙන් එකකටවත් ආණ්ඩුවක් තනියෙන් හදාගන්න බලය දුන්නේ නැහැ. එහි ප්‍රතිඵලය වුණේ එක්සත් ජාතික පක්ෂයයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි එකට එකතුවෙලා හවුලේ ආණ්ඩුවක් අටවා ගත්තා. ඒ නිසා මේ හවුල් ආණ්ඩුව අටවාගත්ත මොහොතේ සිටම අරාජිකත්වයක් තිබුණා; අවුලක් තිබුණා. ඒනිසා මේ ආණ්ඩුවේ නොහැකියාව, හවුල විසින් හදන අවුල විසිනුත් ආණ්ඩුවේ කටයුතු හොඳින් සිද්ධවෙන්නේ නැතිව තිබුණා. අනෙක් පැත්තෙන් අපේ රටේ ධනවාදය පිරිහීම නිසා ධනපති පංතිය තනියෙන් ආණ්ඩු හැදුවත්, හවුලේ ආණ්ඩු හැදුවත්, මොන විදියෙන් ආණ්ඩු හැදුවත් ධනපති පංතියට, ධනපති ආණ්ඩුවට ධනපති පාලනයටත් අපේ රටේ ප්‍රශ්න විසඳන්න බැහැ කියන එක දැන් තහවුරු වෙලා තියෙන්නේ. ඒ නිසා මේ තියෙන අර්බුදයේ හේතුව ආණ්ඩුව හවුල් එකක්වීම පමණක් නොවෙයි. හවුල් ආණ්ඩුවක් වුණා වගේම අනෙක් පැත්තෙන් මෙය ධනපති ආණ්ඩුවක් වීමත් මේ අර්බුදයට හේතුවෙලා තියෙනවා.

මැතිවරණ පැවැත්වීම පිළිබඳව ප්‍රශ්නයේදීත් ආණ්ඩුව විශාල අර්බුදයකට පත්වෙලා තියෙනවා. කවුරුත් දන්නවා පළාත් පාලන මැතිවරණය පවත්වන්න තිබුණේ 2015 කියා. නමුත් ජනාධිපතිවරණය නිසා ඒක කල්දැම්මා. ඊට පසුව 2016දීත් පැවැත්වුවේ නැහැ. නැවත කල්දැම්මා. ඒනිසා පළාත් පාලන මැතිවරණය, බිමේ ඡන්ද දායකයාගේ නියෝජිතයන් පත්කර ගන්න අත්‍යාවශ්‍ය මැතිවරණය අවුරුදු 2ක් කල්දාලා තිබෙනවා. ඒ නිසා එක අනිවාර්යයෙන්ම පැවැත්විය යුතුව තිබුණා. නමුත් ගැටලුවක් තිබුණා. මහින්ද රාජපක්ෂ පාලන කාලය තුළ බැසිල් රාජපක්ෂ මහත්තයල මැදිහත්වෙලා ඔවුන්ට පමණක් වාසි සැලසෙන විදියට අලුත් මැතිවරණ ක්‍රමයක් සකස්කර තිබුණා. එය ද්විපක්ෂ ක්‍රමයක් නිර්මාණය වෙන ක්‍රමයක්. ඒ මැතිවරණ ක්‍රමයට අපේ රටේ බොහෝ දේශපාලන පක්ෂ විරුද්ධවෙලා තිබුණා. ඒ නිසා අවසානයේ අපට සිදුවුණා විශාල විරෝධයක් පළ කරලා මේ මැතිවරණ ක්‍රමය නැවත වෙනස් කර ගන්න. කොට්ඨාශ සහ සමානුපාතික ක්‍රමයකට.

අපි හිතනවා තිබුණ එකට වඩා සාපේක්ෂව වඩා සාධාරණ ක්‍රමයක් දැන් හදාගන්න පුළුවන් වුණා කියා. ඒ අතර අපේ රටේ පළාත් සභා 3ක නිල කාලය අවසාන වෙමින් තිබුණා. ඒ නිසා පළාත් පාලන මැතිවරණය කලින් තැබීමට නොහැකි තත්වයක් මතුවුණා. මේ තත්වය මත පළාත් සභා වරින් වර පැවැත්වීම වෙනුවට එකවිට පැවැත්වීමත් පළාත් පාලන ඡන්ද සඳහා සකස්කල නව මැතිවරණ ක්‍රමය පළාත් සභා සඳහාද යොදාගැනීමත් කළ යුතු වුණා.

පළාත් සභා මනාප ඡන්ද ක්‍රමයට පැවැත්වීම හා එක එක ඡන්දවලට එක එක ඡන්ද ක්‍රම තිබීම දැන් සාධාරණ වන්නේ නැහැ. ඒ වගේම පළාත් සභා 3ක ඡන්දය නිසා රට පුරාම පැවැත්විය යුතු වසර 2ක් කල්ගිය පළාත් පාලන ඡන්දය තවත් කල්යෑමට ඉඩදිය යුතුත් නැහැ. මේ අනුව තමයි අපි පළාත් සභා පනත සංශෝධනයට පක්ෂව ඡන්දය දුන්නේ. දැන් ලබන ජනවාරිවල පළාත් පාලන මැතිවරණය පවත්වා ඊළඟට නව මැතිවරණ ක්‍රමයට අනුව (එය බැසිල් රාජපක්ෂලා සකස්කළ ද්විපක්ෂ මැතිවරණ ක්‍රමය නෙමෙයි) කොට්ඨාශ වෙන්කර ලබන වසරේ මැද පළාත් සභා ඡන්ද පැවැත්වීමටත් හැකියාව තිබෙනවා. ආණ්ඩුවට විශාල බලපෑමක් කරලා මේ වන විට පළාත් පාලන මැතිවරණය ජනවාරි මුලදී පවත්වන්න අවශ්‍ය වටපිටා හදාගන්නත් පළාත් සභාවලට නව ඡන්ද ක්‍රමය ගෙනල්ලා කාන්තා නියෝජනය පවා ඇතුළත් කරලා එයත් ලබන අවුරුද්දේ මැදවන විට පැවැත්වීමට හැකියාව ලැබෙනසේ මැදිහත්වීමට අපට හැකිවෙලා තිබෙනවා.

***නියමුවා:- මැතිවරණ පැවැත්වෙන විට නැවතත් පුරුද්දට පරණ කඳවුරුවලට ජනතාව ඇදීමට ඇති ඉඩ වළකා ජ.වි.පෙ. වෙත යොමු කරගැනීම සඳහා වන වැඩපිළිවෙළ මොකක්ද?***

*ටිල්වින් සිල්වා සහෝදරයා:-* මැතිවරණය පැවැත්වෙන නිශ්චිත දින නියමකර නැති එක ඇත්ත. නමුත් අපි හිතනවා ඉතා ඉක්මනින් දින නියම වේවි. අපිට හිතෙන විදියට ජනවාරි මාසේ මුල් සතිය හෝ ඊළඟ සතිය තුළ අනිවාර්යයෙන් පළාත් පාලන මැතිවරණය එනවා. දැනට ආණ්ඩුවේ අගමැතිවරයා කියා තිබෙන්නේ පළාත් සභා මැතිවරණය සඳහා මේ සංශෝධනයට අනුව කොට්ඨාශ වෙන්කර මාර්තු මාසය වෙනකොට පළාත් සභා ඡන්දයත් තියනවා කියලා. මොනව වුවත් අපි ඡන්ද ජය ගන්න උත්සාහ කරන්න ඕනෑ.

දැන් අපිට ඉක්මනින් එන මැතිවරණය තමා පළාත් පාලන මැතිවරණය. ඒක බිම් මට්ටමේ ජනතාවගේ ශක්තිය හදන මැතිවරණය. එනිසා ජනතා විමුක්ති පෙරමුණ මේ මැතිවරණය සඳහා ඉතා හොඳ සූදානමක ඉන්නවා. මේ වනවිට බිම්මට්ටමේ ජනතාව ඒකරාශි කිරීම සඳහා ගම් මට්ටමින් දිරිය පුරවැසි සමිති ගොඩනැගීමේ කටයුතු කරගෙන යනවා. ඒ කටයුතු සාර්ථකයි. මේ වනවිට දිරිය පුරවැසි සමිති දිස්ත්‍රික් සමුළු පැවැත්වීම ආරම්භ කළා. දැනට අපි දිස්ත්‍රික් 14කට වැඩි ප්‍රමාණයක මේ සමුළු පැවැත්වූවා. අපි බලාපොරොත්තු වෙනවා, ඔක්: මාසේ මැද වගේ වන විට හැම දිස්ත්‍රික්කයකම සමුළු පවත්වා අවසන් කරන්න. විශේෂයක් ලෙස මේ හැම සමුළුවක්ම අතිශය සාර්ථකයි. විශාල ජන සහභාගිත්වයක් විශාල උනන්දුවක් තියෙනවා. ඒ නිසා අපේ සමාජයේ බිම් මට්ටමේ සිටම සමාජය වෙනස්කිරීම සඳහා වූ උනන්දුවක් ජනතාව තුළ නිර්මාණය වී තිබෙනවා. හේතුව තමා වසර 70කට කිට්ටු මේ ධනපති පාලනය මිනිසුන්ට සියලු බලාපොරොත්තු විනාශ කරලා තිබෙන්නේ.

අද දරුවන්ට අධ්‍යාපනය නැති, රෝගීන්ට බෙහෙත් නැති, ප්‍රවාහන පහසුකම් නැති, ඉන්න හිටින්න තැනක් හරියට හොයාගන්න බැරි, දරුවන්ට රැකියාවක් නැති, බලාපොරොත්තු සුන්කරපු සමාජයක් නිර්මාණය කරල තියෙනවා. අනික් පැත්තෙන් අපරාධ වැඩිවෙච්ච, මත්ද්‍රව්‍ය වැඩිවෙච්ච, කුඩු වැඩිවෙච්ච, හොරකම වැඩිවෙච්ච, මිනිසුන්ට මිනිස්කම නැතිවෙච්ච, මේ ලෙඩ දුක්වලින් මියයමින්, දුප්පත්කමින් පීඩා විඳිමින්, අපරාධවලින් පීඩා විඳිමින් මිනිසුන්ට තවදුරටත් ජීවත්වෙන්න පුළුවන්කමක් නැහැ.

අද අපේ රටේ රට පාලනය කරපු දේශපාලන පක්ෂ දෙකම එකයි, 'එක වල්ලේ පොල්' කියන එක රටේ ජනතාවට අවබෝධයක් තිබෙනවා. මේ සියලු කරුණු නිසා අපි හිතනවා ජනතාව තුළ කිසියම් වෙනස්වීමක් සඳහා උනන්දුවක් නිර්මාණය වී තිබෙනවා. මේ තත්වය තුළ අපි ජනතාවට කියන්නේත් අවුරුදු 70ක අතීත අත්දැකීමෙන් ඉගෙන ගෙන අපේ රට අලුත් මඟකට ගෙනියන්න නව දේශපාලන බලයක් නිර්මාණය කරගත යුතු බවයි. ඒ සඳහා ජනතා විමුක්ති පෙරමුණ සමග අත්වැල් බැඳගන්නැයි අපි ආරාධනා කරනවා. අපි බලාපොරොත්තු වෙනවා මේ තියෙන පළාත් පාලන මැතිවරණයේදී ජනතා විමුක්ති පෙරමුණ ශක්තිය වැඩිකර ගන්න.

ඒ වගේම 2020දී මහ මැතිවරණයක් එනවා. ඒ මහ මැතිවරණයෙන් අපේ රට වෙනස් කිරීම අරමුණු කරගත්ත දේශපාලන බලවේගයක් දේශපාලන මධ්‍යස්ථානයක් අපි ගොඩනගමින් ඉන්නවා. අන්න ඒ ගොඩනගන දේශපාලන මධ්‍යස්ථානයට දැවැන්ත ශක්තියක් එකතුකර ගැනීම සඳහා අපිට මේ පළාත් පාලන මැතිවරණය පාවිච්චි කරන්න පුළුවනි. ඒ නිසා පළාත් පාලන මැතිවරණයෙන් ජනතා විමුක්ති පෙරමුණට විශාල බලයක්, විශාල ශක්තියක් ගැනීම, ලබාදීම අත්‍යාවශ්‍යයි. අපි ජනතාවට කියනවා ඒ ශක්තිය අපට ලබාදෙන්න කියලා.

## තීරු බදු සහන...

13 පිටුවෙන්

වුණා, එකම චැසි අංකයට ඉන්වොයිස් පත්‍ර දෙකක් නිකුත් කර තිබෙනවා කියලා. චැසි අංකය එකමයි. හැබැයි, ඉන්වොයිස් දෙකක් තිබෙනවා. එකක් සත්‍ය ඉන්වොයිස් එක, අනික් එක ව්‍යාජ ඉන්වොයිස් එක. "Navigare International GmbH" කියන ව්‍යාජ කොම්පැනිය ස්ථාපිත කරලා. ඒ ව්‍යාජ ඉන්වොයිස් එක ගෙන්වාගෙන, ඒක Sri Lanka Customs එකට පෙන්වලා රජයට ලැබිය යුතු රුපියල් බිලියන 16ක බදු මුදලක් වංචා කරලා තිබෙනවා.

මෙය මීට කලින් -2011 ඉඳලා 2014 දක්වා- ගෙන්වූ වාහනවලටත්, ඊට පසුව ගෙන්වූ වාහනවලටත් අදාළ සිද්ධියක්. හැබැයි මෙය යට ගහන්න මැදිහත් වූ නිලධාරීන් පිළිබඳව පරීක්ෂා කරන්න හිටපු මුදල් ඇමතිවරයා අසමත් වෙලා තිබෙනවා. හිටපු මුදල් ඇමතිවරයාගේ පැත්තෙන් පත් කරපු අධ්‍යක්ෂ ජෙනරාල්වරයා, ඒ හරහා පත් කරපු පරීක්ෂණ කමිටුව සියල්ල අවසානයේදී තීන්දුව දීලා තිබෙන්නේ මේ දඩ මුදල බිලියන 1.6කට සීමා කරන්නයි. ලැබිය යුතු වූ බිලියන 16ක මුදල බිලියන 1.6 දක්වා අඩු වෙලා තිබෙනවා. කරපු ඒ වංචාව නිසා; අනුගමනය කරපු ඒ කූට උපක්‍රමය නිසා. එහෙම නම්, ඒ පිළිබඳව ඔබතුමන්ලා ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද? එයින් රජයට, මේ රටේ මහ ජනතාවට ලැබිය යුතු බිලියන 16ක මුදල ලබා ගන්න ඔබතුමන්ලා ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද? ඒක තමයි වැදගත් වන්නේ. රජයේ සේවකයන්ට මීට වඩා තීරු බදු සහන සහිතව වාහන දෙන්න පුළුවන්. රජයේ සේවකයටන්ට මීට වඩා තවත් වැඩි ප්‍රමාණයකට මේ සහනය ලබා දෙන්න පුළුවන්. එවැනි මහා පරිමාණ බදු වංචා නතර කරන්න පුළුවන් නම්. නමුත් ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මොකක්ද? සමාගම් කිහිපයක් අවුරුදු ගණනක් තිස්සේ මේ කූට ව්‍යාපාරය සිද්ධ කරනවා. ඇත්තටම ගත්තොත්, ඒ බලපත්‍රය අරගෙන රජයේ සේවකයා එය නැවත විකුණනවා. එයින් රජයේ සේවකයාට වාහනය ගෙන්වන්න ලැබෙන්නේත් නැහැ. රජයේ සේවකයාට තිබෙන ආර්ථික අමාරුකම්, අග හිඟකම් නිසා රජයේ සේවකයා රුපියල් ලක්ෂ 14කට, 15කට ඒ permit එක විකුණනවා. ඒ permit එක පාවිච්චි කරලා මහා පරිමාණ business එකක් සිද්ධ වෙනවා. අවසානයේදී රජයේ සේවකයාට වාහනයක් ගන්න තිබෙන අවස්ථාවත් අහිමි වෙනවා.

මේ රටේ ජනතාවට ලැබිය යුතු බිලියන 16ක මුදල මේ රටේ ජනතාවට නැවත ලබා ගැනීම සඳහා වූ සාධාරණ මැදිහත් වීමක් අත්‍යවශ්‍ය වෙනවා; කඩිනම් මැදිහත් වීමක් අත්‍යවශ්‍ය වෙනවා. එහෙම වුණොත් තමයි රජයේ සේවකයන් වැඩි ප්‍රමාණයකට තීරු බදු සහන සහිත වාහන ලබා දෙන්න පුළුවන් වන්නේ; උතුරු පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ට පමණක් නොවෙයි, අනෙකුත් සියලුම මන්ත්‍රීවරුන්ටත් ඒ සහනය සහිත වාහන බලපත්‍රය ලබා දෙන්න පුළුවන් වන්නනේ. රජයේ සේවකයන්ගෙන් එක් කොට්ඨාසයකට විතරක් මෙය ලබා දෙන්න සිද්ධ වන්නේ, මෙවැනි බදු වංචා සිද්ධ වන නිසායි. ඒ නිසා ඒ බදු වංචා නතර කරලා ඒ මුදලත් නැවත රජයේ සේවකයන්ට ලැබෙන ක්‍රමයක් ඇති කරන්න. ඒ පිළිබඳව වහාම මැදිහත් වන්න. රජයේ සේවකයන්ට බදු සහන



ලබා දෙන ගැසට් පත්‍රය සම්මත කරන ගමන් මේ හරහා සිද්ධ වන ජාවාරම නවත්වා මීට වඩා වැඩි ප්‍රමාණයක්, වැඩි සහන ප්‍රමාණයක් රජයේ සේවකයන්ට ලබා දෙන්න පුළුවන් ආකාරයට මේ කටයුත්ත කඩිනම් කරන්න

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com





චීනයේ න්‍යායික වැඩමුළුවකට සහභාගි වෙමින්...



කලාවට බදු පැනවීමට එරෙහිව...



උක් ගොවියන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන්...



බදුල්ල දිරිය සමිති සමුළුවට පාගමනින්...



කඳුරට ජනතාවගේ උණුසුම් ප්‍රතිචාර මැද...




වෙනිසියුලාවට අත නොතබන ලෙස බලකරමින්...

# විගණන පනත ප්‍රමාද කරන්නේ කැබිනට් මණ්ඩලයේ හොරු රැළයි

## ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා



ජනතා මුදල් අවභාවිතය, වංචාව, දූෂණය හා නාස්තිය රටේ ආර්ථික දේහයේ ප්‍රධාන පිළිලයන් බවට පත්වී ඇතැයි ප්‍රකාශ කළ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා, මෙම තත්වය අවම කිරීම සඳහා යම් අවම සීමාවක හෝ නීතිමය ප්‍රතිපාදනයක් අවශ්‍ය නමුත් වත්මන් කැබිනට් මණ්ඩලයේ සිටින හොරු රැළ යෝජිත විගණන පනත සම්මත කිරීමට දිගින් දිගටම බාධා කරමින් සිටින බවට චෝදනා කළේය.

ඔහු මෙම අදහස් පළ කළේ පසුගිය 25වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මධ්‍ය හමුවේදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද කියා සිටියේය.

"මේ ආණ්ඩුව විගණන පනත පිළිබඳව නිද්‍රාශීලීයි. පහුගිය පාලනයට මෙන්ම වර්තමාන පාලනයත් මහජන මුදල් අවභාවිතය, නාස්ති කිරීම, වංචා කිරීම හා දූෂණයේ යෙදීම පිළිබඳ බරපතළ චෝදනාවක් එල්ල වී තිබෙනවා. විගණන පනත සම්මත වූ පමණින්ම මෙම දූෂණයන්, වංචාවන් නතර වේ යැයි හිතන්න පුළුවන්කමක් නැහැ. නමුත් අවම වශයෙන් හෝ වංචාවට, දූෂණයට, නාස්තියට, මුදල් අවභාවිතයට එරෙහිව යම් නීතිමය ආවරණයක් අවශ්‍යයි.

වර්තමාන ආණ්ඩුව යටතේ සිදුකිරීමට නියමිත පොතුහැර සිට ගලගෙදර දක්වා අධිවේගී මාර්ගය කිලෝමීටර් 32.5යි. ඒ සඳහා රුපියල් බිලියන 135ක් වැය කිරීමට නියමිතයි. (රු. කෝටි 13,500) කිලෝ මීටරයක් සඳහා රු. කෝටි 415ක් වැයවෙනවා. මෙම ව්‍යාපෘතිය කැබිනට් එකෙන් ප්‍රදානය කළේ මීට පෙර ප්‍රතික්ෂේප කළ සමාගමකටයි. අපේ රටේ ජනතාව කිලෝ මීටරයක් වෙනුවෙන් රු. කෝටි 415ක් වැය කළ යුතුද? ඒ වගේම පහුගිය ආණ්ඩුව කාලයේ ප්‍රංශ ගුවන් සමාගමක් සමඟ A350 වර්ගයේ ගුවන් යානා 4ක් මිලදී ගැනීම වෙනුවෙන් ගිවිසුමක් අත්සන් කර තිබුණා. එම ගිවිසුම අතිශය අහිතකර එකක් වගේම විශාල මුදල් ගනුදෙනුවක් සිදුවන ගිවිසුමක්. වර්තමාන ආණ්ඩුව එම ගිවිසුම අහෝසි කළා. ඒ වෙනුවෙන් එම සමාගමට ඩොලර් මිලියන 108ක මුදලක් ගෙව්වා. (රු කෝටි 1650කට ආසන්න මුදලක්) එම මුදල ගෙව්වා පමණක් නොව මේ ආණ්ඩුව A330 වර්ගයේ ගුවන් යානයක් මිලදී ගැනීමටත් දැනට තිබෙන ගුවන් යානයක කල් 02 පිටුවට

# ජ.වි.පෙ. මරණය ඉදිරියේ පවා ජනතා අයිතිවාසිකම් පාවා නොදුන් පක්ෂයක්

## ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා



ජනතා විමුක්ති පෙරමුණ මරණය ඉදිරියේදී පවා ජනතාවගේ අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදය පාවාදුන් පක්ෂයක් නොවන බව අවධාරණය කළ ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා එය අතීතයේද වර්තමානයේද අනාගතයේද එලෙසම වන බවත් දේශපාලන ළදරුවන්ට නොවැටහෙන නමුදු ජනතා විමුක්ති පෙරමුණ දේශපාලනය කරනුයේ ජනතාවගේ ජයග්‍රහණය වෙනුවෙන් බව කියා සිටියේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 24වැනි දින බදුල්ල විල්ස් පාර්ක් පිටියේ පැවති බදුල්ල දිස්ත්‍රික් දිරිය පුරවැසි සමිති දිසා සමුළුව අමතමිනි. වැඩිදුරටත් සභාව ඇමතූ ඔහු මෙසේද පැවසීය.

"රනිල්ලට ඕන දේශපාලනය අපි කරන්නේ නැහැ. මහින්දට ඕන දේශපාලනය අපි කරන්නෙත් නැහැ. අපේ අරමුණ මහින්ද සතුටු කරන එක නෙවෙයි. අපේ අරමුණ ජනතාව ජයග්‍රහණය කරවන එකයි. මේ ආණ්ඩුවේ දුර්වලකම් පාවිච්චි කරලා ජනතාවට ජයග්‍රහණය ලබාගන්න පුළුවන් විදියට දේශපාලනය හසුරුවන එකයි ජනතා විමුක්ති පෙරමුණ කරමින් ඉන්නේ. පළාත් පාලන මැතිවරණය කලින් පැවැත්වීමට ඉඩ හදාගන්නත් පළාත් සභා මැතිවරණය මනාප ක්‍රමයෙන් තොර කොට්ඨාශයට මන්ත්‍රීවරයෙක් පත්වන වඩා සාධාරණ ක්‍රමයට සකස් කරගන්න පළාත් සභා පනතට සංශෝධනයක් ගෙනාවා. ඒකට අපි ඡන්දය දුන්නා. ඒ සංශෝධනයෙන් වාසි දෙකක් ලැබෙනවා. පළාත් පාලන මැතිවරණය කලින් පවත්වන එකයි පළාත් සභා මැතිවරණය මනාප ක්‍රමයෙන් තොරව කොට්ඨාශයට මන්ත්‍රීවරයෙක් ලැබෙන එකයි ජනතාවට හොඳ නැද්ද? ප්‍රජාතන්ත්‍රවාදය ගැන කයිවාරු ගහන මහත්වරුන්ගෙන් අපි අහනවා පළාත් 03ක ඡන්දයක් වෙනුවෙන් රටේම ඡන්දය කල් දාන එක හොඳයිද කියලා. අපි විශ්වාස කරනවා පළාත් 03ක ඡන්දයට වඩා රටේම ඡන්දය වටිනවා කියලා.

දැන් ජනතාවට ගමේ ආණ්ඩුව හදන ඡන්දය ජනවාරි මාසේ ලැබෙනවා. දැන් මොකද අපි කරන්න ඕනෑ. අපි බලාපොරොත්තු වෙනවානම් රට වෙනස් කරන්න, 2020 අලුත් ආණ්ඩුවක් හදන්න ආරම්භක පියවර, හැරවුම් ලක්ෂය තියන්න පුළුවන්කම තියෙනවා ලබන ජනවාරි මාසේ පළාත් පාලන ඡන්දෙන්. ඒ වෙනුවෙන් තමයි දිරිය පුරවැසි සමිති සූදානම් වෙන්න ඕනෑ. දිරිය සමිති ගමේ නායකත්වය ගන්න ඕනෑ. දිරිය සමිති නායකයින් ගමට ගිහිල්ලා ගමට ආදරය කරන රටට ආදරය කරන එක්සත් ජාතික පක්ෂයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගමේ සාමජිකයා එකතු කරගන්න ඕනෑ. ඒ අය අපේ පංතියේ මිනිස්සු. දුක්විඳින මිනිස්සු. වාද කරලා රණ්ඩු කරලා වැඩක් නැහැ. කරුණු කියලා දීලා අපි ඔවුන් එකතු කරගන්න ඕනෑ. නැත්නම් රට හදන්න බැහැ. එහෙම නැතුව අපේ රටට තවදුරටත් ඉදිරියට යන්න බැහැ."

# පනතට සහාය දුන්නේ පළාත් සභා මැතිවරණයේ විකෘතිය නිවැරදි කරන්නයි

## ජ.වි.පෙ. ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා

ජනතා විමුක්ති පෙරමුණ ලෙස රටේ සියලු පළාත් සභා මැතිවරණ එක් දිනයක පැවැත්විය යුතු බවට ස්ථාවරයක සිටින බව පැවසූ ජ.වි.පෙ. ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා, පළාත් සභා මැතිවරණය වරින් වර පැවැත්වීමේ තක්කඩි දේශපාලනය පරදවා මෙතෙක් සිදුවූ විකෘතිය නිවැරදි කළ යුතුව තිබූ බව පෙන්වා දුන්නේය.


ඔහු මෙසේ පැවසුවේ පසුගිය 21වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය. එහිදී මේ සම්බන්ධව වැඩිදුරටත් කරුණු දැක්වූ බිමල් සහෝදරයා මෙසේද පැවසීය.

"ඒකාධිපති වියරුව පසුගිය රාජපක්ෂ පාලන කාලයේ වසර 8ක් තුළ අපි අත්වින්දා. ඒ වගේම පළාත් පාලන මැතිවරණය එක ඡන්ද ක්‍රමයකටත් පළාත් සභා මැතිවරණය තවත් ක්‍රමයකටත් පැවැත්විය යුතු නැහැ. ඒ වගේම පළාත් සභා මැතිවරණය මෙගා ටෙලි නාට්‍යයක් ආකාරයට කෑලි කෑලි පැවැත්විය යුතු නැහැ. 2007 අගොස්තු 23 නැගෙනහිර, උතුරු මැද, සබරගමුව ඡන්දය පැවැත්වුවා. 2009 පෙබරවාරි 14වැනිදා වයඹ සහ මධ්‍යම ඡන්දය පැවැත්වුවා. 2009 අප්‍රේල් 25වැනිදා බස්නාහිර ඡන්දය



පැවැත්වූවා. යුද්ධය අවසන් වුණේ 2009 මැයි මස 19වැනිදායි. තීරණාත්මක යුද්ධයක් පැවති ඒ මොහොතේ ජාතික ආරක්ෂාව ගැන පවා නොසිතා රාජපක්ෂ තමන්ගේ බල වුවමනාව වෙනුවෙන් කඩින් කඩ ඡන්ද පැවැත්වූවා.

තොප්පිගල මෙහෙයුම අවසන් වෙලා ඡන්දයක්. වෙඩිතලතිව් මෙහෙයුමෙන් පස්සේ ඡන්දයක්. කිලිනොච්චි මෙහෙයුමෙන් පස්සේ තව ඡන්දයක්. මේ විදිහට රටේ ජාතික ආරක්ෂාව පවා බිල්ලට දෙමින් එක මෙහෙයුමකින් පස්සේ එක ඡන්දයක් පැවැත්වූවා. මල්ටි බැරල් එකක් වැදුණා වගේ පළාත් සභා සීසීකඩ වුණා. 2008 මැයි මාසයේ ආරම්භ වුණු පළාත් සභා මැතිවරණය මාස 15ක් ඇතුළත පළාත් සභා ඡන්ද 06ක් ලෙස පැවැත්වුණා. මෙම ඡන්ද පැවැත්වීම ගැන තර්ක කරන්න පුළුවන් නියමිත කාලය අවසන් වීමෙන් පසුව පැවැත්වූවා නම්. නමුත් ඇතැම් පළාත් සභා අවුරුදු 03 මාස 2න් විසිරෙව්වා. බොහෝ පළාත් සභා මැතිවරණ පැවැත්වූවේ වසර 04ක් අවසන් වූ පසුවයි. රාජපක්ෂ තමන්ගේ ජනාධිපතිවරණ ව්‍යාපෘතිය සඳහා පළාත් සභා කඩින් කඩ පැවැත්වූවා. විශාල ලෙස රාජ්‍ය මුදල් භාවිත කොට බඩු 02 පිටුවට


කොළඹ විහාරමහා දේවි එළිමහන් රංගපීඨයේදී

ජනතා විමුක්ති පෙරමුණ


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.